SPMC

# වාර්ෂික වාර්තාව

# 2022

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

SPMC

# පටුන


| | |
|---|---|
| රා.ඖ.නි.සං පිහිටුවීම සහ මූලික අරමුණු | 01 |
| අපගේ දර්ශනය හා මෙහෙවර | 02 |
| අපගේ ගමන් මග | 02 |
| මූල්‍ය සහ මෙහෙයුම් සුවිශේෂතා | 04 |
| සභාපතිවරයාගේ සමාලෝචනය | 06 |
| සාමාන්‍යාධිකාරිතුමියගේ පණිවිඩය | 09 |
| අධ්‍යක්ෂවරු | 11 |
| ආයතනික ව්‍යූහය | 16 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 18 |
| විගණන කමිටු වාර්තාව | 20 |
| ආයතනික පාලන වාර්තාව | 22 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වාර්තාව | 24 |
| අවදානම් කළමනාකරණ වාර්තාව | 25 |
| තිරසාර සංවර්ධන ඉලක්ක | 26 |
| ආයතනික සමාජ වගකීම් | 28 |
| අපගේ නිපැයුම් | 29 |
| බද්ධ ව්‍යාපාර නිපැයුම් | 30 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 33 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 34 |
| ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 35 |
| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය | 36 |
| ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති | 38 |
| ගිණුම් පිළිබඳ සටහන් | 47 |
| විගණකාධිපති වාර්තාව | 62 |
| විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස | 74 |
| ප්‍රස්ථාරාත්මක සමාලෝචනය | 83 |
| පසුගිය වසර 10 ක වැදගත් මූල්‍ය විස්තර | 85 |
| ආයතනික තොරතුරු | 86 |

# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව පිහිටුවීම සහ මූලික අරමුණු

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 1957 අංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1987 වර්ෂයේදී පිහිටුවන ලදී.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 2022 වර්ෂයේදී ශ්‍රී ලාංකික ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය ඖෂධ වාණිජමය වශයෙන් නිෂ්පාදනය කිරීමෙහි 35 වසරක් සම්පූර්ණ කර ඇත. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා නිෂ්පාදන මාලාව පෙති සහ කරල් නිෂ්පාදන 96 කින් සමන්විත වේ. සමාලෝචිත වර්ෂය තුළ මෙයින් නිෂ්පාදන 56 ක් ක්‍රියාකාරී ලෙසම සංයෝජනය කර ඇත. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදනයෙහි නියැලී සිටින එකම රාජ්‍ය සංස්ථාවයි.

## ප්‍රධාන ක්‍රියාකාරීත්වයන්

1. තමා විසින්ම හෝ බද්ධ ව්‍යාපාරයකට, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයකට හෝ වෙනත් සමාන ගිවිසුමකට ඇතුළත් වී ඖෂධ නිෂ්පාදනය කිරීම, සැකසීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, හෝ නැවත ඇසුරුම් කිරීම.
2. පාලිත සමාගම් නිර්මාණය කිරීම.
3. අනාගත ආයෝජකයින් සමඟ ජාත්‍යන්තර ගිවිසුම්වලට එළඹීම.
4. ඖෂධ නිෂ්පාදනය කිරීම සහ සැකසීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
5. ඖෂධ විද්‍යාව පිළිබඳ සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඖෂධ ප්‍රමිතිකරණය කිරීම.
6. සංස්ථාව විසින්ම හෝ බද්ධ ව්‍යාපාර මගින් හෝ වෙනත් එවැනි ගිවිසුම් මගින් කරන ඖෂධීය නිෂ්පාදන අලෙවි කිරීම.

වෙළඳපලට මුදා හරිනු ලබන සියලුම නිෂ්පාදන බ්‍රිතාන්‍ය ෆාමකෝපියා (BP) සහ එක්සත් ජනපද ෆාමකෝපියා (USP) නියමයන්ට අමතරව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ (SPMC) අභ්‍යන්තර පිරිවිතරයන්ට ද අනුකූල වේ.

වත්මන් යහපත් නිෂ්පාදන පිළිවෙත් (cGMP) නියමයන් සහ කාර්යය පටිපාටි ක්‍රියාවේ යොදවන ආකාරය පිළිබඳව අභ්‍යන්තර ගුණාත්මකතා විගණනය සහ කම්හල් පිරික්සුම හරහා නිරීක්ෂණය සිදු කරනු ලැබේ.



# දර්ශනය

ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති ඖෂධ නිමැවුම් නිෂ්පාදනය හා අලෙවිකරණය කරන දකුණු ආසියාවේ ඇති ආදර්ශමත් ආයතනයක් බවට පත්වීම.

# අපගේ ගමන් මග

**1987**
මිලියන 500 ක නිමැවුම් ධාරිතාවකින් යුත් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ආරම්භ කිරීම
මිලියන 8

**1992**
ආරම්භක නිමැවුම් ධාරිතාව ඉක්මවීම
මිලියන 600

**2007**
නව වැඩ මුර මාරුවක් හඳුන්වා දීම
මිලියන 1025

**2009**
නිමැවුමේ ප්‍රමාණය දෙගුණයකින් වැඩිවීම
මිලියන 1194

# මෙහෙවර

**දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල සඳහා වඩා ආරක්ෂිත, ප්‍රත්‍යක්ෂ හා පහසු මිලකට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඖෂධ නිෂ්පාදනය කිරීම.**

පසුගිය වසර 35 තුළ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විශිෂ්ටත්වය උදෙසා කැපවී කටයුතු කරමින් සන්ධිස්ථාන ගණනාවක් පසු කර ඇත.

**2013**
නිමැවුමේ ප්‍රමාණය මිලියන 2000 ඉක්මවීම
මිලියන 2003

**2020**
නිමැවුමේ ප්‍රමාණය මිලියන 2000 ඉක්මවීම
මිලියන 3015

**2021**
විශේෂිත ලෙවොතිරොක්සින් පෙති නිපැයුම් කලාපය ආරම්භ කිරීම

**2022**
නව නිෂ්පාදන 09 ක් වෙළඳපළ වෙත නිකුත් කිරීම

# මූල්‍ය සහ මෙහෙයුම් සුවිශේෂතා

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | |
| ආදායම | 16,620,184,659 | 8,538,944,512 |
| දළ ලාභය | 2,061,140,119 | 1,436,621,516 |
| මෙහෙයුම් ලාභය | 1,253,361,675 | 1,087,055,386 |
| මූල්‍ය ආදායම | 351,759,383 | 156,792,127 |
| බදු වියදම | 620,740,598 | 229,141,993 |
| වර්ෂය සඳහා ලාභය (බදු පෙර) | 1,586,213,049 | 1,235,327,457 |
| මුළු විස්තීරණ ආදායම් | 1,500,493,418 | 1,014,281,767 |
| | | |
| **මූල්‍ය තත්ත්වය** | | |
| තොගය | 3,018,074,553 | 1,624,026,442 |
| බැංකු සහ අතැති මුදල | 1,436,015 | 1,767,448 |
| ජංගම වත්කම් | 9,910,297,183 | 5,616,580,803 |
| මුළු වත්කම් | 14,013,711,229 | 8,680,301,991 |
| ස්කන්ධය | 6,680,644,760 | 5,280,077,196 |
| ජංගම නොවන බැරකම් | 3,232,668,011 | 2,745,439,516 |
| ජංගම බැරකම් | 4,100,398,459 | 654,785,279 |



**ආදායම**
**මිලියන**
**16620**



**ශුද්ධ ලාභය (බදු පෙර)**
**මිලියන**
**1586**



**නිෂ්පාදන ඒකක**
**මිලියන**
**3302**













ආදායම
රු.මි
20,000
16,000
12,000
8,000
4,000
-
2018
2019
2020
2021
2022
වර්ෂය


බදු පෙර ලාභය
රු.මි.
2,000
1,600
1,200
800
400
-
2018
2019
2020
2021
2022
වර්ෂය


ආදායම වර්ගීකරණය
වෛ.සැ.අ.
රා.ඖ.සං.
බෙදාහරින්නන්
15%
1%
84%


පොළී ආදායම
රු.මි.
400
300
200
100
-
2018
2019
2020
2021
2022
වර්ෂය


නිෂ්පාදනය
මි.
4,000
3,000
2,000
1,000
-
2018
2019
2020
2021
2022
වර්ෂය


කාර්ය මණ්ඩලය
400
300
200
100
-
2018
2019
2020
2021
2022
වර්ෂය

# සභාපතිවරයාගේ සමාලෝචනය



වාර්ෂික වාර්තාව සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ආදායම් ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ 2022 දෙසැම්බර් මස 31න් අවසන් වසර සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව ඇතුළත් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මා හට ඉදිරිපත් කරන්නට ලැබීම මහත් සතුටකි.

මහජනතාවට දැරිය හැකි මිල ගණන්වලට ගුණාත්මක, ඵලදායී සහ ආරක්ෂිත ඖෂධ නිෂ්පාදනය කිරීමේ අරමුණ පෙරදැරිව 1957 අංක 49 දරන කර්මාන්ත සංස්ථා පනත යටතේ 1987 වසරේදී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) ස්ථාපනය කරන ලදී. SPMC ශ්‍රී ලංකාවේ විශාලතම සහ ප්‍රමුඛතම රාජ්‍ය ඖෂධ නිෂ්පාදකවරයා වන අතර වර්තමානය වන විට SPMC පුළුල් පරාසයක ඖෂධ වර්ග ආවරණය වන පරිදි වර්ගීය නාමයන් යටතේ ඖෂධ වර්ග 96ක් නිෂ්පාදනය කරයි. SPMC මගින් නිපදවනු ලබන සියළු නිෂ්පාදනවල British Pharmacopeia (BP), United State Pharmacopeia (USP) සහ SPMC ප්‍රමිතීන් මගින් අවශ්‍ය කරන්නා වූ ගුණාත්මකභාවය අන්තර්ගත වේ. වර්තමාන භාණ්ඩ නිෂ්පාදන පරිචයන් (cGMP), රෙගුලාසි හා ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම අභ්‍යන්තර තත්ත්ව විගණනය හා කර්මාන්තශාලා අධීක්ෂණය යටතේ නිරන්තරයෙන් අධීක්ෂණය කෙරේ.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි ඖෂධ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා නවතම ජපන්, ජර්මන් සහ කොරියානු යන්ත්‍රෝපකරණ භාවිතා කෙරේ. නිෂ්පාදන ක්‍රියාවලිය අධි පිරිසිඳු තත්ත්වයන් යටතේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) සහ වත්මන් යහපත් නිෂ්පාදන පිළිවෙත්හී (cGMP) අවශ්‍යතාවලට අනුකූල වන පරිදි සිදු කෙරේ. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිටින වෛද්‍යවරුන්, ඖෂධවේදීන් හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අනෙකුත් වෘත්තිකයන් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා නිෂ්පාදන අගය කරනු හා වඩා ප්‍රිය කරනු ලබයි. ගුණාත්මකභාවයෙන් යුක්ත ඖෂධ නිෂ්පාදකවරයෙක් වශයෙන් අප ලබා ඇති කීර්තිනාමය අපගේ සාර්ථකත්වයේ පදනමයි.

## කාර්යසාධනය

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 2022 වසරේදී රුපියල් මිලියන 1,586 බදු පෙර ශුද්ධ ලාභයක් වාර්තා කරන ලදී.

## නිපැයුම් ප්‍රතිඵලය

2022 වසරේදී නිෂ්පාදනය කරන ලද පෙති/කරල් මිලියන 3,302 SPMC හි විශාලතම නිපැයුම් ප්‍රතිඵලය ලෙස වාර්තා විය.

## පිරිවැටුම

2022 වසර සඳහා මුළු පිරිවැටුම රුපියල් මිලියන 16,620ක් විය. එය ආරම්භයේ සිට වාර්තා වූ විශාලතම පිරිවැටුමයි. සමස්ත අලෙවිකිරීම් වලින් 84% ක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් ඒකකය සඳහා විය. මෙම ප්‍රධාන මාධ්‍යයට අමතරව, අප සමඟ ලියාපදිංචිව ඇති පුද්ගලික බෙදාහරින්නන් හරහා කරන ලද අලෙවිකිරීම් 15% ක් වූ අතර ඉතිරි 1% රාජ්‍ය ඖෂධ සංස්ථාව වෙත විය.

SPMC හට මහා භාණ්ඩාගාරයේ කිසිදු සහායකින් තොරව තම සම්පත් මනාව කළමනාකරණය කිරීම හරහා ලාභ ඉපැයීමට හැකිවීම පිළිබඳව මා ප්‍රකාශ කරන්නේ සතුටිනි. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 2022 වර්ෂය තුල රාජ්‍ය සංස්ථාවක් වශයෙන් සිය වගකීම ඉටු කරමින් රුපියල් මිලියන 100 ක දායකත්ව මුදලක් මහා භාණ්ඩාගාරයට ලබා දී ඇත.

## සංවර්ධන කාර්යයන්
## කර්මාන්තශාලා සංවර්ධනය

SPMC මඟින් 2022 වසරේදී පෙති සහ කරල් මිලියන 3,302 ක් නිෂ්පාදනය කරන ලදී.

## පර්යේෂණ සහ සූත්‍රකරණ සංවර්ධනය

SPMC ගතවූ වසර තුල පහත නිෂ්පාදන වාණිජමය වශයෙන් නිෂ්පාදනය කර ඉදිරිපත් කර ඇත.

- ඇස්පිරින් (ආමාශ ප්‍රතිරෝධක) BP මිලි ග්‍රෑම් 75 පෙති
- මෙෆෙනමික් අම්ලය BP මිලි ග්‍රෑම් 500 පෙති
- බිසොප්රොලොල් BP මිලි ග්‍රෑම් 5 පෙති
- ප්‍රෙඩ්නිසොලොන් BP මිලි ග්‍රෑම් 1 පෙති
- ෆ්ලුක්ලොක්සැසිලින් BP මිලි ග්‍රෑම් 250 කරල්
- රොසුවාස්ටැටින් IP මිලි ග්‍රෑම් 10 පෙති
- ලොසාර්ටන් පොටෑසියම් BP මිලි ග්‍රෑම් 25 පෙති
- සිටාග්ලිප්ටින් BP මිලි ග්‍රෑම් 50 පෙති
- ලොරටඩින් USP මිලි ග්‍රෑම් 10 පෙති

## මානව සම්පත් සංවර්ධනය සහ සුභසාධනය

2022.12.31 වන විට SPMC හි සේවක සංඛ්‍යාව 336ක් විය. එයින් 10 දෙනෙකු SPMC අභ්‍යාසලාභීන් වූ අතර 3 දෙනෙකු වැඩ මුර දෙකක් කාර්යක්ෂමව හා බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා SPMC ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ මග පෙන්වීම යටතේ පුහුණුව ලබන කොන්ත්‍රාත් පදනම මත සේවය කරන්නන් විය.

සේවකයන් විසින් ඉල්ලීම් කරන මූලික සුභසාධන පහසුකම් SPMC මගින් අඛණ්ඩව සපයනු ලබයි.

## ක්‍රමෝපායන් සහ අපේක්ෂාවන්

අපගේ මූලික අරමුණ වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය (MSD), රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ (SPC) ඔසුසැල් සහ වෛද්‍ය වෘත්තිකයන්ට අවශ්‍ය කරන්නා වූ නිෂ්පාදන අඛණ්ඩව සැපයීමයි.

හොරණ මිල්ලෑව නගරයේ නව කර්මාන්තශාලා පිහිටුවීම මගින් නිෂ්පාදන ධාරිතාවය පුළුල් කර ගැනීමට SPMC අපේක්ෂා කරයි. ඒ අනුව,

- විකලාංග උපකරණ නිෂ්පාදනය සඳහා
- පිළිකා නාශක ඖෂධ නිෂ්පාදනය සඳහා
- මුඛයෙන් ලබාදෙන ඝණ ඖෂධ මාත්‍රා (OSD) නිෂ්පාදනය සඳහා

කර්මාන්ත ශාලා පිහිටුවීමට අපේක්ෂා කරයි

නිෂ්පාදනය ඉහළ නැංවීමට, අලෙවි ආදායම් වැඩි කර ගැනීමට, නිෂ්පාදන පරාසය පුළුල් කර ගැනීමට සහ නව රැකියා අවස්ථා නිර්මාණය කිරීමට, තාක්ෂණික දැනුම ඉහළ නංවාගැනීමට සහ SPMC හි ආයතනික නාමයක් නිර්මාණය කිරීමට අපට මෙම නිෂ්පාද ධාරිතා පුළුල් කිරීම් උපකාරී වනු ඇත.

## තුති පිදුම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතාට සහ රනිල් වික්‍රමසිංහ මහතාට ශ්‍රී ලංකාවේ ඖෂධ කර්මාන්තයේ ප්‍රගතිය වෙත එතුමන් විසින් දක්වන ලද අඛණ්ඩ කැපවීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම මගේ ස්තූතිය පිරිනමන්නෙමි. සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා සහ ඖෂධ නිෂ්පාදනය, සැපයීම සහ නියාමනය පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු මහාචාර්ය චන්න ජයසුමන මහතා විසින් ලබා දෙන මග පෙන්වීම සහ සහාය වෙනුවෙන් මම මගේ ස්තූතිය ඔවුන් වෙත ද පළ කරන්නෙමි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජනක චන්ද්‍රගුප්ත මහතා සහ ඖෂධ නිෂ්පාදනය, සැපයීම සහ නියාමනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය ආර්.එම්.එස්.කේ. රත්නායක සහ අනෙකුත් නිලධාරීන් විසින් ලබා දුන් මගපෙන්වීම ද අප අගය කරන්නෙමු. මහා භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තුවල නිලධාරීන් විසින් දක්වන ලද දායකත්වයද මෙහිලා අප විසින් අගය කළ යුතුය.

අපගේ ආයතනයේ සාර්ථකත්වය සඳහා විශාල දායකත්වයක් සැපයූ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC), වෛද්‍ය සැපයුම් අංශය (MSD), පුද්ගලික ඔසුසල් සහ වෛද්‍ය වෘත්තිකයන් කෘතඥපූර්වකව සිහිපත් කරන්නේ මහත් සතුටකිනි.

2022 වසර තුලදී ධනාත්මක ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා කළමනාකාර අධ්‍යක්ෂ, සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, කළමනාකරුවන්, විධායක කාර්ය මණ්ඩලය සහ SPMC හි සියළුම මට්ටම්වල සේවකයන්ගේ කැපවීම අති මහත් ලෙස අගය කල යුතු වේ. අවසන් වශයෙන්, සංස්ථාව සාර්ථකත්වය වෙත මෙහය වීමට වටිනා දායකත්වයක් සහ මඟපෙන්වීමක් ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ අවංක ස්තූතිය පිරිනැමිය යුතුය.

**වෛද්‍ය පී.පී.ජී.පී.යූ. ඉන්ද්‍රවංස**
**සභාපති**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**
**2023 පෙබරවාරි 28**

# සාමාන්‍යාධිකාරිතුමියගේ පණිවිඩය



රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, වසර 35 කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ. මෙම කාල පරිච්ඡේදය තුළ, අප සංස්ථාව සිය ඖෂධ අලෙවිකරණ සහ නිෂ්පාදන පදනම සාර්ථකව සංවර්ධනය කර ශක්තිමත් කර ඇති අතර, වේගයෙන්ම වර්ධනය කරා ලඟා වන රාජ්‍ය ඖෂධ සමාගම බවට පත්වීමේ ගෞරවය දිනා ගැනීමට එම වැඩපිළිවෙළ ඔස්සේ අපට හැකි විය.

සංස්ථා ඉතිහාසයේ ඉහළම විකුණුම් ප්‍රමාණය (රු. බිලියන 16) සහ ලාභ ප්‍රමාණය (රු. බිලියන 1.5) අත් කර ගනිමින්, ස්වකීය විකුණුම්වල සහ ශුද්ධ ලාභය (බදු ගෙවීමට පෙර) තුළ ශක්තිමත් වර්ධනයක් සමඟ 2022 වර්ෂයේ දී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සාක්ෂාත් කරගත් කාර්ය සාධනය විශිෂ්ට ජයග්‍රහණයක් වූ බව පැවසීමට මම ආඩම්බර වෙමි. තවද, නව නිෂ්පාදන 9 ක් හඳුන්වා දීම මගින්, 2022 වසරේ දී සංස්ථාව ස්වකීය පර්යේෂණ හා සංවර්ධන කටයුතු විෂයයෙහි ද සාර්ථක ප්‍රගතියක් ලබා ඇත.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, තවදුරටත් වර්ධනය වෙමින් ඉදිරියට යන බව අපගේ තිර විශ්වාසයයි. වර්ෂ 2022 - 2026 යන කාල පරිච්ඡේදය තුළ, හොරණ - මිල්ලෑව ප්‍රදේශය ආශ්‍රිතව, "ලෝටස් ෆාමා" නමැති ව්‍යාපෘතිය යටතේ, නව නිෂ්පාදන කම්හලක් එනම්, මුඛයෙන් ලබාදෙන ඝන ඖෂධ මාත්‍රා නිපැයුම් සඳහා පිහිටුවීම අපගේ ප්‍රමුඛ අවධානයට ලක්ව ඇති කාර්යක් වේ.

ව්‍යවසායකත්වයේ හරයාත්මක වටිනාකම් සමඟ අනුබද්ධ වෙමින්, ශක්තිමත් වැඩ ආචාර ධර්ම සහ පුළුල් පරාසයක නිෂ්පාදන මාලාවක් සහිතව වර්තමානයට උචිත යහපත් නිෂ්පාදන පිළිවෙත් (cGMP ) සමඟ දැඩි අනුකූලතාවයකින් යුතුව කටයුතු කරමින්, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතම ඖෂධ නිෂ්පාදකයින් අතරට ප්‍රවිෂ්ට වී තිබේ.

අවසාන වශයෙන්, 2022 වසර තුළ දී මා වෙත ලබා දුන් සහාය සහ සේවා කැපවීම වෙනුවෙන් සභාපතිතුමන්, අධ්‍යක්ෂ මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් හා මහා භාණ්ඩාගාර නිලධාරීන්ට ද, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට අයත් සියලුම සේවක සේවිකාවන්ට ද මම මගේ තුති ප්‍රණාමය පළ කිරීමට කැමැත්තෙමි.

**එස්.ඩබ්. ජයසුන්දර**
**සාමාන්‍යාධිකාරිණී**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**

# අධ්‍යක්ෂක මණ්ඩලය

වෛද්‍ය උත්පල ඉන්ද්‍රවංස මහතා
සභාපති

වෛද්‍ය බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන මහතා
අධ්‍යක්ෂ

වී.ජී. චමින්ද වික්‍රමරත්න මහතා
අධ්‍යක්ෂ

යූ.එස්.කේ. දෙනාවත්ත මහත්මිය
අධ්‍යක්ෂ

ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය
අධ්‍යක්ෂ



# අධ්‍යක්ෂවරු



## වෛද්‍ය උත්පල ඉන්ද්‍රවංස
## සභාපති

වෛද්‍ය උත්පල ඉන්ද්‍රවංස මහතා රුසියාවේ ප්‍රමුඛපෙළේ වෛද්‍ය විද්‍යාලයක් වන සෙනෝව්-වන් වෛද්‍ය විද්‍යාලයෙහි (Medical Academy of Sechenov - one) අධ්‍යාපනය හදාරා ඇති අතර ඔහුගේ සීමාවාසික පුහුණුව අවසන් කරන ලද්දේ පොළොන්නරුව මහ රෝහලේය.

පුලස්තිපුර ග්‍රාමීය රෝහලේ ආයතන භාර වෛද්‍ය නිලධාරී ලෙස කටයුතු කරමින් සිටින කාලයේදී 2007 වසරේ 5S ඵලදායීතා පළාත් සම්මානය ලබා ගැනීමට ඔහු පුරෝගාමී වී ඇත. එම කාලසීමාවේදීම වෛද්‍ය කාණ්ඩයෙන් සහ රෝහල් කාණ්ඩයෙන් විශිෂ්ඨ සෞඛ්‍ය සම්මානය ද ඔහු විසින් දිනාගෙන ඇත. එතුමන් 2009 වසරේ පටන් ජාතික රෝහලේ, විකලාංග ඒකකයේ හදිසි අනතුරු සේවා අංශයේ සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් 2019 වසරේ පටන් සේවය කරයි.



## වෛද්‍ය බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන
## අධ්‍යක්ෂ

වෛද්‍ය බන්දුල විජේසිරිවර්ධන මහාත රාජ්‍ය සෞඛ්‍යාරක්ෂණ ක්ෂේත්‍රයේ වසර 33කට වැඩි පළපුරුද්දක් සහිත අයෙක් වන අතර ඔහු වෛද්‍ය විද්‍යාව සඳහා ප්‍රධාන පරීක්ෂක, MCQ ප්‍රධාන සමූහයේ සභාපති, AAAED කමිටුවේ සාමාජික සහ 2005 වසරේදී ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සභාපති වශයෙන් කටයුතු කර ඇත.

ඔහු වර්තමානයේ පූර්ණකාලීනව පෞද්ගලික සෞඛ්‍යාරක්ෂණ ක්ෂේත්‍රයේ සේවය කරයි. මේ වන විට දිවයින පුරා භාවිතා වන සායනික පුහුණු මාර්ගෝපදේශ, ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ විද්‍යාලය හරහා හඳුන්වාදීමට වෛද්‍ය විජේසිරිවර්ධන මහතා පුරෝගාමී වී ඇත. ඔහුගේ නමට පළ වන ජාතික මෙන්ම ජාත්‍යන්තර පලකිරීම් ගණනාවක් අතරේ, 2000 වසරේදී ඔහුගේ සායනික පර්යේෂණය සඳහා ජනාධිපති සම්මානය වෛද්‍ය විජේසිරිවර්ධන මහතා විසින් දිනා ගන්නා ලදි. එමෙන්ම රෝයල් ඔස්ට්‍රේලියන් කොලේජ් ඔෆ් ෆිසීෂියන්ස් (The Royal Australian College of Physicians) සහ දකුණු අප්‍රිකාවේ කොලේජස් ඔෆ් මෙඩිසින් (Colleges of Medicine in South Africa) මගින් ගෞරව සාමාජිකත්වය පිරිනමන ලදී.

ඔහු MBBS (කොළඹ), MD (කොළඹ) සහ MRCP (UK) දරන අතර ඇමරිකානු වෛද්‍යවරුන්ගේ විද්‍යාලයෙහි (American College of Physicians) සහ ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ විද්‍යාලයෙහි (Ceylon College of Physicians) සාමාජිකයෙකි.



**එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක මහත්මිය**
**අධ්‍යක්ෂ**

එස්. ඒ. චන්ද්‍රිකා කුලතිලක මහත්මිය මේ වන විට කළමනාකාර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරිය වශයෙන් සේවය කරයි.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජ උපාධියක් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත.

චන්ද්‍රිකා කුලතිලක මහත්මිය විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරියක වශයෙන් සේවය කර ඇති අතර තැපැල් දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරිණිය ලෙසද කටයුතු කර ඇත. තවද ඇය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂවරිය ලෙස ද කළමනාකාර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙසද සේවය කර ඇත. ඉන්දීය රාජ්‍යයේ අභ්‍යන්තර විගණන කටයුතු ශක්තිමත් කිරීම සම්බන්ධ වැඩමුළුවේදී ඇය සම්පත් දායිකාවක් විය.



**වී.ජී. චමින්ද වික්‍රමරත්න මහතා**
**අධ්‍යක්ෂ**

වී.ජී. චමින්ද වික්‍රමරත්න මහතා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙක් වශයෙන් 2020 ජනවාරි පටන් කටයුතු කරන අතර ඔහුට SMI ඉන්ජිනියරින් පුද්ගලික සමාගමේ නිර්මාතෘ වශයෙන් ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ විසි වසරකට වැඩි පළපුරුද්දක් ඇත.

ඔහු ජාතික තරුණ සේවා සභාවේ (2005-2008) මහජන කාර්ය සාධන මණ්ඩලයේ ජාතික චිත්‍රපට සංස්ථාවේ (2008-2010) සහ ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගමේ (2012-2015) අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කර ඇත.

වර්තමානය වන විට ඔහු හරිත TV ජාල පුද්ගලික සමාගමේ සහ Ariike පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ තනතුර දරයි. ඊට අමතරව ඔහු ජාතික දුම්රිය කෞතුකාගාර කමිටුවේ සාමාජිකයෙකි.



**යූ.එස්.කේ. දෙනාවත්ත මහත්මිය**
**අධ්‍යක්ෂ**

යූ.එස්.කේ. දෙනාවත්ත මහත්මිය දැනට ඖෂධ නිෂ්පාදන, සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පරිපාලන) ලෙස සේවය කරයි.

එතුමිය කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (පේරාදෙණිය විශ්ව විද්‍යාලය) සහ ව්‍යාපෘති කළමණාකරණය සම්බන්ධයෙන් රාජ්‍ය කළමනාකරණ පශ්චාත් උපාධිය (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) ලබා ඇත.

දෙනාවත්ත මහත්මිය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක් ලෙස (2000-2001) සහ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ (2001-2010) අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කර ඇත. 2010 වර්ෂයේදී ඇය පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ජනදිරිය) ලෙස කටයුතු කළාය. එතුමිය පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ (2011-2017) සහ බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ (2017-2021) ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරියක ලෙසද සේවය කර ඇත.



**ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය**
**අධ්‍යක්ෂ**

ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය 2022 අප්‍රේල් මාසයේ දී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනියක, අධ්‍යක්ෂවරියක සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙස රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල වසර 15 කට වඩා වැඩි සේවා පළපුරුද්දක් ඇය සතුව ඇත.

ඇය කහවගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්, බී.සී.සී. (ලංකා) ලිමිටඩ් සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි නීතිගත සංස්ථාව යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කර ඇත. ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය මීට පෙර රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනියක ලෙසත්, ටයිම් ගාර්මන්ට්ස් (ප්‍රයිවේට්) ලිමිටඩ් ආයතනයෙහි ගණකාධිකාරිවරිය ලෙසත් සේවය කර ඇත.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ද, කොළඹ විශ්ව විද්‍යාලයේ මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇත.

ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය දැනට මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරියක් සහ සහකාර අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කරන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස ද කටයුතු කරන්නී ය.

ඉදිරි පෙළ

ආර්.එම්.ආර්.එම්. රණසිංහ මහතා
ආර්. ධර්මදාස මහතා
එස්.පී. ජයවීර මහතා
එස්.ඩබ්. ජයසුන්දර මහත්මිය
වෛද්‍ය පී.පී.ජී.පී.යූ. ඉන්ද්‍රවංස මහතා
ඒ.ජී.ඩී.එස්. අතුරලිය මහත්මිය
පී.ඩී. ජයසුන්දර මහතා
සී.ඩී. මගිනආරච්චි මහත්මිය
ඒ.එම්.ටී.පී. කුලසේකර මහත්මිය

# SPM

## කළමනාකරණ කණ්ඩායම



## පසු පෙළ

ඒ.සී.පී. ආනන්දකුමාර මහත්මිය
සී.එස්. ඔබේසේකර මහත්මිය
එස්. වික්‍රමසිංහ මහතා
වයි.එම්.පී. කුමාර මහතා
ජේ.එම්.එස්. ජයසුන්දර මහතා
එම්. බෙනරගම මහතා
බී.වී.එච්.පී.එස්. කුමාර මහතා
පී. දන්තනාරායන මෙනවිය



# ආයතනික


සභාපති / කළමණාකාර අධ්‍යක්ෂ
සාමාන්‍යාධිකාරී
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිෂ්පාදන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තත්ත්ව පාලන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වට්ටෝර්, පර්යේෂණ සහ සංවර්ධන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)
කළමනාකාරු (නිෂ්පාදන)
කළමනාකාරු (තත්ත්ව පාලන)
කළමනාකාරු (තත්ව සහතිකකරණය)
කළමනාකාරු (වට්ටෝරු, පර්යේෂණ සහ සංවර්ධන)
කළමනාකාරු (ඉංජිනේරු)
කළමනාකාරු (තොරතුරු තාක්ෂණ)
කළමනාකාරු (මිරාළු)
ඖෂධ තාක්ෂණඥ (නිෂ්පාදන)
තත්ත්ව පාලන නිලධාරී
තත්ත්ව සහතික නිලධාරී
රසායනඥ
ක්‍රියාමක කටයුතු නිලධාරී
ඉංජිනේරු සහකාර (විදුලි / යාන්ත්‍රික)
ප්‍රධාන නිලධාරී
ඉංජිනේරු සහකාර (පරිගණක දෘඩාංග)
පද්ධති විශ්ලේෂක

# ව්‍යුහය


නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් සහ ප්‍රසම්පාදන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්)
කළමනාකාරු (සැලසුම් සහ ප්‍රසම්පාදන)
කළමනාකාරු (අලෙවි)
කළමනාකාරු (මූල්‍ය)
කළමනාකාරු (මානව සම්පත්)
කළමනාකාරු (පුහුණු සහ සංවර්ධන)
නීති නිලධාරී
අභ්‍යන්තර විගණක
ඖෂධ තාක්ෂණඥ (සැලසුම් සහ ප්‍රසම්පාදන)
අලෙවි නිලධාරී
මූල්‍ය නිලධාරී
මානව සම්පත් / පරිපාලන නිලධාරී
පුහුණු සහ සංවර්ධන නිලධාරී
පුද්ගලික ලේකම්
අභ්‍යන්තර විගණන නිලධාරී

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිය විගණිත ගිණුම් වාර්තා ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. ගිණුම් වාර්තා පිටු 33-61 දක්වා ඇත.

## ප්‍රධාන කාර්යයන්

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ,

- ස්වකීයව හෝ බද්ධ ව්‍යාපාරයකට, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයකට හෝ වෙනත් සමාන ගිවිසුමකට ඇතුළත් වී ඖෂධ නිෂ්පාදනය කිරීම, සැකසීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, හෝ නැවත ඇසුරුම් කිරීම.

- පාලිත සමාගම් නිර්මාණය කිරීම.

- අනාගත ආයෝජකයින් සමග ජාත්‍යන්තර ගිවිසුම්වලට එලබීම.

- ඖෂධ නිෂ්පාදනය කිරීම සහ සැකසීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම.

- ඖෂධ විද්‍යාව පිළිබඳ සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඖෂධ ප්‍රමිතිකරණය කිරීම.

- සංස්ථාව විසින්ම හෝ බද්ධ ව්‍යාපාර මගින් හෝ වෙනත් එවැනි ගිවිසුම් මගින් කරන ඖෂධීය නිෂ්පාදන අලෙවි කිරීම.

## ව්‍යාපාර සමාලෝචනය

2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ කාර්යයන් හි තත්වය පිළිබඳ තොරතුරු අඩංගු ශේෂ පත්‍රය 34 පිටුවේ දක්වා ඇත. අදාල මූල්‍ය වර්ෂයේ සංස්ථාවේ තක්සේරුව පිළිබඳව සභාපතිතුමාගේ සමාලෝචනය පිටු 06 සිට 08 දක්වා ඇත.

## පිරිවැටුම සහ ප්‍රතිඵල

2022 වර්ෂයේ පිරිවැටුම සහ ප්‍රතිඵල ඇතුලත් ආදායම් ප්‍රකාශය හා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය පිළිවෙලින් 33 සහ 35 පිටු වල දක්වා ඇත.

## අනාගත සංවර්ධන කාර්යයන්

ව්‍යාපාරයේ අනාගත සංවර්ධනය පිළිබඳව සභාපතිතුමාගේ සමාලෝචනය පිටු අංක 06 සිට 08 දක්වා ඇත.

## පරිත්‍යාග

අදාල වර්ෂය තුල සංස්ථාව විසින් පරිත්‍යාග කිසිවක් ලබා දී නොමැත.

## දේපළ, පිරියත සහ උපකරණ

අදාල වර්ෂය තුළ ව්‍යාපාරයේ දේපළ , පිරියත සහ උපකරණ ඇතුලත් වාර්තා 54 පිටුවේ මූල්‍ය ප්‍රකාශයෙහි 10 වන සටහන මගින් දක්වා ඇත.

## ලාභාංශ / දායකත්වය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලාභාංශ ලෙස රු.100,000,000 ක දායකත්වයක් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට ගෙවා ඇත.

## සංචිත

මුළු සංචිත ප්‍රමාණය හා ඒවායේ සංයෝජනය ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය මගින් 35 පිටුවෙහි දක්වා ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ. එක් අධ්‍යක්ෂවරයෙක් මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක් වන අතර අනෙක් අධ්‍යක්ෂවරයා සෞඛ්‍ය අමාත්‍යංශය නියෝජනය කරයි. නව අධ්‍යක්ෂ මණ්ඩලය 2020 වර්ෂයේ ජනවාරි මස පත් කරන ලදි.

අදාළ කාලපරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 04 ක් පැවැත්වූ අතර අදාල කාලපරිච්ඡේදය සඳහා සංස්ථාවේ කටයුතු සම්බන්ධ වගකීම සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ඇත.

| | | |
|---|---|---|
| වෛද්‍ය පී.පී.ජී.පී.යූ. ඉන්ද්‍රවංස | - | සභාපති |
| වෛද්‍ය බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන | - | අධ්‍යක්ෂ |
| එස්.ජී. චන්ද්‍රිකා කුලතිලක | - | අධ්‍යක්ෂ |
| වී.ජී. චමින්ද වික්‍රමරත්න | - | අධ්‍යක්ෂ |
| යූ.එස්.කේ. දෙනාවත්ත | - | අධ්‍යක්ෂ |
| ඒ.ආර්.වික්‍රමසිංහ | - | අධ්‍යක්ෂ |

## ගිණුම් ප්‍රතිපත්ති

සංස්ථාව උපයෝගී කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 38 සිට 46 දක්වා පිටුවල ඇත.

## පරිසර සංරක්ෂණය

සිය ක්‍රියාකාරීත්වය තුළින් පරිසරයට අහිතකර ප්‍රතිඵලයක් ඇති නොවන පරිදි කටයුතු කිරීම සහ ඉහළම ගුණාත්මක භාවයෙන් යුතු නිෂ්පාදන අපගේ පාරිභෝගිකයන්ට සහ ප්‍රජාවට ලබා දීමෙන් ඔවුන්ට වාසිදායක ප්‍රතිඵලයක් ඇති කිරීම සංස්ථාවේ වගකීම වේ.

## ව්‍යවස්ථානුකූල ගෙවීම්

ශේෂ පත්‍ර දිනට රජයට හා සේවකයන්ට අදාල සියලුම ව්‍යවස්ථානුකූල ගෙවීම් කර තිබේ.

## ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශයන් හි සැකසීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍ය සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනයේ සිට සිදුවී නොමැත.

## අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශයන් මූලිකවම පිළියෙල කරන ලද්දේ අඛණ්ඩ පැවැත්ම යන සංකල්පයට අනුකූලවය. සංස්ථාව සතුව ප්‍රමාණවත් සම්පත් පවත්නා බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය එහි අනාගත මෙහෙයුම් පිළිබඳව සෑහීමකට පත් වේ.

## විගණකවරුන් පත් කිරීම

1971 මූල්‍ය පනත ප්‍රකාරව විගණකාධිපතිවරයා සංස්ථාවේ විගණක වන අතර, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව වාර්ෂික විගණනය විගණකාධිපතිවරයා විසින් කරන ලදී.

**වෛද්‍ය පී.පී.ජී.පී.යූ ඉන්ද්‍රවංස**
**සභාපති**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**
**28.02.2023**

# විගණන කමිටු වාර්තාව - 2022

2021.11.17 වන දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වූ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුකූලව විගණන කමිටුව ස්ථාපනය කරනු ලැබ ඇත.

ඉහත මාර්ගෝපදේශවලට අයත් ආදර්ශ විගණන කමිටු ප්‍රඥප්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම, ඉදිරිපත් කිරීම සහ එහි ලා ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කිරීම් සිදු කිරීම සඳහාත්, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අවශ්‍යතා, ආයතන පනත්වල තොරතුරු ආශ්‍රිත අවශ්‍යතා, සමාගම් පනත සහ අනෙකුත් අදාළ මූල්‍ය වාර්තාකරණය හා සම්බන්ධ රෙගුලාසි සහ අවශ්‍යතා සමග අනුකූලතාව දැක්වීම සඳහාත්, ආයතනයේ අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල නියමයන් සපුරාලීමට ප්‍රමාණවත් බවට වග බලා ගැනෙන ක්‍රියාවලි පවත්වා ගැනීම සඳහාත්, ආයතනයේ අභ්‍යන්තර විගණන කර්තව්‍යයේ කාර්ය සාධනය සහතික වනු සඳහාත්, අවදානම් කමිටුවක් නොමැති අවස්ථාවල දී වැදගත් ව්‍යාපාර හා මූල්‍ය අවදානම් හඳුනා ගැනීම, අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහාත්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට සහ ප්‍රධාන කළමනාකාරිත්වය තුළ සේවයේ නියුක්ත පුද්ගලයන්ට අදාළ සම්බන්ධිත පාර්ශව ආශ්‍රිත ගනුදෙනු පිළිබඳ වාර්තා කිරීම සඳහාත් වූ කරුණු සම්බන්ධයෙන් ස්වකීය වගකීම ඉටු කරනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය තම සහය විගණන කමිටුව විසින් සලසා දෙනු ලබයි.

**එකී මාර්ගෝපදේශවලට අනුව,**

- විගණන කමිටුව සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර වර්ෂය තුළ භාණ්ඩාගාරය නියෝජනය කළ අධ්‍යක්ෂවරයා එහි සභාපතිත්වය දැරීය.

- ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී ආර්.එස්.කේ. විජේමාන්න මහතා සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ආර්.එම්.එස්. වසන්තා මහත්මිය නිරීක්ෂකයින් ලෙස සහභාගී විය.

රාජ්‍ය ඔෟෂධ නිෂ්පාදන සංස්ථාවේ අභ්‍යන්තර විගණක වරයා විගණන කමිටු රැස්වීම්වල කැඳවුම්කරු ලෙස ක්‍රියා කළේ ය.

රාජ්‍ය ඔෟෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපති වරයා විගණන කමිටුවේ ආරාධනය මත විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගී විය.

මූල්‍ය වර්ෂය තුළ, විගණන කමිටුව තෙමසකට වරක් රැස් වූ අතර විගණන කමිටු රැස්වීම් පහක් පැවැත්විණි.

**2022 වර්ෂයේ දී විගණන කමිටුව විසින්**

- අදාළ ගැටලුවල ස්වභාවය, ඒ සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ ප්‍රතිචාර සහ විශේෂිතව ගෙන හැර දක්වන ලද අඩුපාඩු මගහරවා ගැනීම සඳහා අදාළ කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග යනාදිය ආවරණය කරමින් වර්ෂය තුළ නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා කීපයක් සලකා බලන ලදී.

- මූල්‍ය, ප්‍රසම්පාදන, තොග සහ ස්ථාවර වත්කම් ඇතුළු ක්ෂේත්‍රවල ඇතැම් අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව සමාලෝචනය කර සුදුසු නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

- කමිටුවේ නිර්දේශ මත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ගනු ලැබූ පසු විපරම් ක්‍රියාමාර්ග සලකා බලන ලදී.

- අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කරන ලද අමුද්‍රව්‍ය සහ නිමි භාණ්ඩ යන ක්ෂේත්‍රවල ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය මඟින් ජනනය කරන ලද තොරතුරුවල නිරවද්‍යතාවය කෙරෙහි අවධානය යොමු කරන ලදී.

- 2019 සහ 2020 යන වර්ෂවලට අයත් විගණකාධිපති වාර්තා මඟින් පෙන්වා දී ඇති නිරාකරණය නොවූ ගැටලු නිවැරදි කිරීම සඳහා ගෙන ඇති පසු විපරම් ක්‍රියාමාර්ග සලකා බලන ලදී.

- 2020 වර්ෂය සඳහා විගණකාධිපති වරයාගේ 13 (7) (A) (කළමනාකරණ ලිපිය) දරන වාර්තාව සමාලෝචනය කර ගැටලු නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සලකා බලන ලදී.

- රාජ්‍ය ඔෟෂධ නිෂ්පාදන සංස්ථාව සඳහා අවදානම් කමිටුවක් පත් කිරීම පිළිබඳව සහ වාර්ෂික කාර්ය සාධන සමාලෝචන රැස්වීම පැවැත්වීම පිළිබඳව සලකා බලා ඒ සම්බන්ධයෙන් වූ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

- රාජ්‍ය ඔෟෂධ නිෂ්පාදන සංස්ථාව සඳහා විගණන කමිටු ප්‍රඥප්තියක අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කර ඒ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

- 2021 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

- 2023 වර්ෂය සඳහා වන අයවැයගත මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කර ඒ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

කමිටුවේ නියමයන් මඟින් සියලු ප්‍රමාණාත්මක කරුණුවල විෂයයන් ආවරණය වන්නේය යන්න විගණන කමිටුවේ මතයයි.

**විගණන කමිටුවේ සාමාජිකයින්**

| | | |
|---|---|---|
| එස්.ඒ.සී. කුලතිලක | - සභාපති | - අධ්‍යක්ෂ - රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව/ අධ්‍යක්ෂ ජනරාල්<br>- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව (2022.03.22 වන දින දක්වා) |
| ඒ.ආර්. වික්‍රමසිංහ | - සභාපති | - අධ්‍යක්ෂ - රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව / අධ්‍යක්ෂ (වැඩ බලන)<br>- මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව (2022.04.29 වන දින සිට) |
| වී.ජී.සී. වික්‍රමරත්න | - සාමාජික | - අධ්‍යක්ෂ - රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව |
| යූ.එස්.කේ. දෙනාවත්ත | - සාමාජික | - අධ්‍යක්ෂ - රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව / අතිරේක ලේකම් (පරිපාලන)<br>- ඖෂධ නිෂ්පාදන, සැපයුම් සහ නියාමන ඒකකය - සෞඛ්‍ය අමාත්‍යාංශය |

**ඒ.ආර්. වික්‍රමසිංහ**
**සභාපති - විගණන කමිටුව**
**22.02.2023**

# ආයතනික පාලන වාර්තාව

ආයතනික පාලනය යනු ඉහළ විනිවිදභාවය, නිරවද්‍ය හා කාලීන මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කිරීම මගින් ආයතනයට සම්බන්ධ පාර්ශවයන්ගේ (ආයෝජකයින්, සේවකයින්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින්, රජය සහ ප්‍රජාව) අභිමතාර්ථ සාධනය උදෙසා කළමනාකරණය විසින් ආයතන අධ්‍යක්ෂණය සහ පාලනය කරන ක්‍රම පිළිවෙලයි.

සංස්ථාපිත පාලන සම්බන්ධ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය කළමනාකරණය, ඖෂධවේදය, වෛද්‍ය විද්‍යාව, අලෙවිකරණය, මූල්‍ය හා පරිපාලනය යන ක්ෂේත්‍රයන්හි වෘත්තීමය සහ අත්දැකීම් බහුල පුද්ගලයන්ගෙන් සැදුම් ලබයි.

විධායක අධ්‍යක්ෂවරයෙකු වන සභාපතිවරයා සහ විධායක නොවන අධ්‍යක්ෂවරු හතර දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.

පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවකදී හෝ ගරු ඇමතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර නොමැති විටකදී හැර අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වේ. අවශ්‍ය විටෙකදී විශේෂ රැස්වීමක් පැවැත්වීමටද කටයුතු කරනු ලැබේ.

සමාලෝචනයට ලක් වූ කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අටක් පැවැත්වුණි.

## කළමනාකරණ කමිටුව

සංස්ථාපිත කළමනාකරණ කමිටුවේ සභාපති තනතුර සංස්ථාවේ සභාපතිවරයා විසින් හොබවනු ලැබේ. අනෙකුත් කමිටු නිළධාරීන් වන්නේ සංස්ථාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ නියෝජ්‍ය ප්‍රධානීන් ය.

සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධ තීරණ ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ සහ උපාය මාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීම මෙන්ම අවශ්‍ය විටෙක ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සුදුසු නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ආදී කටයුතු කළමනාකරණ කමිටුව මගින් සිදුකෙරේ. කළමනාකරණ කමිටුව මාසිකව රැස්වේ.

## විගණන කමිටුව

"යහපත් පාලනය සහ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ" සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලව විගණන කමිටුව පිහිටුවා ඇත.

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කෙරෙන අතර සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙකුගෙන් සමන්විත වේ. මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධක්ෂවරයා කමිටුවේ සභාපති වේ.

සංස්ථාවේ කාර්යයන් පරීක්ෂා කිරීම සහ ඇගයීම් විගණන කමිටුව විසින් ස්වාධීනව සිදු කරනු ලැබේ. අභ්‍යන්තර විගණන කාර්යයන්, විගණන කමිටුවේ අනුමැතිය මත පිළියෙල කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කෙරෙන අතර එය විගණකාධිපතිවරයාගේ දැනුවත් වීමට ද යොමු කෙරේ.

අදාල කාල පරිච්ඡේදය තුළදී විගණන කමිටු රැස්වීම් පහක් පැවැත්වුණි. විගණන කමිටුවේ වාර්තාව පිටු අංක 20 හි දක්වා ඇත.

## ආයෝජකයන්ගේ සම්බන්ධතා සහ පොදු වගකීම

ජනතාව වෙනුවෙන් රජය විසින් පොදු ව්‍යාපාර පිහිටුවීම, අයිතිය පවත්වා ගෙන යාම සහ මෙහෙයවීම කරනු ලැබේ. එම නිසා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරුවන් ආයතනය පාලනය කිරීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යංශය ලෙස සෞඛ්‍ය අමාත්‍යංශයටත් මුදල් අමාත්‍යංශයේ මහා භාණ්ඩාගාරයටත් වගකිව යුතු වේ. මෙම වගකීම සපුරාලමින් වාර්ෂික වාර්තාව, වාර්ෂික ගිණුම්, වාර්ෂික අයවැය, කාර්තු සඳහා ප්‍රගති වාර්තා ආදිය එම අමාත්‍යංශ වලට ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මූල්‍ය සම්බන්ධව අවසාන අධිකාරී බලය ජනතා නියෝජිතයින් නියෝජනය කරන්නා වූ පාර්ලිමේන්තුව සතුව පවතින බව ප්‍රජාතන්ත්‍රවාදී ලෝකය විසින් පිළිගෙන ඇත.

ආයතනයේ ප්‍රගතිය, මූල්‍ය වාර්තා, විගණන වාර්තාව ඇතුලත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

පොදු ව්‍යාපාරයක් ලෙස සංස්ථාව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර සඳහා වන පාර්ලිමේන්තු කාරක සභාවට (COPE) වගකියනු ලැබේ.

## වේතන ප්‍රතිපත්තිය

සංස්ථාවේ වේතන ප්‍රතිපත්තිය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් මත පිහිටුවා සකසා ඇත.

අධ්‍යක්ෂ වේතන සහ අනෙකුත් දීමනා මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරන රාජ්‍ය සංස්ථා වලට අදාල වේතන හා දීමනා සඳහා වන චක්‍රලේඛ මත පදනම්ව ගෙවනු ලැබේ.

සේවක වේතන රාජ්‍ය පරිපාලන වැටුප් තලයන් පාදක කර ගනිමින් සංස්ථාව විසින් පිළියෙල කරන ලද වැටුප් තලයන් අනුව මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේනතුවේ අනුමැතිය ඇතිව ගෙවනු ලැබේ.

කාර්යසාධනය මත සෘජුවම අගය කිරීමක් ලෙස කාර්යසාධන දිරිදීමනාව හඳුනාගෙන ඇත.

## අභ්‍යන්තර පාලනය

ආයතනය විසින් එළඹෙන සියලු ගනුදෙනු සඳහා නියමිත අධිකාරිය ලැබුන බවටත්, සටහන් ගත කිරීම, වාර්තා කිරීම යන කරුණු සම්බන්ධයෙන් සාධාරණ තහවුරු කිරීමක් ඇතිවන පරිදි අභ්‍යන්තර පාලනය සැලසුම් කොට ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

කාර්යයන් මත පදනම් වූ ආයතනික සැලැස්මක් ක්‍රියාත්මක වේ. නියමිත කාර්යයන් අනුව දෙපාර්තමේන්තු සැලසුම් කර ඇති අතර ඒවා නිෂ්පාදන, තත්ව පාලන, නඩත්තු, මූල්‍ය, සැලසුම්, වට්ටෝරු පර්යේෂණ හා සංවර්ධන, අලෙවිකරණ ආදී වශයෙන් වෙති. සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාත්මක කීරිමේ නිලධාරී වන සාමාන්‍යාධිකාරී වෙත එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානියා සෘජුවම වාර්තා කරයි. සාමාන්‍යාධිකාරී, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි.

අභ්‍යන්තර විගණන කාර්යය මගින් අභ්‍යන්තර පාලනය තව දුරටත් ශක්තිමත් කෙරේ. අභ්‍යන්තර විගණක සෘජුවම සභාපතිවරයාට සහ විගණන කමිටුවට වාර්තා කිරීම මඟින් අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය තවදුරටත් තහවුරු කෙරේ.

මිලදී ගැනීමේ ක්‍රියාවලිය තරඟකාරී ටෙන්ඩර් පටිපාටිය මඟින් සිදු කෙරෙන අතර ගණුදෙනු වල විනිවිදභාවය රැකීම තුලින් සැපයුම්කරුවන්ට මෙමඟින් සමාන අවස්ථා ද ලැබේ.

ප්‍රාග්ධන අයවැය ඇතුළත් වාර්ෂික අයවැය ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට සෞඛ්‍ය අමාත්‍යංශයට හා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ.

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වාර්තාව

මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්, පිටු අංක 63-74 හි ඇතුලත් විගණකාධිපති වාර්තාවේ සඳහන් විගණකවරයාගේ වගකීම තුලින් වෙනස් වේ.

1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව රාජ්‍ය සංස්ථා විසින් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සහ සංස්ථාවේ අනෙකුත් සියළුම ගනුදෙනු පිළිබඳ ගිණුම් වාර්තා සුදුසු පරිදි තබා ගත යුතුය. රාජ්‍ය සංස්ථා විසින් ගිණුම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් සහ සංස්ථාවේ ක්‍රියාකාරකම් හා සම්බන්ධ වූ සංඛ්‍යානමය කරුණු, එකී ස්වරූපයන් හා එකී කරුණු ඇතුලත්ව පිළියෙල කළ යුතුය.

රජය සහ ආයතනයට සම්බන්ධ පාර්ශවයන් නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයට, ආයතනයේ භාරකාරීත්වය සම්බන්ධයෙන් ව්‍යවස්ථානුකූලව වගකීමක් හිමිව තිබෙන අතර සංස්ථාවේ මූල්‍ය තත්වය පිළිබඳ සාධාරණ නිවැරදිතාවයකින් යුක්තව හෙලිදරව් කිරීම සඳහා ප්‍රමාණවත් ගිණුම් වාර්තා සංස්ථාව තුළ තබා ගැනීමට ඔවුන් වගකීමෙන් බැඳේ. එසේම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සිදු කොට ඇති බවට සහ 1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව අවශ්‍ය තොරතුරු සපයා ඇති බවට සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම සංකල්පය අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කර ඇති බව සහතික කළ යුතුය.

සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා සාධාරණ පියවර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීමක් ඇති අතර, මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනය, අභ්‍යන්තර සෝදිසි කිරීම්, මූල්‍යමය සමාලෝචනය සහ වංචා හා අක්‍රමිකතා අනාවරණය කර ගැනීම ඇතුළත් වූ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීම සඳහා සුදුසු සලකා බැලීම් කිරීමේ වගකීමද ඔවුන් සතුය.

1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව විගණකාධිපති, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කළ සියලුම මූල්‍ය වාර්තා හා සම්බන්ධිත දත්ත සමඟ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර ඇති අතර ප්‍රකාශිත මතය මෙම වාර්තාවේ පිටු අංක 63-74 හි සඳහන්ව ඇත.

**වෛද්‍ය පී.පී.ජී.පී.යූ. ඉන්ද්‍රවංස**
**සභාපති**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**

# අවදානම් කළමනාකරණ වාර්තාව

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වන අප, අපගේ ආයතනයේ කෙටි කාලීන සහ දිගු කාලීන යන කාලද්වයේම තිරසාර භාවය සුරැකීම සඳහා අවදානම් කළමනාකරණය හා බැඳි වටිනාකම වටහාගෙන සිටින්නෙමු. අවදානම් කළමනාකරණය, අපගේ ආයතනික උපාය මාර්ගයේ සහ ව්‍යාපාර ආකෘතියේ අත්‍යවශ්‍ය අංගයකි. ඒ මක්නිසාදයත්, කාලයත් සමඟ යම් අගයක් එකතු කිරීමට අපට ඇති හැකියාව කෙරෙහි එය, සෘජු බලපෑමක් ඇති කරන හෙයිනි.

අවදානම් කළමනාකරණයේ අරමුණු වන්නේ:

- සංස්ථාවේ දිගු කාලීන පැවැත්ම සහතික කිරීම.
- පාරිසරික සහ වෙළෙඳපළ තත්වයන්ගෙන් සංස්ථාව ආරක්ෂා කිරීම.
- සංස්ථාවේ සේවක සේවිකාවන්, සංස්ථාවේ වත්කම් සහ මහජනතාව ආරක්ෂා කිරීම.
- සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා සහාය වීම.

ද්‍රවශීලතා අවදානම, ප්‍රසම්පාදන අවදානම, නිෂ්පාදන අවදානම, වෙළෙඳපළ අවදානම, විනිමය අනුපාත අවදානම, සමාජ ආර්ථික අවදානම හා මානව සම්පත් අවදානම ඇතුළු අවදානම් ගණනාවක් කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා කළමනාකාරිත්වය විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

## ද්‍රවශීලතා අවදානම

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, රජයේ වෛද්‍ය සැපයුම් අංශයට 100% ණය කොන්දේසි මත ඖෂධ සපයයි. වෛද්‍ය සැපයුම් අංශය විසින් දිගු කාලීනව පියවා නොමැති බිල්පත් මගින් ද්‍රවශීලතා අවදානමක් ඇති විය හැකි ය. එබැවින්, ද්‍රවශීලතා අවදානම මඟහරවා ගැනීම සඳහා අදාළ බලධාරීන් වෙතින්, මහා භාණ්ඩාගාරයේ මැදිහත්වීම ඇතිව, අදාළ මුදල් පියවා ගැනීමට සංස්ථා කළමනාකාරිත්වය විසින් පියවර ගනු ලැබ ඇත.

## ප්‍රසම්පාදන අවදානම

නව අමු ද්‍රව්‍ය ප්‍රසම්පාදනය ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ, රජයේ ටෙන්ඩර් පටිපාටියට අනුව වන අතර අමු ද්‍රව්‍යවලින් 80% කට වැඩි ප්‍රමාණයක් ආනයනය කෙරේ. එබැවින්, නිෂ්පාදන ක්‍රියාවලියට බලපෑ හැකි අමු ද්‍රව්‍ය අඛණ්ඩව සැපයීමේ අවදානමක් පවතී.

මෙම අවදානම මඟහරවා ගැනීම සඳහා, කළමනාකාරිත්වය විසින් අමු ද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව සමීපව නිරීක්ෂණයට හසු කරනු ලබන අතර, ලෝක ව්‍යාප්ත ටෙන්ඩර් පටිපාටිය හරහා සැපයුම්කරුවන් ප්‍රමාණය පුළුල් කිරීම සඳහා අවැසි පියවර ගනු ලැබ ඇත.

## නිෂ්පාදන අවදානම

වෙළඳපළ වෙත නිකුත් කෙරෙන සියලුම නිෂ්පාදන, අපගේ අභ්‍යන්තර පිරිවිතරයන්ට මෙන්ම, බ්‍රිතාන්‍ය ඖෂධ පිරිවිතරවලට (BP) සහ එක්සත් ජනපද ඖෂධ පිරිවිතරවලට (USP) අදාළ අවශ්‍යතා සපුරාලයි.

මනා නිෂ්පාදන පිළිවෙත් (GMP) නිතිපතා අධීක්ෂණය කරනු ලබන අතර ඖෂධ නිෂ්පාදන, නියමිත ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා එකී නිෂ්පාදනවලට අදාළ අනෙකුත් පද්ධති සහ ක්‍රියා පටිපාටින් අඛණ්ඩව සමාලෝචනයට හසු කෙරේ.

## වෙළඳපළ අවදානම

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා සම්බන්ධ වෙළඳපළ තරගකාරිත්වය වැඩි වීමේ අවදානමක් ඇත. අපගේ නිෂ්පාදන සඳහා ප්‍රධාන තරගකරුවන් ලෙස ඖෂධ ආනයනය කරන ඖෂධ සමාගම් හඳුනා ගත හැකි ය. අවදානම පිළිබඳව දැනුවත්ව සිටිමින්, සමස්ත පිරිවැය අඩු කිරීම සඳහා, ඵලදායිතාව ඉහළ නැංවීමට අපගේ අවධානය අඛණ්ඩව යොමු කරන්නෙමු.

## විනිමය අනුපාත අවදානම

විනිමය අනුපාතවල උච්චාවචනය නිෂ්පාදනවල මිලකරණය කෙරෙහි සෘජුවම බලපෑම් ඇති කරයි. 2022 වර්ෂය තුළ විනිමය අනුපාත ඉහළ යාම, නිෂ්පාදන මිලකරණයට දැඩි ලෙස බලපෑවේ ය. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි කළමනාකාරිත්වය, එහිලා ඇති වූ යම් දුර්වලතා මඟහරවා ගැනීම සඳහා මිලකරණ කමිටු රැස්වීමක් පැවැත්වී ය.

## සමාජ ආර්ථික අවදානම

ජාතික සෞඛ්‍ය ආරක්ෂණ සේවා පද්ධතියට සහ සාමාන්‍ය ජනතාවට දැරිය හැකි මිල ගනන් වලට ඵලදායී ඖෂධ ලබා දීම, රාජ්‍ය ආයතනයක් ලෙස රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි ප්‍රමුඛ වගකීම වේ.

## මානව සම්පත් අවදානම

ආයතනවල පුහුණු සේවකයින් විදේශවලට සංක්‍රමණය වීමේ අවදානමක් පවතින හෙයින් ඊට අදාළ වැටුප් රහිත නිවාඩු පටිපාටිය වෙනස් කිරීමට කළමනාකාරීත්වය තීරණය කර ඇත

# තිරසාර සංවර්ධන ඉලක්ක

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, වගකිව යුතු රාජ්‍ය ආයතනයක් ලෙස සංස්ථාවේ කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන උපාය මාර්ග තුළ තිරසාර සංවර්ධන ඉලක්ක අන්තර්ගත කිරීම මගින් එම ඉලක්ක සපුරා ගැනීමට දායක වේ.

## 1 දරිද්‍රතාවය තුරන් කිරීම

සංස්ථාව විසින්, ස්වකීය සේවක සේවිකාවන් 321 දෙනෙකුගේ ජීවනෝපායික තත්වය ඉහළ නැංවීම පිණිස ඔවුන්ගේ සේවක පිරිවැය ලෙස රුපියල් මිලියන 375 ක මුදල් ප්‍රමාණයක් ගෙවනු ලැබ ඇත. තවද, එම සේවක සේවිකාවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීමේ අරමුණින්, ණය යෝජනා ක්‍රම හා වෛද්‍ය පහසුකම් යනාදී විවිධ සුබසාධන කටයුතු ඔවුන් වෙත සපයා දෙනු ලැබේ.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, රාජ්‍ය ආයතනයක් ලෙස සාමාන්‍ය ජනතාවට ආර්ථික සහන සැලසීමේ අරමුණින් උසස් තත්ත්වයේ ඖෂධ වර්ග ඔවුනට දැරිය හැකි මිලකට සපයයි.

## 3 යහපත් සෞඛ්‍ය තත්වය සහ යහ පැවැත්ම

ඖෂධ නිෂ්පාදනය කරන එකම රාජ්‍ය සංවිධානය ලෙස රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, ඖෂධ නිෂ්පාදන ක්‍රියාවලියේ දී ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් අනුගමනය කරයි.

රජයේ රෝහල්වල ඖෂධ හිඟයක් ඇති නොකර විවිධ ඖෂධ වර්ග (රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන මාලාව) අඛණ්ඩව රජයේ රෝහල් වෙත සපයනු ලබන අතර බෙදාහැරීමේ සේවා මාර්ග ඔස්සේ දැරිය හැකි මිලකට පුද්ගලික අංශයේ වෙළඳපළ වෙත ද එකී ඖෂධ වර්ග සම්පාදනය කරනු ලැබේ.

සෞඛ්‍ය සුවතාව සහ යහ පැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා සංස්ථා සේවක සේවිකාවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආවරණය වන වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමය, පාරිතෝෂිත දීමනා ගෙවීම හා ප්‍රසූත නිවාඩු ලබා දීම යනාදී ක්‍රම මගින් සංස්ථාව, තම සේවක සේවිකාවන් වෙත වෛද්‍ය ප්‍රතිලාභ ඇතුළු ප්‍රතිලාභ සලසා දී ඇත.

## 5 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

සංස්ථාව, තම සියලුම සේවක සේවිකාවන්ට සමාන අවස්ථා ලබා දී ඇති අතර ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්ව කිසිදු වෙනස්කමක් නොදක්වයි. සියලුම සේවක සේවිකාවන් විෂයයෙහි කිසිදු වෙනස්කම් දැක්වීමක් නොකර ඔවුනට සමාන ප්‍රතිලාභ සලසා දීමේ ප්‍රතිපත්තියක් තුළ ඔවුනට සලකන අතර, සියලු ව්‍යවස්ථාපිත සහ අනෙකුත් අවශ්‍යතාවලට අනුකූලව, එකම රැකියා කාණ්ඩ වෙනුවෙන් සමාන ප්‍රතිලාභ පරිමාණයන් (1.1) සඳහා සුදුසුකම් ලබන අයුරින්, ස්ත්‍රී සහ පුරුෂ යන දෙපාර්ශවයම අතර අසමානතා කිසිවකට ඉඩකඩක් නොතබා කටයුතු කරයි.

## 8 සෑජු කාර්ය නියුක්තිය සහ ආර්ථික වර්ධනය

සංස්ථාව විසින් රුපියල් මිලියන 800 ක මුදල් ප්‍රමාණයක්, රටේ ආර්ථික වර්ධනය උදෙසා විවිධ බදු, අය බදු සහ තීරුබදු ලෙස රජයට දායක කර දී ඇත. එකම රාජ්‍ය ඖෂධ නිෂ්පාදකයා ලෙස, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, රට තුළ ඖෂධ හිඟයක් ඇති නොවන පරිදි විවිධ ඖෂධ වර්ග වසර පුරා රජයේ රෝහල්වලට සහ පෞද්ගලික අංශය වෙත අඛණ්ඩව සැපයීමෙහි නියැලෙයි.

තවද, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින්, 2022 වර්ෂයේ දී එහි මුළු පිරිවැටුමෙන් 35% කට වඩා වැඩි ප්‍රමාණයක ආර්ථික වටිනාකමක් සහ ඩොලර් ඉතිරියක් රටට එකතු කර දෙන ලදී.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින්, නව අත්‍යාවශ්‍ය ඖෂධ වන සිටාග්ලිප්ටින් මිලි ග්‍රෑම් 50 පෙති සහ රොසුවැස්ටටින් මිලි ග්‍රෑම් 10 පෙති, 2022 වර්ෂයේ දී පහසු මිලට සැපයීමේ අරමුණින් යුතුව, පෞද්ගලික වෙළෙඳපොළ සහ රජයේ රෝහල් වෙත ලබා දීම සඳහා ඊට අදාළ විද්‍යාත්මක පර්යේෂණ වැඩි දියුණු කරනු ලැබ ඇත. පිළිකා රෝග ප්‍රතිකාර සඳහා යොදා ගනු ලබන මුඛ ඝන මාත්‍රා (OSD) ඖෂධ සහ විකලාංග උපකරණ නිෂ්පාදනය සඳහා වූ යන්ත්‍රාගාරයක් ස්ථාපනය කිරීමට ද රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් සැලසුම් සම්පාදනය කරනු ලැබ තිබේ.

**9 කර්මාන්ත නවෝත්පාදනය සහ යටිතල පහසුකම්**

පුහුණු කිරීම්, බඳවාගැනීම්, වැඩ පවරා දීම් සහ උසස්වීම් ලබා දීම් වැනි එදිනෙදා කටයුතුවල දී සැමට සාධාරණව සැලකීම පිණිස උපකාර කර ගැනීමට පැහැදිලි සමානාත්මතා ප්‍රතිපත්ති පවත්වා ගැනීම හරහා හැකියාව ලැබෙනු ඇත.

**10 අසමානතා පහත හෙළීම**

එකඟ වූ ජාත්‍යන්තර කාර්ය රාමුවලට අනුකූලව, අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වූ පරිසර හිතකාමී කළමනාකරණ පද්ධතියක් අප විසින් පවත්වා ගෙන යනු ලබන අතර ඉන් මිනිස් සෞඛ්‍යයට සහ පරිසරයට සිදු වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ඒවා වාතයට, ජලයට සහ පසට මුදා නොහැරීම අප විසින් සහතික කරනු ලබන්නෙමු. ඖෂධ නිෂ්පාදනවල අපද්‍රව්‍ය බැහැර කරනු ලබන්නේ, ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන් සහ ඊට අදාළ නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව ය.

**12 වගකීම් සහිත පරිභෝජනය සහ නිෂ්පාදනය**

දේශගුණය ආශ්‍රිත උවදුරු සහ ඊට අදාළව සිදු වන ස්වභාවික විපත් මගින් ඇති වන බලපෑම් අවම කිරීම සහ වළක්වා ගැනීම සඳහා වූ අභ්‍යන්තර ක්‍රියා පටිපාටි සහ පරිචයන් අප විසින් ගොඩනගා ගනු ලැබ ඇත. ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය මණ්ඩලයට අවැසි පුහුණු කිරීම් හා දැනුවත් කිරීමේ වැඩසටහන් අප විසින් සලසා දෙනු ලබන්නෙමු.

**13 දේශගුණය විෂයයෙහි ක්‍රියාමාර්ග**

# ආයතනික සමාජ වගකීම්

සමාජයේ සෞඛ්‍ය, සුභසාධනය සහ තිරසාර සංවර්ධනය සඳහා දායක වීම උදෙසා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව පියවර ගණනාවක් ගෙන ඇත.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, ස්වකීය කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය ඇතිව පිළිකා රෝහල වෙත රුධිරය පරිත්‍යාග කිරීම, ආහාරපාන හා අත්‍යවශ්‍ය බෙහෙත් වර්ග සැපයීම සහ එහි ශල්‍යාගාරය අලුත්වැඩියා කිරීම වැනි ක්‍රියාකාරකම් කිහිපයක් ඉටු කිරීම සඳහා කටයුතු කර ඇත.



# අපගේ නිපැයුම් වර්ග - 2022
## එක් එක් නිපැයුම් වර්ග අනුව නිෂ්පාදිත පෙති හා කරල් සංඛ්‍යාව

| නිපැයුම් වර්ග | ප්‍රමාණය (මිලියන) |
|---|---|
| ඇමොක්සිසිලින් කරල් BP මි.ග්‍රෑ 250 | 80.85 |
| ඇමොක්සිසිලින් කරල් BP මි.ග්‍රෑ 500 | 43.58 |
| ඇමොක්සිසිලින් පෙති USP මි.ග්‍රෑ 125 | 12.59 |
| ඇස්කෝබික් අම්ලය පෙති BP මි.ග්‍රෑ 100 | 144.45 |
| ඇස්ප්‍රින් පෙති BP මි.ග්‍රෑ 75 | 1.50 |
| ඇටනොලොල් පෙති BP මි.ග්‍රෑ 50 | 10.00 |
| ඇටෝවාස්ටටින් පෙති IP මි.ග්‍රෑ 10 | 191.01 |
| ඇටෝවාස්ටටින් පෙති IP මි.ග්‍රෑ 20 | 52.80 |
| බෙන්සෙක්සෝල් පෙති BP මි.ග්‍රෑ 2 | 40.00 |
| බිසප්‍රොලෝල් පෙති BP මි.ග්‍රෑ 5 | 4.50 |
| කාබමෙසපීන් පෙති BP මි.ග්‍රෑ 200 | 31.75 |
| සෙට්රිසින් පෙති BP මි.ග්‍රෑ 10 | 29.90 |
| සිප්‍රොෆ්ලොක්සසින් පෙති USP මි.ග්‍රෑ 250 | 3.00 |
| සිප්‍රොෆ්ලොක්සසින් පෙති USP මි.ග්‍රෑ 500 | 4.00 |
| ක්ලැරිත්‍රොමයිසීන් පෙති USP මි.ග්‍රෑ 250 | 9.60 |
| ක්ලොපිඩොග්‍රෙල් පෙති USP මි.ග්‍රෑ 75 | 2.99 |
| ක්ලොක්සසිලීන් කරල් BP මි.ග්‍රෑ 250 | 20.28 |
| ක්ලොක්සසිලීන් කරල් BP මි.ග්‍රෑ 500 | 19.25 |
| කො-ට්‍රිමොක්සසෝල් පෙති BP (adult) | 8.25 |
| ඩයික්ලෝෆෙනැක් සෝඩියම් පෙති USP මි.ග්‍රෑ 50 | 35.10 |
| ඩිල්ටියසෙම් HCl පෙති USP මි.ග්‍රෑ 30 | 48.00 |
| ඩිල්ටියසෙම් HCl පෙති USP මි.ග්‍රෑ 60 | 10.50 |
| ඩොම්පෙරිඩෝන් BP පෙති මි.ග්‍රෑ 10 | 58.10 |
| එනලප්‍රිල් මැලියේට් පෙති USP මි.ග්‍රෑ 5 | 55.21 |
| ෆැමොටිඩීන් පෙති BP මි.ග්‍රෑ 20 | 102.63 |
| ෆ්ලුක්ලොක්සසිලින් කරල් BP මි.ග්‍රෑ 250 | 8.40 |
| ෆ්ලුක්ලොක්සසිලින් කරල් BP මි.ග්‍රෑ 500 | 9.28 |
| ෆෝලික් ඇසිඩ් පෙති BP මි.ග්‍රෑ 1 | 64.00 |

| නිපැයුම් වර්ග | ප්‍රමාණය (මිලියන) |
|---|---|
| ෆෲසෙමයිඩ් පෙති BP මි.ග්‍රෑ 40 | 73.50 |
| ගාබපෙන්ටින් කරල් USP මි.ග්‍රෑ 300 | 7.72 |
| ග්ලික්ලසයිඩ් පෙති BP මි.ග්‍රෑ 80 | 174.00 |
| ග්ලික්ලසයිඩ් පෙති BP මි.ග්‍රෑ 40 | 297.00 |
| ඉන්ඩොමෙතසින් කරල් BP මි.ග්‍රෑ 25 | 5.00 |
| ලෙවොතයිරොක්සීන් පෙති IP ම.ග්‍රෑ 50 | 54.71 |
| ලොරටඩීන් පෙති USP මි.ග්‍රෑ 10 | 3.75 |
| ලොසාටන් පොටෑසියම් BP පෙති මි.ග්‍රෑ 25 | 1.50 |
| ලොසාටන් පොටෑසියම් BP පෙති මි.ග්‍රෑ 50 | 309.40 |
| මෙබෙන්ඩසෝල් පෙති USP මි.ග්‍රෑ 500 | 0.32 |
| මෙෆෙනමික් ඇසිඩ් පෙති BP මි.ග්‍රෑ 500 | 0.41 |
| මෙට්ෆෝමින් පෙති BP මි.ග්‍රෑ 500 | 72.84 |
| මෙට්‍රනයිඩසෝල් පෙති BP මි.ග්‍රෑ 200 | 14.40 |
| ඔමෙප්‍රසෝල් කරල් IP මි.ග්‍රෑ 20 | 201.80 |
| පැරසිටමෝල් පෙති BP මි.ග්‍රෑ 500 | 523.05 |
| ෆිනොක්සිමිතයිල් පෙනිසිලින් පෙති BP මි.ග්‍රෑ 250 | 12.80 |
| ප්‍රෙඩ්නිසෙලෝන් පෙති BP මි.ග්‍රෑ 1 | 50.45 |
| ප්‍රෙඩ්නිසෙලෝන් පෙති BP මි.ග්‍රෑ 5 | 106.40 |
| ප්‍රොප්‍රනලෝල් පෙති BP මි.ග්‍රෑ 40 | 13.95 |
| රොසුවාස්ටටින් පෙති IP මි.ග්‍රෑ 10 | 1.07 |
| සැල්බියුටමෝල් පෙති BP මි.ග්‍රෑ 2 | 117.60 |
| සැල්බියුටමෝල් පෙති BP මි.ග්‍රෑ 4 | 6.00 |
| ස්පයිරනොලැක්ටෝන් පෙති USP මි.ග්‍රෑ 25 | 36.00 |
| තියෝෆිලීන් ER පෙති මි.ග්‍රෑ 125 | 13.65 |
| ට්‍රැමඩෝල් කරල් IP මි.ග්‍රෑ 50 | 1.20 |
| ට්‍රයිප්ලුවොපෙරසීන් HCl පෙති BP මි.ග්‍රෑ 5 | 13.50 |
| වෙරපමිල් පෙති BP මි.ග්‍රෑ 40 | 24.20 |
| විටමින් බී පෙති CHF | 64.40 |

## 2023 වර්ෂයේදී නිපදවීමට අදහස්කර ඇති ඖෂධ

ඇම්ලොඩිපින් බෙසිලේට් පෙති USP මි.ග්‍රෑ 5

ෆෝලික් ඇසිඩ් පෙති BP ම.ග්‍රෑ 400

ඉබුප්‍රොෆෙන් පෙති BP මි.ග්‍රෑ 200

මෙට්ෆෝමින් පෙති BP මි.ග්‍රෑ 850

මෙතිල් ප්‍රෙඩ්නිසලෝන් පෙති BP මි.ග්‍රෑ 4

ලෙව්ටිරසිටම් පෙති USP මි.ග්‍රෑ 250

# බද්ධ ව්‍යාපාර නිපැයුම්

1 Acetaminophen Suppositories USP 125 mg
2 Acetaminophen Suppositories USP 250 mg
3 Acetaminophen Suppositories USP 500 mg
4 Acetazolamide Tablets BP 250 mg
5 Aciclovir Tablets BP 200 mg
6 Aciclovir Tablets BP 800 mg
7 Alfacalcidol Softgelatin Capsules 0.25 mcg
8 Amiodarone Tablets BP 100 mg
9 Amisulpride Tablets BP 200 mg
10 Amlodipine Besylate Tablets USP 2.5 mg
11 Aripiprazole Tablets USP 10 mg
12 Atorvastatin Tablets IP 10 mg
13 Atorvastatin Tablets IP 20 mg
14 Atorvastatin Tablets 40 mg
15 Baclofen Tablets 5 mg
16 Baclofen Tablets BP 10 mg
17 Betamethasone Valerate Cream USP 0.1%, 15 g
18 Betamethasone Valerate Cream USP 0.1%, 5 g
19 Betamethasone Valerate Oinment USP 0.1%, 15g
20 Betamethasone Valerate Oinment USP 0.1%,5g
21 Bisacodyl Suppositories USP 10 mg
22 Bisacodyl Tablets BP 10 mg
23 Bisoprolol Fumarate Tablets USP 2.5 mg
24 Bosentan Tablets 125 mg
25 Bosentan Tablets 62.5 mg
26 Cabergoline Tablets USP 0.5 mg
27 Calciferol Tablets 10000IU
28 Calcitriol Softgel Capsules 0.25 mcg
29 Calcium Carbonate Tablets 1250 mg
30 Calcium Carbornate Chewable Tablets BP 500 mg
31 Calcium Lactate Tablets BP 300 mg
32 Captopril Tablets 12.5 mg
33 Carvedilol Tablets USP 3.125 mg
34 Carvedilol Tablets USP 6.25 mg
35 Carvedilol Tablets USP 12.50 mg
36 Cetirizine Oral Solution BP 5 mg /5 ml
37 Chlorpheniramine Oral Solution USP 2 mg /5 ml
38 Chlorpromazine Tablets BP 50 mg
39 Ciprofloxacin Intravenous Infusion BP 0.2% w/v, 100ml
40 Clindamycin Capsules BP 150 mg
41 Clindamycin Capsules BP 300 mg
42 Clomipramine Tablets 50 mg
43 Clopidogrel Tablets 75 mg
44 Clotrimazole Cream 1% 15 g
45 Clozapine Tablets USP 100 mg
46 Colecalciferol Tablets BP 400 IU
47 Compound Sodium Lactate Intravenous Infusion BP 500 ml
48 Cotton Crape Bandage, 10cm - 6m Roll
49 Cotton Crape Bandage, 5cm - 3m Roll
50 Cotton Crape Bandage, 7.5cm - 4.5m Roll
51 Dapsone Tablets BP 25 mg
52 Dapsone Tablets BP 50 mg
53 Deferasirox Tablets 100 mg
54 Deferasirox Tablets 400 mg
55 Dextran 40 Intravenous Infusion BP 10% w/v,500 ml
56 Diclofenac Sodium Suppositories 100 mg
57 Diclofenac Sodium Suppositories 12.5 mg
58 Diclofenac Sodium Suppositories 25 mg
59 Domperidone Suppositories 10 mg
60 Domperidone Suppositories 30 mg
61 Domperidone Suppositories 60 mg
62 Donepezil Hydrochloride Tablets USP 5 mg
63 Doxepin Capsules BP 50 mg
64 Eco Cleanse (1-500 Dialution) General Purpose Disinfectant Cleaner (Teepol)
65 Ferrous Fumarate + Folic Acid Tablets 182.4 mg
66 Ferrous Fumarate + Folic Acid Tablets 91.2 mg
67 Ferrous Sulphate Tablets 200 mg
68 Fluphenazine HCl USP 5 mg
69 Gabapentin Capsules USP 300 mg
70 Gabapentin Capsules USP 300 mg - Blister
71 Gastro resistant Aspirin Tablets BP 75 mg
72 Gastro Resistant Diclofenac Tablets BP 25 mg
| විදුලිය | - | 61,013,246 | 61,013,246 | 39,536,864 |
| රක්ෂණය - පොදු | 820,919 | 2,743,087 | 3,564,007 | 2,895,434 |
| ආරක්ෂක ගාස්තු - නිෂ්පාදන | 6,143,020 | - | 6,143,020 | 5,538,198 |
| උපකරණ නඩත්තුව | 2,478,888 | 1,744,445 | 4,223,333 | 3,498,017 |
| නිෂ්පාදන නඩත්තු කටයුතු | 19,626,676 | 4,679,688 | 24,306,364 | 15,490,347 |
| ගොඩනැගිලි නඩත්තු කටයුතු | 3,063,867 | 1,778,032 | 4,841,898 | 248,251 |
| ක්ෂය | 220,307,800 | - | 220,307,800 | 147,160,219 |
| ප්‍රවාහන ගාස්තු | 112,205 | - | 112,205 | 94,738 |
| අමතර කොටස් පරිභෝජනය | 8,670,692 | 62,147,591 | 70,818,283 | 44,662,176 |
| ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය පරිභෝජනය | 10,168,365 | 32,890,790 | 43,059,155 | 16,940,744 |
| යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව හා නඩත්තු | 3,187,724 | 8,752,677 | 11,940,400 | 3,776,568 |
| තත්ත්ව පාලන වියදම් | 15,565,386 | - | 15,565,386 | 4,770,799 |
| අමුද්‍රව්‍ය විනාශ කිරීමේ පිරිවැය | 1,126,441 | - | 1,126,441 | 563,710 |
| ප්‍රතික්ෂේපිත අමුද්‍රව්‍යවල පිරිවැය | 557,087 | - | 557,087 | 3,288,781 |
| ප්‍රතික්ෂේපිත ඇසුරුම් ද්‍රව්‍ය පිරිවැය | 2,490,335 | - | 2,490,335 | 553,203 |
| ප්‍රතික්ෂේපිත නොනිමි ද්‍රව්‍ය පිරිවැය | 685,859 | - | 685,859 | 429,077 |
| හානි වූ අමුද්‍රව්‍යවල පිරිවැය | - | - | - | (24,000) |
| අමුද්‍රව්‍ය ගැලපුම - සාමාන්‍ය ඖෂධ | (134,998) | - | (134,998) | 1,828,147 |
| අමුද්‍රව්‍ය ගැලපුම - පෙනිසිලින් ඖෂධ | (135,136) | - | (135,136) | 36,607 |
| අමුද්‍රව්‍ය ගැලපුම - තොග සත්‍යාපනය | (143,168) | - | (143,168) | (715,074) |
| ඇසුරුම් ද්‍රව්‍ය ගැලපුම - තොග සත්‍යාපනය | (654,013) | - | (654,013) | (366,369) |
| ඇසුරුම් ද්‍රව්‍ය ගැලපුම | (23,076) | - | (23,076) | - |
| තොග සත්‍යාපන ගැලපුම - නඩත්තු | 29,651 | - | 29,651 | (7,030) |
| අමතර කොටස් ගැලපුම | - | - | - | 11,860 |
| නොනිමි ද්‍රව්‍ය ගැලපුම - තොග සත්‍යාපනය | 319,681 | - | 319,681 | 54,406 |
| විකුණුම් පිරිවැය - ඉන්වොයිසි විචලනය | 14,092,400 | - | 14,092,400 | 767,774 |
| නිමි තොග ගැලපුම් - තොග සත්‍යාපනය | - | - | - | (60,334) |
| නිමි තොග ගැලපුම් - රාජ්‍ය ඖෂධ සංස්ථාව | - | - | - | (313,332) |
| | **498,769,631** | **410,275,485** | **894,952,716** | **643,305,956** |

**සටහන - 3**

| **වෙනත් මෙහෙයුම් ආදායම්** | 2022 වර්ෂය සඳහා | 2021 වර්ෂය සඳහා |
|---|---|---|
| විවිධ ආදායම් | 16,308,763 | 8,117,785 |
| අමුද්‍රව්‍ය විකුණුම් | 211,256 | 65,410 |
| ස්ථාවර වත්කම් විකිණීම මත ලාභ/අලාභ | - | 6,187,150 |
| | **16,520,020** | **14,370,345** |

සටහන - 4

| පරිපාලන වියදම් | 2022 වර්ෂය සඳහා | 2021 වර්ෂය සඳහා |
|---|---|---|
| වැටුප් හා වේතන | 46,957,564 | 46,030,731 |
| අනියම් සේවක වැටුප් | 477,994 | 1,047,114 |
| ජීවන වියදම් දීමනාව | 8,408,840 | 8,555,082 |
| ගමන් වියදම් දිරිදීමනා | 15,713,196 | 12,025,780 |
| සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් ගෙවීම් - 18% | 9,848,830 | 9,692,422 |
| අතිකාල | 15,575,387 | 13,594,567 |
| පැමිණීමේ දිරිදීමනාව | 7,303,228 | 8,939,216 |
| නිෂ්පාදන දිරිදීමනාව | 21,225,148 | 9,553,743 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 2,516,529 | 6,651,963 |
| ජංගම සේවා පිරිවැය | 4,412,708 | 2,153,500 |
| සේවක පොළී පිරිවැය | 4,067,499 | 3,251,640 |
| සේවාමුර දිරිදීමනාව | 432,300 | 298,700 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 736,669 | 657,347 |
| සේවක මණ්ඩල වෛද්‍ය වියදම් | 2,922,148 | 3,334,711 |
| නිවාස ණය පොළී ප්‍රතිපූරණය | 4,904,245 | 3,047,940 |
| වැඩ බැලීමේ දීමනා | 252,000 | 234,000 |
| දුෂ්කර සේවා දීමනාව | 522,945 | 476,535 |
| වෘත්තියවේදී ගාස්තු | 1,029,871 | 879,742 |
| විශේෂ වැඩ බැලීමේ දීමනාව | 365,443 | 488,538 |
| මාසික දීමනා | 5,490,841 | - |
| පාරිතෝෂික දීමනා | - | 192,000 |
| දුරකථන බිල්පත් ප්‍රතිපූරණය | 597,567 | 694,881 |
| සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය | 3,403,932 | 4,456,534 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 22,783,419 | 19,529,710 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 742,800 | 831,500 |
| නිල ඇඳුම් හා පාවහන් | 1,063,170 | 724,004 |
| ගමන් වියදම් - විදේශ | 15,000 | - |
| අධ්‍යක්ෂ ගාස්තු | 305,500 | 299,000 |
| වෙනත් දිරිදීමනා | 10,774,532 | 5,657,400 |
| වරිපනම් හා බදු | 303,854 | 308,644 |
| විදුලිය | 19,027,310 | 11,704,876 |
| ජල ගාස්තු | 1,366,879 | 988,938 |
| රක්ෂණය - පොදු | 956,139 | 730,072 |
| රක්ෂණය - වාහන | 249,957 | 316,540 |
| මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තුව | 7,880,374 | 4,993,401 |
| වාහන සඳහා ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය | 13,385,700 | 4,888,975 |
| උපකරණ නඩත්තුව | 1,307,042 | 1,422,715 |
| නඩත්තු පරිපාලන | 7,406,718 | 6,258,002 |
| ගොඩනැගිලි නඩත්තු කටයුතු | 136,340 | 648,247 |
| ක්ෂය | 42,158,503 | 21,122,853 |
| ප්‍රවාහන ගාස්තු | 813,173 | 669,746 |
| තැපැල් හා ෆැක්ස් ගාස්තු | 411,407 | 246,202 |
| දුරකථන ගාස්තු | 1,054,542 | 991,774 |
| ආරක්ෂක ගාස්තු | 1,887,036 | 1,901,424 |

| | | |
|---|---|---|
| පරිත්‍යාග | 1,250,248 | 956,703 |
| බලපත්‍ර ගාස්තු - මෝටර් වාහන | 115,509 | 138,844 |
| බලපත්‍ර ගාස්තු - ඖෂධ | 11,707,636 | 7,399,452 |
| බලපත්‍ර ගාස්තු - වෙනත් | 265,029 | 195,574 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 9,546,185 | 4,307,998 |
| කාර්යාල වියදම් | 1,768,996 | 390,323 |
| විගණන ගාස්තුව | 1,969,633 | 1,583,400 |
| කුලී ගාස්තු | 5,522,805 | 2,851,093 |
| ප්‍රචාරක දැන්වීම් | 4,872,885 | 4,132,505 |
| වෙළඳ දායකත්වයන් හා වාර සඟරා | 98,640 | 44,510 |
| නීති හා පරීක්ෂණ වියදම් | 333,350 | 331,500 |
| වෘත්තීයවේදී ගාස්තු | 2,111,939 | 377,594 |
| සංග්‍රහ වියදම් | 1,360,169 | 990,092 |
| වාර්ෂික දායකත්වයන් | 50,969 | 12,500 |
| වාර්ෂික සම්මේලන සහ රැස්වීම් | 11,000 | - |
| මුද්දර ගාස්තු | 61,500 | 49,425 |
| හානි වූ හා අභාවිත ද්‍රව්‍ය පිරිවැය | 433,204 | 8,891 |
| ලිපි ද්‍රව්‍ය ගැලපුම්- තොග සත්‍යාපනය | (553,094) | - |
| ලිපි ද්‍රව්‍ය ගැලපුම් | - | 10,459 |
| | **332,120,885** | **244,271,572** |

**සටහන - 05**

| **අලෙවි හා බෙදාහැරීම් වියදම්** | 2022 වර්ෂය සඳහා | 2021 වර්ෂය සඳහා |
|---|---|---|
| ප්‍රවර්ධන වට්ටම් | 152,704,493 | 91,339,097 |
| විකුණුම් ප්‍රවර්ධන වියදම් | 7,639,653 | 17,255,598 |
| ප්‍රතික්ෂේපිත නිමි ද්‍රව්‍ය පිරිවැය | - | 592,094 |
| අඩමාණ ණය | 312,417,918 | - |
| | **472,762,064** | **109,186,789** |

**සටහන - 06**

| **වෙනත් මෙහෙයුම් වියදම්** | 2022 වර්ෂය සඳහා | 2021 වර්ෂය සඳහා |
|---|---|---|
| සංයෝජන, පර්යේෂණ හා සංවර්ධන වියදම් | 18,989,321 | 10,416,099 |
| තොග ගණන් ගැනීමේ ගැලපුම් - පර්යේෂණ හා සංවර්ධන වියදම් | 51,230 | 62,015 |
| බැහැර කිරීමේ අලාභ | 374,963 | - |
| | **19,415,514** | **10,478,114** |

**සටහන - 07**

| **මූල්‍ය වියදම්** | 2022 වර්ෂය සඳහා | 2021 වර්ෂය සඳහා |
|---|---|---|
| බැංකු ගාස්තු | 281,104 | 256,003 |
| අයිරා පොළිය | 26,588 | 22,893 |
| විනිමය අලාභ | 18,600,316 | 8,241,160 |
| | **18,908,009** | **8,520,055** |

**සටහන - 08**

| **මූල්‍ය ආදායම** | 2022 වර්ෂය සඳහා | 2021 වර්ෂය සඳහා |
|---|---|---|
| කාර්ය මණ්ඩල ණය පොළිය | 2,047,143 | 1,926,160 |
| භාණ්ඩාගාර බිල්පත් පොළිය | 347,113,761 | 152,611,692 |
| පොළී ආදායම - කාර්යමණ්ඩල ණය | 2,598,479 | 2,254,275 |
| | **351,759,383** | **156,792,127** |

**සටහන - 09**

| **ආදායම් බදු වියදම** | | 2022 වර්ෂය සඳහා | 2021 වර්ෂය සඳහා |
|---|---|---|---|
| වත්මන් බදු වියදම | සටහන 09 'අ' | 417,855,650 | 179,112,522 |
| විලම්බිත බදු වියදම | සටහන 09 'ආ' (i) | 202,884,947 | 50,029,471 |
| | | **620,740,598** | **229,141,993** |

**සටහන - 09 (අ)**

| **වත්මන් බදු වියදම** | | 2022 වර්ෂය සඳහා | 2021 වර්ෂය සඳහා |
|---|---|---|---|
| වර්ෂයේ ලාභය මත බදු | සටහන 09 'අ' (i) | 417,855,650 | 179,112,522 |
| ආදායම් බදු අධි/ඌණ ප්‍රතිපාදනය | | - | - |
| | | **417,855,650** | **179,112,522** |

**සටහන - 09 (අ) (i)**

| **වර්ෂයේ ලාභය මත ආදායම් බද්ද** | | | 2022 | | | 2021 |
|---|---|---|---|---|---|---|
| බදු පෙර ලාභය | | | 1,586,213,049 | | | 1,235,327,457 |
| ඉඩදිය නොහැකි වියදම් | | | 605,849,206 | | | 187,331,358 |
| ඉඩදිය හැකි වියදම් | | | (505,210,315) | | | (484,646,964) |
| බදු නිදහස් ආදායම - භාණ්ඩාගාර බිල්පත් පොළිය | | | (347,113,761) | | | (152,611,692) |
| භාණ්ඩාගාර බිල්පත් පොළිය මත ආදායම් බදු සහ ස්ථාවර වත්කම් බැහැර කිරීම | | | 589,526 | | | 6,187,150 |
| බදු අය කළ හැකි ආදායම | | | 1,340,327,705 | | | 791,587,309 |
| මෙහෙයුම් ආදායම් මත බදු අනුපාතිකය - පළමු මාස 6 | | | 18% | | | 18% |
| මෙහෙයුම් ආදායම් මත බදු අනුපාතිකය - දෙවන මාස 6 | | | 30% | | | 18% |
| පොළී ආදායම් මත බදු අනුපාතිකය - පළමු මාස 6 | | | 24% | | | 24% |
| පොළී ආදායම් මත බදු අනුපාතිකය - දෙවන මාස 6 | | | 30% | | | 24% |
| මෙහෙයුම් ආදායම් මත බදු අනුපාතිකය - පළමු මාස 6 | - 18% | 120,629,493 | 120,629,493 | - 18% | 71,242,858 | 71,242,858 |
| මෙහෙයුම් ආදායම් මත බදු අනුපාතිකය - දෙවන මාස 6 | - 18% | 120,629,493 | | - 18% | 71,242,858 | 71,242,858 |
| බදු අනුපාතිකයේ වැඩි වීම | - 12% | 80,419,662 | 201,049,156 | | | |
| පොළී මත ආදායම් බද්ද - පළමු මාස 6 | - 24% | 31,828,510 | 31,828,510 | - 24% | 18,313,403 | 18,313,403 |
| පොළී මත ආදායම් බද්ද - දෙවන මාස 6 | - 24% | 51,478,791 | | - 24% | 18,313,403 | 18,313,403 |
| බදු අනුපාතිකයේ වැඩි වීම | - 6% | 12,869,698 | 64,348,491 | | | |
| මුළු ආදායම් බද්ද | | | **417,855,650** | | | **179,112,522** |

**සටහන - 09 (ආ)**
**විලම්බිත බදු**

| **වර්ෂයට අදාළ විලම්බිත බද්ද - හඳුනාගත් / (ලියාහල)** | | තාවකාලික වෙනස | 2022 | තාවකාලික වෙනස | 2021 |
|---|---|---|---|---|---|
| විලම්බිත බදු බැරකම මත විලම්බිත බදු | 9 'ආ' (vi) | 2,336,024,964 | 700,807,489 | 1,327,074,268 | 238,873,368 |
| විලම්බිත බදු වත්කම් මත විලම්බිත බදු | 9 'ආ' (vii) | (165,380,682) | (49,614,205) | (110,331,838) | (19,859,731) |
| වර්ෂය අවසානයේදී විලම්බිත බදු බැරකම | | | 651,193,285 | | 219,013,637 |
| වර්ෂය ආරම්භයේදී විලම්බිත බදු බැරකම | | | 219,013,637 | | 167,206,929 |
| **වර්ෂය තුළ හඳුනාගත් / (ලියාහල) විලම්බිත බදු** | | | **432,179,647** | | **51,806,708** |

**සටහන 09 'ආ' (i)**
**විලම්බිත බදු ගැලපුම**

| | | 2022 | 2021 |
|---|---|---|---|
| ආදායම් ප්‍රකාශයෙහි ලාභයට අදාළ බදු | 9 'ආ' (ii) | 202,884,947 | 50,029,471 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි ගැලපුමට අදාළ බදු | 9 'ආ' (iii) | 229,294,700 | 1,777,237 |
| | | **432,179,647** | **51,806,708** |

**සටහන - 9 ආ (ii)**
**විලම්බිත බදු ගැළපීම - ලාභාලාභ ගිණුමෙන් ගලපන ලද**

| | | | |
|---|---|---|---|
| ප්‍රවර්තන වර්ෂයට අදාල තාවකාලික වෙනස්වීම් මත විලම්බිත බදු වියදම / (ආදායම) | 9 ආ (iv) | 56,875,857 | 50,029,471 |
| බදු අනුපාතිකය ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ආරම්භක විලම්බිත බදු බැරකම් සඳහා ගැළපීම | 9 ආ (v) | 146,009,091 | - |
| | | **202,884,947** | **50,029,471** |

**සටහන - 9 ආ (iii)**
**විලම්බිත බදු ගැළපීම - වෙනත් විස්තීර්ණ ආදායම් ගිණුමින් ගලපන ලද**

| | | |
|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තයට අදාල කළ හැකි විලම්බිත බද්ද | 239,141,375 | - |
| සේවක ප්‍රතිලාභ වගකීම් සඳහා වූ ප්‍රතිපාදනයේ ආයු ගණක අලාභය මත බද්ද | (9,846,675) | 1,777,237 |
| | 229,294,700 | 1,777,237 |
| මුළු විලම්බිත බදු ගැළපීම | **432,179,647** | **51,806,708** |

**සටහන - 9 ආ (iv)**
**තාවකාලික වෙනස්කම්වල මූලාරම්භයට සහ ප්‍රත්‍යාවර්තනයට අදාළ විලම්බිත බදු වියදම / (ආදායම)**

| | | |
|---|---|---|
| වර්ෂය සඳහා මුළු ශුද්ධ විලම්බිත බද්ද | 651,193,285 | 219,013,637 |
| (-) ආරම්භක විලම්බිත බදු බැරකම් | (219,013,637) | (167,206,929) |
| බදු අනුපාතිකය ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ආරම්භක විලම්බිත බදු බැරකම් සඳහා ගැළපීම (රු. 1,216,742,429 X 12 %) | (146,009,091) | - |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තයට අදාල විලම්බිත බද්ද (රු. 797,137,916 X 30 %) | (239,141,375) | - |
| සේවක ප්‍රතිලාභ වගකීම් සඳහා වූ ප්‍රතිපාදනයේ ආයු ගණක අලාභය මත බද්ද (රු. 32,822,249 X 30%) | 9,846,675 | (1,777,237) |
| | **56,875,857** | **50,029,471** |

**සටහන - 9 ආ (v)**
**බදු අනුපාතිකය ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ආරම්භක විලම්බිත බදු බැරකම් සඳහා ගැළපීම**

| | | |
|---|---|---|
| 2022.1.1 වන දිනට ශුද්ධ තාවකාලික වෙනස | 1,216,742,430 | - |
| **ආරම්භක විලම්බිත බදු බැරකම් සඳහා ගැළපීම** | **146,009,091** | - |

**සටහන -9 ආ (vi)**
**විලම්බිත බදු බැරකම්**

| තාවකාලික වෙනස්කම් වර්ග | තාවකාලික වෙනස්කම | බදු බලපෑම 30% | තාවකාලික වෙනස්කම | බදු බලපෑම 18% |
|---|---|---|---|---|
| බදු කාර්යයන් සඳහා දේපළ, පිරියත හා උපකරණවල කඩිනම් ක්ෂයවීම | 2,336,024,964 | 700,807,489 | 1,327,074,268 | 238,873,368 |
| ශුද්ධ විලම්බිත බදු බැරකම | | **700,807,489** | | **238,873,368** |

**සටහන - 9 ආ (vii)**
**විලම්බිත බදු වත්කම්**

| තාවකාලික වෙනස්කම් වර්ග | තාවකාලික වෙනස්කම | බදු බලපෑම 30% | තාවකාලික වෙනස්කම | බදු බලපෑම 18% |
|---|---|---|---|---|
| ගෙවන විට පමණක් බදු කාර්යයන් සඳහා අඩු කරනු ලබන සේවක ප්‍රතිලාභ බැරකම් | (165,380,682) | (49,614,205) | (110,331,838) | (19,859,731) |
| ශුද්ධ විලම්බිත බදු වත්කම | | **(49,614,205)** | | **(19,859,731)** |

**10 සටහන**
**දේපළ, පිරියත හා උපකරණ - ක්ෂය වන වත්කම්**

**පිරිවැය** **2022**

| විස්තරය | 2022.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ විකුණුම් | 2022.12.31 දිනට ශේෂය | හානි වූ හා අභාවිත ගැලපුම් (සටහන 12 ) | හානි වූ හා අභාවිත ගැලපූ පසු 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | | |
| භූමි අලංකරණ වියදම් | 6,113,388 | - | - | 6,113,388 | - | 6,113,388 |
| ඉඩම් | 49,471,918 | - | - | 49,471,918 | - | 49,471,918 |
| ගොඩනැගිලි | 1,152,699,301 | 8,128,843 | - | 1,160,828,145 | - | 1,160,828,145 |
| පිරියත හා යන්ත්‍ර | 2,310,312,770 | 69,349,248 | - | 2,379,662,018 | (724,250) | 2,378,937,768 |
| මෝටර් වාහන | 63,450,000 | - | - | 63,450,000 | - | 63,450,000 |
| යතුරුපැදි | 185,000 | - | - | 185,000 | - | 185,000 |
| උපකරණ | 144,884,106 | 51,267,922 | (103,939) | 196,048,089 | (388,117) | 195,659,972 |
| පරිගණක උපාංග | 16,214,448 | 7,898,343 | (889,890) | 23,222,901 | (14,600) | 23,208,301 |
| ලී බඩු හා සවිකිරීම් | 23,669,278 | 3,130,972 | (11,500) | 26,788,750 | (67,381) | 26,721,369 |
| පාපැදි හා කරත්ත | 2,312,944 | 1,051,588 | - | 3,364,532 | - | 3,364,532 |
| මෙවලම් | 3,459,950 | - | (1,125) | 3,458,825 | (6,750) | 3,452,075 |
| වාහන නවත්වන ගොඩනැගිලි | 3,200,000 | - | - | 3,200,000 | - | 3,200,000 |
| එකතුව | **3,775,973,104** | **140,826,916** | **(1,006,454)** | **3,915,793,566** | **(1,201,098)** | **3,914,592,468** |

**ක්ෂය**

| විස්තරය | 2022.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | විකුණුම් වලට අදාල සමුච්චිත ක්ෂය | හානි වූ හා අභාවිත ගැලපුම් | 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | |
| භූමි අලංකරණ වියදම් | 2,162,166 | 60,788 | | - | 2,222,954 |
| ඉඩම් | - | - | - | - | - |
| ගොඩනැගිලි | - | 57,873,263 | - | - | 57,873,263 |
| පිරියත හා යන්ත්‍ර | - | 150,180,554 | - | (76,597) | 150,103,957 |
| මෝටර් වාහන | - | 12,051,310 | - | - | 12,051,310 |
| යතුරුපැදි | - | 26,429 | - | - | 26,429 |
| උපකරණ | - | 26,029,752 | (64,092) | (120,050) | 25,845,610 |
| පරිගණක උපාංග | - | 6,241,091 | (217,723) | (11,850) | 6,011,517 |
| ලී බඩු හා සවිකිරීම් | - | 2,913,195 | (4,857) | (2,906) | 2,905,431 |
| පාපැදි හා කරත්ත | - | 284,556 | - | - | 284,556 |
| මෙවලම් | - | 602,756 | (720) | (2,292) | 599,744 |
| වාහන නවත්වන ගොඩනැගිලි | - | 266,667 | - | - | 266,667 |
| එකතුව | **2,162,166** | **256,530,359** | **(287,393)** | **(213,695)** | **258,191,437** |

**ලියාහල අගය**

| විස්තරය | 2022.12.31 දිනට ශේෂය |
|---|---|
| ක්ෂය වන වත්කම් | |
| භූමි අලංකරණ වියදම් | 3,890,434 |
| ඉඩම් | 49,471,918 |
| ගොඩනැගිලි | 1,102,954,882 |
| පිරියත හා යන්ත්‍ර | 2,228,833,811 |
| මෝටර් වාහන | 51,398,690 |
| යතුරුපැදි | 158,571 |
| උපකරණ | 169,814,362 |
| පරිගණක උපාංග | 17,196,784 |
| ලී බඩු හා සවිකිරීම් | 23,815,937 |
| පාපැදි හා කරත්ත | 3,079,977 |
| මෙවලම් | 2,852,330 |
| වාහන නවත්වන ගොඩනැගිලි | 2,933,333 |
| එකතුව | **3,656,401,031** |

**10 සටහන**

**දේපළ, පිරියත හා උපකරණ - ක්ෂය වන වත්කම්**

**පිරිවැය** **2021**

| විස්තරය | 2021.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ විකුණුම් | 2021.12.31 දිනට ශේෂය | හානි වූ හා අභාවිත ගැලපුම් (සටහන 12 ) | හානි වූ හා අභාවිත ගැලපූ පසු 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | | |
| භූමි අලංකරණ වියදම් | 6,113,388 | - | - | 6,113,388 | - | 6,113,388 |
| ඉඩම් | 49,471,918 | - | - | 49,471,918 | - | 49,471,918 |
| ගොඩනැගිලි | 1,318,525,639 | 1,436,083 | - | 1,319,961,722 | - | 1,319,961,722 |
| පිරියත හා යන්ත්‍ර | 2,820,556,974 | 3,164,469 | (26,807,531) | 2,796,913,912 | (459,150) | 2,796,454,762 |
| මෝටර් වාහන | 89,021,800 | - | (12,565,000) | 76,456,800 | - | 76,456,800 |
| යතුරුපැදි | 298,640 | (0) | - | 298,640 | - | 298,640 |
| උපකරණ | 197,266,595 | 11,968,193 | (18,950,628) | 190,284,160 | (170,968) | 190,113,192 |
| පරිගණක උපාංග | 24,215,273 | 3,605,580 | (155,900) | 27,664,953 | - | 27,664,953 |
| ලී බඩු හා සවිකිරීම් | 34,702,113 | 1,296,758 | (336,364) | 35,662,507 | (50,632) | 35,611,875 |
| පාපැදි හා කරත්ත | 2,999,367 | 259,200 | - | 3,258,567 | - | 3,258,567 |
| මෙවලම් | 7,708,771 | 2 | (1,474,175) | 6,234,598 | (3,600) | 6,230,998 |
| වාහන නවත්වන ගොඩනැගිලි | 1,635,513 | 529,042 | - | 2,164,555 | - | 2,164,555 |
| එකතුව | **4,552,515,991** | **22,259,328** | **(60,289,598)** | **4,514,485,721** | **(684,350)** | **4,513,801,371** |

**ක්ෂය**

| විස්තරය | 2021.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | විකුණුම් වලට අදාල සමුච්චිත ක්ෂය | හානි වූ හා අභාවිත ගැලපුම් | 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | |
| භූමි අලංකරණ වියදම් | 2,101,378 | 60,788 | | - | 2,162,166 |
| ඉඩම් | - | - | - | - | - |
| ගොඩනැගිලි | 345,864,762 | 38,613,409 | - | - | 384,478,171 |
| පිරියත හා යන්ත්‍ර | 794,280,757 | 111,080,253 | - | (459,150) | 904,901,861 |
| මෝටර් වාහන | 68,132,386 | 4,912,788 | (12,565,000) | - | 60,480,174 |
| යතුරුපැදි | 281,973 | 3,333 | - | - | 285,306 |
| උපකරණ | 126,505,871 | 6,205,648 | - | (166,711) | 132,544,808 |
| පරිගණක උපාංග | 16,162,474 | 3,409,946 | - | - | 19,572,420 |
| ලී බඩු හා සවිකිරීම් | 24,278,364 | 1,953,530 | - | (45,998) | 26,185,895 |
| පාපැදි හා කරත්ත | 1,211,530 | 617,047 | - | - | 1,828,577 |
| මෙවලම් | 5,897,853 | 162,942 | - | (3,600) | 6,057,195 |
| වාහන නවත්වන ගොඩනැගිලි | 1,171,499 | 119,420 | - | - | 1,290,918 |
| එකතුව | **1,385,888,846** | **167,139,104** | **(12,565,000)** | - **(675,459)** | **1,539,787,491** |

**ලියාහල අගය**

| විස්තරය | 2021.12.31 දිනට ශේෂය |
|---|---|
| ක්ෂය වන වත්කම් | |
| භූමි අලංකරණ වියදම් | 3,951,222 |
| ඉඩම් | 49,471,918 |
| ගොඩනැගිලි | 935,483,552 |
| පිරියත හා යන්ත්‍ර | 1,891,552,901 |
| මෝටර් වාහන | 15,976,626 |
| යතුරුපැදි | 13,333 |
| උපකරණ | 57,568,384 |
| පරිගණක උපාංග | 8,092,533 |
| ලී බඩු හා සවිකිරීම් | 9,425,981 |
| පාපැදි හා කරත්ත | 1,429,990 |
| මෙවලම් | 173,803 |
| වාහන නවත්වන ගොඩනැගිලි | 873,637 |
| එකතුව | **2,974,013,881** |

11 සටහන

අස්පෘශ්‍ය වත්කම්

පිරිවැය 2022

| විස්තරය | 2022.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2022.12.31 දිනට ශේෂය | හානි වූ හා අභාවිත ගැලපුම් (සටහන 12) | හානි වූ හා අභාවිත ගැලපූ පසු 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 7,913,796 | 1,214,161 | (192,115) | 8,935,842 | - | 8,935,842 |
| එකතුව | **7,913,796** | **1,214,161** | **(192,115)** | **8,935,842** | - | **8,935,842** |

ක්ෂය

| විස්තරය | 2022.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | විකිණීමට අදාල සමුච්චිත ක්ෂය | හානි වූ හා අභාවිත ගැලපුම් | 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | - | 2,728,466 | (51,087) | - | 2,677,379 |
| එකතුව | - | **2,728,466** | **(51,087)** | - | **2,677,379** |

ලියාහල අගය

| විස්තරය | 2022.12.31 දිනට ශේෂය |
|---|---|
| පරිගණක මෘදුකාංග | 6,258,464 |
| එකතුව | **6,258,464** |

12 සටහන

හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය ගැලපුම් 2022

| විස්තරය | 2022.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ හඳුනාගත් හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය | 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| පිරියත හා යන්ත්‍ර | 330,500 | 393,750 | 724,250 |
| උපකරණ | 170,968 | 217,149 | 388,117 |
| පරිගණක උපාංග | - | 14,600 | 14,600 |
| ලී බඩු හා සවිකිරීම් | 50,632 | 16,750 | 67,381 |
| මෙවලම් | 2,100 | 4,650 | 6,750 |
| එකතුව | **554,200** | **646,899** | **1,201,098** |

13 සටහන

පෙර ගෙවූ කල් බදු

පිරිවැය 2022

| විස්තරය | 2022.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2022.12.31 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| බදු ඉඩම් | 4,920,845 | 322,406,798 | - | 327,327,643 |
| එකතුව | **4,920,845** | **322,406,798** | - | **327,327,643** |

ක්ෂය

| විස්තරය | | 2022.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | බැහැර කිරීම් සඳහා සමුච්චිත ක්ෂය | 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| බදු ඉඩම් | | 1,736,579 | 3,207,478 | - | 4,944,057 |
| එකතුව | | **1,736,579** | **3,207,478** | - | **4,944,057** |

ලියාහල අගය

| විස්තරය | 2022.12.31 දිනට ශේෂය |
|---|---|
| බදු ඉඩම් | 322,383,586 |
| එකතුව | **322,383,586** |

වසර 99 ක ඉඩම් බද්ද

නාගරික සංවර්ධන අධිකාරියෙන් වසර 99ක බද්දට ඉඩම ලබාගෙන තිබුණි. මුළු බදු වටිනාකම කල්බදු කාල සීමාව ආරම්භයේදී ගෙවා ඇත. සරල රේඛීය ක්‍රමය මත පදනම්ව මෙම බදු වටිනාකම ගිණුම්ගත කර ඇත.

11 සටහන

අස්පෘශ්‍ය වත්කම්

පිරිවැය 2021

| විස්තරය | 2022.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2022.12.31 දිනට ශේෂය | හානි වූ හා අභාවිත ගැලපුම් (සටහන 12) | හානි වූ හා අභාවිත ගැලපූ පසු 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 21,862,805 | 824,100 | - | 22,686,905 | - | 22,686,905 |
| එකතුව | **21,862,805** | **824,100** | - | **22,686,905** | - | **22,686,905** |

ක්ෂය

| විස්තරය | 2021.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | විකිණීමට අදාල සමුච්චිත ක්ෂය | හානි වූ හා අභාවිත ගැලපුම් | 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 19,292,498 | 1,094,980 | - | - | 20,387,477 |
| එකතුව | **19,292,498** | **1,094,980** | - | - | **20,387,477** |

**ලියාහල අගය**

| විස්තරය | 2022.12.31 දිනට ශේෂය |
|---|---|
| පරිගණක මෘදුකාංග | 2,299,428 |
| එකතුව | **2,299,428** |

12 සටහන

හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය ගැලපුම් 2021

| විස්තරය | 2021.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ හඳුනාගත් හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය | වර්ෂය තුළ බැහැර කිරීම් | වර්ෂය තුළ නැවත භාවිත කිරීම් | 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| පිරියත හා යන්ත්‍ර | 29,962,681 | 459,150 | (26,807,531) | (2,924,148) | 690,152 |
| උපකරණ | 27,133,205 | 170,968 | (18,950,628) | (8,413,577) | (60,032) |
| පරිගණක උපාංග | 195,380 | - | (155,900) | (39,480) | - |
| ලී බඩු හා සවිකිරීම් | 493,748 | 50,632 | (336,364) | (157,384) | 50,632 |
| මෙවලම් | 1,474,373 | 3,600 | (1,474,175) | (200) | 3,598 |
| එකතුව | **59,259,387** | **684,350** | **(47,724,599)** | **(11,534,789)** | **684,350** |

13 සටහන

පෙර ගෙවූ කල් බදු

පිරිවැය 2021

| විස්තරය | 2021.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2021.12.31 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| බදු ඉඩම් | 4,920,845 | - | - | 4,920,845 |
| එකතුව | **4,920,845** | - | - | **4,920,845** |

ක්ෂය

| විස්තරය | 2021.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | බැහැර කිරීම් සඳහා සමුච්චිත ක්ෂය | 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| බදු ඉඩම් | 1,687,591 | 48,989 | - | 1,736,579 |
| එකතුව | **1,687,591** | **48,989** | - | **1,736,579** |

ලියාහල අගය

| විස්තරය | 2021.12.31 දිනට ශේෂය |
|---|---|
| බදු ඉඩම් | 3,184,266 |
| එකතුව | **3,184,266** |

සටහන - 14

| **වෙනත් ජංගම නොවන වත්කම්** | 31.12.2022 දිනට | 31.12.2021 දිනට |
|---|---|---|
| තැන්පතු | 970,000 | 970,000 |
| ආරක්ෂක තැන්පතු | 391,876 | 361,299 |
| | **1,361,876** | **1,331,299** |

සටහන - 15

| **තොග** | 31.12.2022 දිනට | 31.12.2021 දිනට |
|---|---|---|
| අමුද්‍රව්‍ය | 1,541,108,443 | 880,226,447 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 210,011,927 | 84,632,732 |
| නිමි භාණ්ඩ | 140,154,066 | 304,972,919 |
| නොනිමි වැඩ | 316,824,341 | 162,768,911 |
| මාර්ගස්ථ තොග - අමුද්‍රව්‍ය | 581,726,959 | 13,708,270 |
| තොග - සංයෝජන, පර්යේෂණ හා සංවර්ධන | 27,143,834 | 8,385,167 |
| පිරියත හා යන්ත්‍ර අමතර කොටස් | 192,524,751 | 166,369,532 |
| ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය | 4,515,967 | 952,692 |
| ලිපිද්‍රව්‍ය තොග | 4,025,183 | 2,009,774 |
| තොග පාලනය - ණය දීමනා | 39,081 | - |
| | **3,018,074,553** | **1,624,026,442** |

සටහන - 16

| **වෙළඳ ණයගැතියෝ සහ අයවිය යුතු දේ** | | 31.12.2022 දිනට | 31.12.2021 දිනට |
|---|---|---|---|
| ණයගැතියෝ - රාජ්‍ය ඖෂධ සංස්ථාව | | 5,373,799 | 18,555,750 |
| ණයගැතියෝ - වෛද්‍යය සැපයුම් අංශය | 2,345,024,254 | | 205,312,012 |
| (-) අඩමාණ ණය සඳහා වෙන් කිරීම | (312,417,918) | 2,032,606,336 | - |
| ණයගැතියෝ - බෙදාහැරීම් | | 226,920,453 | 221,600,173 |
| ආපදා ණය | | 54,934,168 | 58,205,185 |
| අයවිය යුතු දේ | | 99,745,646 | 471,780 |
| පාපැදි ණය | | 9,950,138 | 1,849,582 |
| සේවක ණය | | - | 176,500 |
| උත්සව අත්තිකාරම් | | 531,000 | 547,000 |
| ආනයන තැන්පතු ආපසු ලැබීම් | | 1,048,000 | 918,500 |
| | | **2,431,109,540** | **507,636,481** |

සටහන - 17

| **පූර්ව ගෙවීම්** | 31.12.2022 දිනට | 31.12.2021 දිනට |
|---|---|---|
| අත්තිකාරම් ගෙවීම් | 19,690,504 | 2,399,007 |
| අත්තිකාරම් ගෙවීම් - යන්ත්‍ර සූත්‍ර සහ අමතර කොටස් | 22,280,685 | 14,145,065 |
| පූර්ව ගෙවීම් | 7,713,580 | 7,800,171 |
| කාර්යමණ්ඩලයට කළ පූර්ව ගෙවීම්වල පිරිවැය | 11,892,551 | 6,297,946 |
| | **61,577,319** | **30,642,190** |

සටහන - 18

| වෙනත් මූල්‍ය වත්කම් | 31.12.2022 දිනට | 31.12.2021 දිනට |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 4,241,085,643 | 3,316,722,413 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් | 157,014,115 | 135,785,831 |
| | **4,398,099,758** | **3,452,508,244** |

**භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය**

REPO වර්ගීකරණය කර ඇත්තේ ක්ෂය කරන පිරිවැයට මනිනු ලබන ජංගම වත්කම් ලෙසය. ණය අවදානමට නිරාවරණය වීම සීමා කිරීම සඳහා සංස්ථාව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව රජයේ බැංකු (ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව) සමඟ පමණක් REPO පවත්වාගෙන යනු ලබයි.

සටහන - 19

| අත ඇති හා බැංකුවේ ඇති මුදල් | 31.12.2022 දිනට | 31.12.2021 දිනට |
|---|---|---|
| ලංකා බැංකුව - රත්මලාන ශාඛාව | 18,550 | 44,313 |
| ලංකා බැංකුව - ආයතනික ශාඛාව | 1,049,142 | 1,512,315 |
| මහජන බැංකුව - රත්මලාන ශාඛාව | 136,590 | 136,590 |
| මහජන බැංකුව - ආයතනික ශාඛාව | 174,433 | 7,559 |
| අතැති මුදල් | 37,550 | 46,671 |
| සුළු මුදල් | 19,750 | 20,000 |
| | **1,436,015** | **1,767,448** |

සටහන - 20

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**

ප්‍රකාශිත ප්‍රාග්ධනය සෑදී ඇත්තේ රුපියල් 476,904,000.00 ක් වටිනා රුපියල් 0.186 බැගින් පරිවර්තනය කරන ලද ජපන් යෙන් මිලියන 2,564 ක ප්‍රදානයකින්, මහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් රුපියල් 208,375,000.00 ක මුදලකින් සහ රාජ්‍ය ඖෂධ සංස්ථාව විසින් පවරන ලද ඉඩම්වල වටිනාකම වූ රුපියල් 4,800,000.00 කින්ය.

සටහන - 21

| විලම්බිත බදු බැරකම | 31.12.2022 දිනට | 31.12.2021 දිනට |
|---|---|---|
| වර්ෂයේ ආරම්භක ශේෂය | 219,013,636 | 167,206,928 |
| වර්ෂය තුල විලම්බිත බදු බැරකම - හඳුනාගත්/(ලියාහල) අගය | 432,179,647 | 51,806,708 |
| | **651,193,284** | **219,013,636** |

සටහන - 22

**JICA ණය - රාජ්‍ය ප්‍රාග්ධන ආයෝජන.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිත ආයතනය (JICA) අතර මූලික සමාජ සේවා ඉලක්ක මතු වන ප්‍රදේශ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (28.03.2012 දින ණය අංක SLP - 105) යටතේ 2018 වර්ෂයේ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත ජපන් යෙන් 1,239,888,000 (රු.2,416,094,044) ලැබුණි. මෙම JICA ණය දැනටමත් ශ්‍රී ලංකා රජය ගත් ණයක් ලෙස ඇතුලත් කොට ඇත. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත ලැබුනු මෙම JICA ණය මුදලෙහි කොටස, උපකරණ, සැලසුම් සේවා, ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සහ ඉදිකිරීම් , ස්ථානය සහ අනෙකුත් සේවාවන් සඳහා ලැබී අතර එය පහත පරිදි වේ.

| | JPY |
|---|---|
| පිරියත හා උපකරණ | 910,075,230 |
| සැලසුම් සේවා | 3,216,529 |
| ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සහ ඉදිකිරීම් | 312,850,251 |
| සවිකිරීම් සහ අනෙකුත් සේවාවන් | 13,745,990 |
| **එකතුව** | **1,239,888,000** |

මෙම ණය මුදල 2023 ජුනි මාසයෙන් පසුව රජයේ ප්‍රාග්ධන ආයෝජනයක් ලෙස සලකනු ලබන බව 2023 ජුනි 26 දිනැති PED/S/SPMC/04/13 ලිපිය මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සංස්ථාවේ සභාපතිතුමා වෙත දන්වා එවා ඇත. එම නිසා වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල මෙම JICA ණය මුදල, රජයේ ප්‍රාග්ධන ආයෝජනයක් ලෙස ස්කන්ධ ප්‍රාග්ධනය තුළ ඇතුළත් කිරීමට බලාපොරොත්තු වේ.

සටහන - 23

| වෙළඳ ණයහිමියෝ හා අනෙකුත් ගෙවීම් | 31.12.2022 දිනට | 31.12.2021 දිනට |
|---|---|---|
| ණයහිමි පාලනය - ඇසුරුම් ද්‍රව්‍ය | 45,766,600 | 20,118,666 |
| ණයහිමි පාලනය - අමුද්‍රව්‍ය | 7,463,690 | 46,555,917 |
| ණයහිමි පාලනය - ලිපිද්‍රව්‍ය | 623,978 | 9,364,460 |
| ණයහිමි පාලනය - උපකරණ හා යන්ත්‍රසූත්‍ර | 2,579,215 | 6,245,070 |
| ණයහිමි පාලනය - රසායනික ද්‍රව්‍ය | - | 105,448 |
| ණයහිමි පාලනය - සුභසාධනය | 1,855,033 | - |
| ණයහිමි පාලනය - පොදු | 408,482,568 | 90,487,573 |
| ණයහිමි පාලනය - බැංකු | 60,050,797 | 37,923,364 |
| ණයහිමි පාලනය - සේවක | 4,525,824 | 4,352,764 |
| ණයහිමි පාලනය - සේවා | 9,684,956 | 5,337,245 |
| ණයහිමි පාලනය - අනෙකුත් ස්ථාවර වත්කම් | - | 25,693 |
| ණයහිමි පාලනය - බද්ධ ව්‍යාපාර | 3,254,473,281 | 321,901,913 |
| තැම්පත්කරුවන් වෙත ගෙවිය යුතු - අයකැමියෝ | 10,882 | 15,917 |
| තැම්පත්කරුවන් වෙත ගෙවිය යුතු - ගබඩා සහකාරවරු | 380,994 | 345,382 |
| ගෙවිය යුතු ටෙන්ඩර් බැඳුම්කර | 31,970,121 | 13,437,054 |
| තොග පාලනය -ණය ගැනීම් | 7,652,650 | - |
| | **3,835,520,589** | **556,216,467** |

සටහන - 24

| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම | 31.12.2022 දිනට | 31.12.2021 දිනට |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව වාර්තාවෙහි හඳුනා ගනු ලැබූ මුදල් ප්‍රමාණයන් පහත පරිදි වේ. | | |
| වර්ෂය මුලදී ශුද්ධ බැරකම් | 110,331,839 | 106,799,808 |
| ජංගම සේවා පිරිවැය | 7,050,961 | 6,447,492 |
| පොළී පිරිවැය | 12,688,161 | 9,611,983 |
| අතීත සේවා පිරිවැය | 6,589,058 | - |
| ආයුගණක ලාභ / අලාභ | 32,822,249 | (9,873,539) |
| | **169,482,268** | **112,985,744** |
| **අඩු කළා :** | | |
| වර්ෂය තුළ කරන ලද ගෙවීම් | (4,101,585) | (2,653,905) |
| | **165,380,683** | **110,331,839** |

සංස්ථාවේ විශ්‍රාම ප්‍රතිලාභ බැරකම "ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් පුද්ගලික සමාගම" විසින් කරන ලද ආයුගණක තක්සේරුව මත පදනම්ව ඇත. විශ්‍රාම ප්‍රතිලාභයේ පිරිවැය නිර්ණය කිරීමෙහිලා භාවිතා කරන ලද ප්‍රධාන අනුමානයන් වූයේ,

| | | |
|---|---|---|
| අපේක්ෂිත අනාගත වැටුප් වැඩි වීම | 15.00% | 6.00% |
| වට්ටම් අනුපාතිකය | 18.00% | 11.50% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය | 1.50% | 1.50% |

**ආදායම් ප්‍රකාශ තුළ හඳුනා ගෙන ඇති මුදල් ප්‍රමාණයන් පහත පරිදි වේ**

| | | |
|---|---|---|
| ජංගම සේවා පිරිවැය | 13,640,019 | 6,447,492 |
| පොළී පිරිවැය | 12,688,161 | 9,611,983 |

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයේ වත්මන් වටිනාකම නිවැරදි ලෙස තක්සේරු කිරීම පිණිස ආයුගණක තක්සේරුවක් සිදු කෙරුණි.

**සටහන - 25**
**ආශ්‍රිත පාර්ශව අනාවරණයන්**
සැලකිය යුතු ආශ්‍රිත පාර්ශව අනාවරණයන්හි විස්තර පහත පරිදි වේ

| සංවිධානය | | සබඳතාවය | ගනුදෙනුවේ ස්වභාවය | වර්ෂය තුළ විකිණීම් |
|---|---|---|---|---|
| වෛද්‍ය සැපයුම් අංශය | | ගනුදෙනුකරු | භාණ්ඩ විකිණීම | 13,927,795,651 |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | - බෙදාහරින්නන් හරහා | ගනුදෙනුකරු | භාණ්ඩ විකිණීම | 21,141,690 |
| | - ටෙන්ඩරපත් හරහා | ගනුදෙනුකරු | භාණ්ඩ විකිණීම | 108,406,125 |
| බෙදාහරින්නන් | | | | 2,583,982,882 |
| **එකතුව** | | | | **16,620,184,659** |

**සටහන - 26**
**ප්‍රත්‍යාගණන සංචිතය**
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් කාර්මික සංවර්ධන මණ්ඩලයේ ස්වාධීන තක්සේරුකරුවකු විසින් 2021.12.31 වන දිනට බලාත්මකවන වන පරිදි ප්‍රත්‍යාගණනය කර ඇත.

| | රු. |
|---|---|
| මුළු දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තය | 797,137,916 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය මත විලම්බිත බද්ද | (239,141,375) |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා ඇති ශුද්ධ ප්‍රත්‍යාගණන අතිරික්තය | **557,996,541** |

**ප්‍රත්‍යාගණනයෙහිදී සලකා බලන සාධක**
ජාත්‍යන්තර තක්සේරු ප්‍රමිතිවල (IVS) දක්වා ඇති මාර්ගෝපදේශ සහ පහත සඳහන් සාධක සැලකිල්ලට ගනිමින් මෙම තක්සේරුව සිදු කරන ලදී.

1. දේශීය සහ ජාත්‍යන්තර නියෝජිතයන්ගෙන් ලද එක හා සමාන යන්ත්‍රවල හෝ අයිතමවල වෙළඳපළ වටිනාකම.
2. වත්කම්වල තාක්ෂණික පිරිවිතර.
3. ඉතිරි භෞතික ආයු කාලය.
4. නඩත්තු ඉතිහාසය ඇතුළු වත්කම්වල තත්ත්වය.
5. පිරියත හා උපකරණ ක්‍රියාත්මක වන පාරිසරික තත්ත්වයන්.
6. ඵලදායී කළමනාකරණ පද්ධති තිබීම.
7. පිරියත හා උපකරණවල මෙම තක්සේරුව නව ප්‍රතිස්ථාපන ක්‍රමය මත පදනම්ව සිදු කරන ලද අතර හැකි සෑම විටම සංසන්දනාත්මක ක්‍රමය (ඓතිහාසික වෙළඳපළ ගනුදෙනු විශ්ලේෂණය කිරීම) සහිතව අගයන් නැවත පරීක්ෂා කරන ලදී.
8. මෙම තොරතුරු ලබා දී ඇති ලිපි ලේඛන, තොරතුරු, නිරීක්ෂණ රාජකාරි හා දේශියව ලබා ගත් තොරතුරු මත පදනම් වූ අතර තුන්වන පාර්ශවයේ පොලී, මුදල්, අලාභ, ද්‍රවශීලතා හානිය සලකා බලා නැත.
9. රාජ්‍ය ප්‍රතිපත්ති, ජාත්‍යන්තර මුදල් අනුපාත, ස්වභාවික විපත් සහ වෙළඳපළ බලවේග තක්සේරුව කෙරෙහි බලපානු ඇත.
10. මෙම වාර්තාවේ භාවිතය තක්සේරු කිරීමේ අරමුණ වන අතර වෙනත් කාර්යයන් සඳහා භාවිතා කරන්නේ නම් සේවාදායකයා පිරිවැය දැරිය යුතු අතර එය ඔහුගේ වගකීමකි.
11. ඉහත තක්සේරුව, වැට් බද්ද අදාළ නම් එය හැර මූලික මිල සඳහා පමණි.

# විගණකාධිපති වර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

එම්එස්යූ/සි/ එස්පීඑම්සී/1/22/28 2023 ජූලි 11 දින

සභාපති,

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති රීති විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 6 (2) (අ) වගන්තිය | සේවකයා සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂය සඳහා මාස භාගයක වැටුප හෝ වේතනය මත පදනම්ව සේවක පාරිතෝෂික වෙන් කිරීම් සිදු කළ යුතු වුවද, ඒ වෙනුවට සේවකයාගේ සම්පූර්ණ මාසයක වැටුප පදනම් කර ගෙන සේවක පාරිතෝෂික වෙන් කිරීම් සිදු කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාම ගොස් තිබුණු නිලධාරීන් 05 දෙනෙකු වෙත පාරිතෝෂික දීමනා ලෙස රු.2,050,793 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |
| (ආ) | 1997 පෙබරවාරි 03 දිනැති අංක 6/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වන ඡේදය | වැඩ බැලීමේ කාලය මාස 3 ක උපරිමයකට යටත් විය යුතු වුවද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වට්ටෝරු හා පර්යේෂණ තනතුර සඳහා අඛණ්ඩව වර්ෂ 05 කට අධික කාලයක් වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි. |
| (ඇ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | එක් නිලධාරියෙකුට ගෙවිය හැකි උපරිම ආපදා ණය මුදල රු.250,000 කට සීමා කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 49 දෙනෙකු වෙත එම සීමාව ඉක්මවා රු.4,677,100 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයෙහි මුදල් රෙගුලාසි 388 | තැපෑලෙන් යවනු ලබන සියළුම චෙක්පත් පිළිබඳ විස්තර අඩංගු ලේඛණයක් පවත්වාගෙන යා යුතු වුවත්,ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 2022 දෙසැම්බර් 21 දිනැති අංක පීඊඩී 09/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වාර්ෂිකව රු.20,000 ක ප්‍රසාද දීමනාවක් පමණක් ගෙවිය හැකි වුවද, අනුමත සීමාව ඉක්මවා රු.3,130,193 ක ප්‍රසාද දීමනාවක්ද ගෙවා තිබුණි. |
| (ඊ) | 2009 මාර්තු 09 දිනැති අංක ඩීඑම්එස්/ඊ4/10/4/090/2 දරන සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් ඇමතු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | |
| | (i) 03 ඡේදය | (i) පැමිණීමේ දිරි දීමනා ලෙස මසකට එක් සේවකයෙකුට රු.2,000 ක් පමණක් ගෙවීමට අනුමැතිය ලැබී තිබුණද එය රු.3,500 ක් දක්වා වැඩි කර ගෙවා තිබුණි.<br><br>(ii) පැමිණීමේ දිරිදීමනා ගෙවන්නේනම් වර්ෂය අවසානයේ ඉතිරි නිවාඩු සඳහා මුදල් ගෙවිය නොහැකි වුවද, පැමිණීමේ දිරිදීමනාව ගෙවා තිබුණු සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේ ඉතිරි නිවාඩු වෙනුවෙන් ද රු.11,960,822 ක් ගෙවා තිබුණි. |
| | (ii) 04 ඡේදය | අවුරුදු හා නත්තල් වෙනුවෙන් වර්ෂයකට එක් අයෙකුට එක් වතාවක් පමණක් රු.6,000 ක තෑගි වවුචර් ලබාදිය හැකි වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ස්ථිර සේවකයන්ට රු.25,000 ක් බැගින් හා පුහුණු සේවකයන්ට රු.12,500 ක් බැගින් වූ මුළු පිරිවැය රු.7,392,062 ක් වූ තෑගි වවුචර්ද, ඊට අමතරව පාසල් පොත් හා උපකරණ මිලදී ගැනීමට ස්ථිර සේවකයෙකුට රු.12,500 ක් බැගින් හා අනෙකුත් සේවකයන්ට රු.6,250 ක් බැගින් මුළු පිරිවැය රු.5,087,500 ක් වූ තෑගි වවුචර්ද ලබාදී තිබුණි. |
| | (iii) 06 ඡේදය | යම් සේවකයෙකුට නියමිත සේවා මුර සියල්ලටම පැමිණියහොත් පමණක් රු.1,000 ක මාසික දීමනාවක් ගෙවිය හැකි වුවද, සහභාගී වූ එක් එක් |

| | | |
|---|---|---|
| | | සේවාමුරයක් වෙනුවෙන් විධායක, පුහුණු වන විධායක හා විධායක නොවන සේවකයන්ට පිළිවෙලින් රු.400 ක්, රු.300 ක් හා රු.200 ක් බැගින් වන පරිදි සමාලෝචිත වර්ෂය තුළදී රු.6,399,800 ක් සේවාමුර දීමනාව වශයෙන් ගෙවා තිබුණු අතර, වැඩිපුර ගෙවා තිබුණු සේවාමුර දීමනා රු.3,326,800 ක් විය. |
| (උ) | 2015 ජුනි 04 දිනැති අංක BP/30/15 හා 2022 සැප්තැම්බර් 22 දිනැති අංක BP/62/22 දරන අධ්‍යක්ෂක මණ්ඩල තීරණ | සංස්ථාවේ සේවකයන් සඳහා ගෙවනු ලබන පා පැදි ණය 2015 ජුනි 04 දින සිට රු.3,000 සිට රු.75,000ක් දක්වා වැඩිකර තිබුණු නමුත් ඒ සඳහා ලබා ගත යුතු භාණ්ඩාගාර අනුමැතිය මේ දක්වාම ලබාගෙන නොතිබුණි. |
| (ඌ) | 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (x) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ මාණ්ඩලික නිලධාරීන් වෙත ලබාදෙනු ලබන ණය පහසුකම් 2022 දෙසැම්බර් 31 වන දින තෙක් අත්හිටුවිය යුතු බව දන්වා තිබුන ද, ඉන් බැහැරව මාණ්ඩලික නිලධාරීන් 11 දෙනෙකු වෙත රු.3,980,625 ක ආපදා ණය ගෙවා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය, සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී රු.492,452,048 ක් වැයකර ඖෂධ අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ අවස්ථා 06 කදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.3 ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථීත්වය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණු අතර, පොදු කොන්ත්‍රාත් පනත යටතේ කොන්ත්‍රාත්තුව ලියාපදිංචි කිරීමේ සහතිකය සැපයුම්කරු වෙතින් ලබා ගෙන නොතිබුණි.

(ආ) 2020 වසරේ කොවිඩ් 19 වසංගතය ඉතා උග්‍රව පැතිරී ගිය කාලසීමාව තුළ වෛද්‍ය සැපයුම් අංශයේ උපදෙස් පරිදි ප්‍රසම්පාදනය කර තිබූ රු.6,698,610 ක් වූ Chloroquine Phosphate BP අමුද්‍රව්‍ය අයිතමයෙන් ඒකක 600 ක ජීව කාලය, ඖෂධ අමුද්‍රව්‍ය ගබඩාවට ලැබුණු දින සිට වසර 02 කට වඩා ඉක්මවා තිබුණි. 2025 මාර්තු 31 දින වන විට මෙම අමුද්‍රව්‍ය තොග කල් ඉකුත් වීමට නියමිතව ඇති අතර

විගණන දිනය වන විට ද මෙම ඖෂධ තොගය සඳහා ප්‍රති අපනයන කටයුතු සිදුකරගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) වෛද්‍ය සැපයුම් අංශයෙන් ලද Cloxacillin Sodium BP 250mg ඇණවුමක් වෙනුවෙන් මිලදී ගනු ලැබූ රු 1,261,032ක් වටිනාකමැති DHS මුද්‍රාව සහිත හිස් කරල් තොගයක් (E/H Gelatin caps No 1 Brigh Orange/Black) වෛද්‍ය සැපයුම් අංශය විසින් පෙර දැනුම් දීමකින් තොරව ඇණවුම අත්හිටුවීම හේතුවෙන් එම තොගය සෙමින් චලනය වෙමින් තිබූ අතර, විගණිත දිනය වනවිට ද මෙම තොගය කල් ඉකුත්වී තිබුණි.

## 2.3 වෙනත් කරුණු

(අ) 2022 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් ඉටුකර ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්ම සහ අදාළ වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය සමඟ මූල්‍ය පුරෝකථනය ඇතුළත් 2022-2026 කාලසීමාව සඳහා වන උපායමාර්ග සැලැස්ම (Corporate Plan) රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් රාජ්‍ය ව්‍යවසාය අධ්‍යක්ෂ ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණද, 2022 සිට 2026 දක්වා කාලසීමාව සඳහා වන උපායමාර්ග සැලැස්ම 2023 මැයි 04 දින වන විටද රාජ්‍ය ව්‍යවසාය අධ්‍යක්ෂ වෙතින් අනුමත වී නොතිබුණි. උපායමාර්ග සැලසුම් අනුව කාලච්ඡේදයන් තුළ ඉටුකරගතයුතු ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) තුළින් නිරූපණය වන බැවින්, උපායමාර්ග සැලැස්ම අනුමත නොවීම හේතුවෙන් කාලච්ඡේදයේ ක්‍රියාකාරකම් වල කාර්යසාධනය ඇගයීමට නොහැකිවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අලෙවි සැලැස්මට හා මාසික නිෂ්පාදන සැලැස්මට අනුව හඳුනාගෙන තිබුණු මුළු නිෂ්පාදන අවශ්‍යතාවය අතර ඖෂධ වර්ග 71 ක ඒකක මිලියන 777.576 ක වෙනසක් පැවතුණි.

(ii) 2022 වර්ෂය සඳහා සංස්ථාවේ අලෙවි අංශය විසින් ලබා දුන් අලෙවි සැලැස්මෙහි ඇතුළත් ඖෂධ වර්ග 29 ක මුළු අවශ්‍යතාවය ඒකක මිලියන 2,545.180 ක් වූ නමුත් එම ඖෂධ 29 න් සමාලෝචිත වර්ෂය තුල සත්‍ය නිෂ්පාදනය ඒකක මිලියන 1,408.081 ක් පමණක් වූ බැවින් නිෂ්පාදන අවශ්‍යතාවය සහ සත්‍ය නිෂ්පාදනය අතර ඒකක මිලියන 1,137.099 ක ඌනතාවයක් දක්නට ලැබුණි.

(iii) 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය අතර කාලය තුළ සමස්ථ අලෙවි ආදායම එක් එක් වර්ෂ වලදී බද්ධ ව්‍යාපාර නිෂ්පාදන වලින් සංස්ථාවේ අලෙවිය සඳහා දක්වන දායකත්වය ඉහළ ගොස් ඇති අතර, සංස්ථාවේ නිෂ්පාදන වලින් සංස්ථාවේ අලෙවිය සඳහා දක්වන දායකත්වය පහළ ගොස් තිබුණි. 2022 වර්ෂය සැලකීමේදී බද්ධ ව්‍යාපාර වලින් සමස්ථ ආදායමට වූ දායකත්වය සියයට 52.34 ක් සංස්ථාවේ නිෂ්පාදිත වලින් සමස්ථ ආදායමට වූ දායකත්වය සියයට 47.66 ක් වී තිබුණි.

(iv) සංස්ථාව විසින් නිෂ්පාදනය කර තිබුණු ඖෂධ වර්ග 15 ක් නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවෙන් මිල නියම කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී එම ඖෂධ ඒවායේ නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවෙන් අලෙවි කිරීම තුළින් රු.230,054,679 ක අලාභයක් සංස්ථාවට දැරීමට සිදුවී තිබුණි.

(v) සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන ඇතැම් ඖෂධ වල මිල තීරණය කිරීමේදී එහි නිෂ්පාදන පිරිවැයට වඩා සියයට 26 සිට 81 දක්වා ඉහළ ලාභාන්තිකයක් එකතු කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ඖෂධ අලෙවිය හා බෙදාහැරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමුද්‍රව්‍ය නොමැතිවීම, යන්ත්‍ර ධාරිතාවය ප්‍රමාණවත් නොවීම, නිෂ්පාදන ක්‍රියාවලියේ පවත්නා තාක්ෂණික දෝෂ ආදී විවිධ හේතුන්මත වෛද්‍ය සැපයුම් අංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඇණවුම්කර තිබුණු ඖෂධවලින් විකුණුම් වටිනාකම රු.723,571,830 ක් වූ ඖෂධ ඒකක මිලියන 122.53ක ප්‍රමාණයක් සැපයීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු විකුණුම් වටිනාකම රු.13,927,795,651 ක් වූ ඖෂධ ඒකක මිලියන 2,969.65 අතරින් සංස්ථාවේ නිෂ්පාදන වලින් විකුණුම් වටිනාකම රු.5,365,222,678 ක්වූ ඖෂධ ඒකක මිලියන 2,368.29 පමණක් සපයා තිබුණු අතර, ඉතිරි විකුණුම් වටිනාකම රු.8,562,572,974 ක් වූ ඖෂධ ඒකක මිලියන 601 බද්ධ ව්‍යාපාර සැපයුම් මඟින් ලබාදී තිබුණි. එසේවුවද, බද්ධ ව්‍යාපාර සැපයූ ඖෂධ ඒකක ප්‍රමාණයට සාපේක්ෂව වැඩි ඖෂධ ඒකක ප්‍රමාණයක් වෛද්‍ය සැපයුම් අංශයට සැපයීම තුළින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විශාල දායකත්වයක් රටට ලබාදී තිබුණි.

(iii) සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව බෙදාහරින්නන් විසින් විකුණුම් වෙනුවෙන් සංස්ථාවට ඉදිරිපත් කරන ලද චෙක්පත් වලට ගෙවීම් සිදුකිරීම නතර කිරීම හේතුවෙන් ඉන්වොයිස් පත් 03 කට අයත් රු. 1,915,999.75 වටිනාකමින් යුත් චෙක්පත් අගරු වී තිබුණි. ඒ අනුව බෙදාහරින්නන් විසින් වෙළෙඳ වට්ටම් හිමිකර ගත්තද ඔවුන්ගෙන් නිසි වේලාවට මුදල් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(iv) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙලකර තිබුණු අලෙවි සැලසුම තුළ ඇතුළත් නොවූ වටිනාකම රු.මිලියන 1408.46 ක් වූ ඒකක මිලියන 71.186 කින් සමන්විත ඖෂධ හා වෙනත් අයිතම 38 ක් 2022 වර්ෂය තුළ අලෙවිකර තිබුණි.

(v) 2022 වර්ෂය තුළදී ඖෂධ වර්ග 30 කින් ඒකක මිලියන 351.907 ක අලෙවි ඉලක්කයන් සපුරාගත නොහැකිවී තිබුණද, මෙම ඖෂධවල මිලෙහි සිදුවූ වෙනස නිසාවෙන් අලෙවි සැලසුමෙහි වූ ආදායම් වටිනාකම ඉක්මවා රු.මිලියන 2,622.10 සත්‍ය ආදායම් වටිනාකමක් ලඟාකර ගෙන තිබුණි.

(vi) 2022 ජූලි මස සිට 2022 දෙසැම්බර් මස දක්වා කාලසීමාව තුළ සංස්ථාව විසින් බෙදාහරින්නන් 48 දෙනෙකු අතරින් 16 දෙනෙකුට දෙන ලද රුපියල් 101,456,371 ක් වටිනාකමැති අලෙවි ඉලක්ක සපුරාලීමට නොහැකි වී තිබුණි.

(vii) අලෙවි අංශය නිකුත් කළ සමහර ඉන්වොයිස් සඳහා අනුමැතිය ලබාදී නොතිබුණු අතර සමහර ඉන්වොයිස් පරීක්ෂා කළ බවට අත්සන් කර නොතිබුණු නමුත් ඒවා අනුමත කර තිබුණි.

(ඇ) දේශීයව ඖෂධ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා යෝග්‍ය පෞද්ගලික ආයෝජකයන් අතර බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා වූ යෝජනාව යටතේ සංස්ථාව විසින් විභව ආයෝජකයන් 17 දෙනෙකු සමඟ ඖෂධ වර්ග සැපයීම සඳහා 2018 හා 2019 වර්ෂයන්හිදී ගිවිසුම්ගතවී තිබුණද විගණිත දින වන විට බද්ධ ආයෝජකයින් 15 දෙනෙකු පමණක් සංස්ථාව සමඟ සම්බන්ධ වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එම බද්ධ ව්‍යාපාර සමඟ සංස්ථාව ගනුදෙනු සිදුකර තිබුණු ආකාරය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආයෝජකයන් 15 දෙනෙකු සමඟ ඖෂධ සැපයීම සඳහා ගිවිසුම් ගතවී තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විටත් ආයෝජකයින් හය දෙනෙකුගෙන් පමණක් ඖෂධ මිලදී ගෙන තිබුණි.

(ii) බද්ධ ව්‍යාපාර සැපයුම් සඳහා ගැණුම් මිලෙන් සියයට 6 ක ලාභ ප්‍රතිශතයක් එකතු කර වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ සපයන බවට වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණද සිදුකල නියැදි පරීක්ෂාවට අනුව එය එසේ නොවන බව ගිවිසුම්ගත ආයෝජකයෙකු වෙතින් 2022 මුල් අර්ධ වර්ෂය තුළ මිලදී ගත් ඖෂධ අයිතම 17 ක් සම්බන්ධයෙන් වූ කරුණු වලින් අනාවරණය විය.

(a) මිලදීගත් ඖෂධ අතරින් රු.14,979,403.47 වටිනා ඖෂධ අයිතම 02 ක් ඉන්වොයිස් මිලෙන් ආසන්න වශයෙන් සියයට 17 ක සේවා ගාස්තුවක් එනම්, රු.2,490,749.53 ක් උපයමින් ඒවා වෛද්‍ය සැපයුම් අංශයට රු.17,470,153 කට අලෙවි කර තිබුණි. ඒ අනුව සංස්ථාවේ බද්ධ ව්‍යාපාර ගැණුම් සම්බන්ධයෙන් වූ ලාභ ප්‍රතිපත්තිය වූ සියයට 6 ක ලාභ ප්‍රතිශතය ඉක්මවමින් සියයට 11 ක ලාභ ප්‍රතිශතයක් මත සංස්ථාව එම ඖෂධ වෛද්‍ය සැපයුම් අංශයට අලෙවි

කර තිබුණි. මෙම අයිතමය සඳහා නිෂ්පාදකයා විසින් සංස්ථාවට ඉදිරිපත් කර තිබූ පිරිවැය පත්‍රිකා අනුව ඉහත තොගයේ මුළු නිෂ්පාදන පිරිවැය රු.9,037,401.68 ක් වූ අතර, බද්ධ ව්‍යාපාරය ඉන් සියයට 65 ත් 66 ත් අතර අධික ලාභ ප්‍රතිශතයක් උපයාගෙන ඇති බව අනාවරණය විය.

(b) මිලදී ගත් ඖෂධ අතරින් 13 කට අදාල ඉන්වොයිසි වල රු.65,962,584.37 ක් වූ අතර, සියයට 17-26 අතර සේවා ගාස්තුවක් වූ රු.11,058,498.03 ක් එකතු කරමින් එම ඖෂධ වෛද්‍ය සැපයුම් අංශය වෙත රු.77,021,082 කට අලෙවි කර තිබුණි. ඒ අනුව සංස්ථාව විසින් සියයට 6 ක ලාභ ප්‍රතිශතය ඉක්මවා සියයට 11-26 ත් අතර වැඩිපුර ලාභ ප්‍රතිශතයක් උපයාගෙන තිබුණි. නිෂ්පාදකයාගේ පිරිවැය පත්‍ර අනුව එම ඖෂධ වල පිරිවැය රු. 69,934,852ක් වූ අතර බද්ධ ව්‍යාපාරය සියයට 2 සිට සියයට 17ක් අතර අලාභ ප්‍රතිශතයක් උපයාගෙන ඇතිබව වැඩිදුරටත් අනාවරණය විය. මේ අනුව සංස්ථාව වෙත ඉදිරිපත් කරන ලද පිරිවැය පත්‍රිකා වල නිවැරදිතාවය පිළිබඳ සංස්ථාව විසින් පසු විපරම් කිරීමක් සිදුකර ඇති බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(iii) බද්ධ ව්‍යාපාර යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර තිබුණු නිල කමිටුව (Official committee) විසින් නිර්දේශ කර තිබුණු පරිදි, ආයෝජකයාගේ නිෂ්පාදන ක්‍රියාවලියේ තත්ත්ව පාලනය, කළමනාකරණය හා තාක්ෂණික සහාය සංස්ථාව විසින් සැපයිය යුතු අතර, ඒ සඳහා එම ආයෝජකයාගේ ව්‍යාපාරයේ කොටස් වලින් සියයට 10 ක් සංස්ථාව වෙත නිකුත් කළ යුතු විය.කෙසේ වුවද ආයෝජකයන් හත්දෙනෙකු විසින් පමණක් සංස්ථාව වෙත කොටස් නිකුත් කර තිබුණු අතර, 2022 වර්ෂය තුළදී සංස්ථාව ගනුදෙනු සිදු කළ ආයෝජකයකු වූ Medi Com (Pvt) Ltd, විසින් ගිවිසුමෙහි සඳහන් පරිදි තම කොටස් වලින් සියයට 10 ක් සංස්ථාව වෙත විගණිත දින වූ 2022 දෙසැම්බර් 31 දින වන විටද කොටස් නිකුත් කර නොතිබුණි.

(iv) සංස්ථාවේ අධ්‍යක්ෂකවරුන් නම් කළ ආයතන වන Sands Active (Pvt) Ltd. සහ Yaden Laboratories (Pvt) Ltd. යන ආයතන දෙකෙන් SPMC සන්නාමය යටතේ වර්තමානය වන විටත් ඖෂධ මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

(v) බද්ධ ව්‍යාපාර 04 ක් සංස්ථාව වෙත ලබාදිය යුතු 10% ක කොටස් හිමිකමට අදාළ කොටස් සහතික Premium International (Pvt) Ltd, Sands Active (Pvt) Ltd,Synergy Pharmaceuticals Corporation (Pvt) Ltd, සහYaden Laboratories (Pvt)Ltd වෙතින් ලැබී තිබුණු අතර, Sands Active (Pvt) Ltd. සහ Yaden Laboratories (Pvt) Ltd යන ආයතන දෙකෙන් පමණක් 2023 වර්ෂයේ මුල සිට සංස්ථාව ඖෂධ මිලදීගෙන තිබුණි.

(ඉ) රට තුල පවතින ඖෂධ නිෂ්පාදනය කරනු ලබන එකම නිෂ්පාදන ආයතනය වන ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මඟින් නිපදවනු ලබන ඖෂධ සඳහා වන ඉල්ලුම මත එහි නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා යථෝක්ත රාජ්‍ය සංස්ථාවේ නිෂ්පාදන පහසුකම් ප්‍රමාණවත් නොවීම මත හොරණ මිල්ලෑව ප්‍රදේශයේ නව නිෂ්පාදනාගාරයක් ආරම්භ කිරීමට යෝජනා වී තිබූ අතර රජය විසින් රටට, ජනතාවට අවශ්‍ය ඖෂධ, අනෙකුත් වෛද්‍ය පරිභෝජන භාණ්ඩ හා වෛද්‍ය උපකරණ රටට ගෙන්වීම (ආනයනය) වෙනුවෙන් සැලකිය යුතු විදේශ අරමුදල් ප්‍රතිශතයක් වැය කිරීමත් එසේම සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමටත්, අපනයනය තුළින් විදේශ විනිමය ඉපයීමටත් හා ආනයන ආදේශක තුලින් විදේශ විනිමය ඉතිරි කර ගැනීමටත් හැකි බැවින් ශ්‍රී ලංකාවට දැවැන්ත ආර්ථික ප්‍රතිලාභ ගෙන දිය හැකි විභව කර්මාන්තයක් ලෙස ඖෂධ නිෂ්පාදන කර්මාන්තය හඳුනා ගැනීම මත නව ඖෂධ නිෂ්පාදනාගාරයක් නිපදවීම තුළින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ධාරිතාවය වැඩි කිරීමට ලෝටස් ෆාමා (Lotus Pharma) ව්‍යාපෘතිය ආරම්භ කිරීමට 2021 මාර්තු 08 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර මේ සඳහා හොරණ මිල්ලෑවවත්ත ප්‍රදේශයේ අක්කර 65 කට ආසන්න භූමි ප්‍රදේශයක් රු.මිලියන 322.4 ක පිරිවැයක් දරා හිමිකරගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා නිලධාරීන් 03 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ අතර 2022.12.31 දිනට ව්‍යාපෘතිය වෙනුවෙන් ආසන්න වශයෙන් රු. මිලියන 354.96 ක් වැයකර තිබුණද මේ වන විට මෙම ව්‍යාපෘතියේ කටයුතු සැලසුම් කළ පරිදි ඉටු නොවීම මත ඉහත පරිදි රටට හා ජාතියට මහඟු සේවයක් වන මෙවැනි ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබාදී කඩිනම් කිරීමට සියළුම පාර්ශවයන් කටයුතු කළ යුතු අතරම ජාතික අවශ්‍යතාවයක් ලෙස පැන නැගී ඇති මෙම ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කර දැයට අවශ්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙන්ම අනෙකුත් වගකිව යුතු පාර්ශවයන්ගේද අවධානය යොමුවිය යුතුව ඇත.

(ඊ) නිමි ඖෂධ තොග ගබඩා කිරීමට දෙමහල් ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2018 සැප්තැම්බර් 21 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු අතර, 2022 දෙසැම්බර් 31 දින වන විට මෙම ඉදිකිරීම සඳහා රු.44,739,833 ක් වැය කර තිබුණි. මූලික ගිවිසුම ප්‍රකාරව 2019 අගෝස්තු 21 දින වන විට ඉදිකිරීම් නිම කළ යුතු වූ නමුත් විවිධ හේතුමත ඉදිකිරීම් දිගින් දිගටම ප්‍රමාද වී තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුම උල්ලංඝණය කලහොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදලින් සියයට පහකට නොඅඩු මුදලක් කාර්‍ය සාධන සුරක්ෂණය වශයෙන් ලබාගත යුතු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වැඩ : (ආ) ප්‍රකාරව එය වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනෙන් ඔබ්බට දින 28 ක් වලංගු විය යුතුය.එසේ වුවද, ඉදිරිපත් කර තිබුණු කාර්යය සාධන සුරක්ෂණය 2022 සැප්තැම්බර් 04 දිනෙන් පසු කල් ඉකුත් වී තිබුණි. විගණිත දිනය වන විට වැඩ අවසන් නොකළ මෙම කොන්ත්‍රාත්තුවේ කාර්යය සාධන සුරක්ෂණය ද අත්තිකාරම් ගෙවීම් බැදුම්කරයද දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) සංස්ථාවේ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 427 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 323ක් වී තිබුණි. 2023 මාර්තු 31 දින වන විටද

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

නිෂ්පාදන ක්‍රියාවලියට ඉතා වැදගත් අංශ වූ වට්ටෝරු පර්යේෂණ හා සංවර්ධන අංශ මෙන්ම තත්ත්ව පාලන අංශයේ ප්‍රධාන තනතුරු 02 ක් ඇතුළු වැදගත් තනතුරු කිහිපයක් සඳහා බඳවා ගැනීම් සිදුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) අනුමත තනතුරු 08 ක් සඳහා බඳවා ගැනීමේ පටිපාටින් පිළියෙල කර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට 2023 මැයි 25 දින වන විටත් අපොහොසත් වී තිබුණි.

(ඍ) 2022 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල ඇතුළත් පිරිවැය රු.21,962,722 ක් වූ අයිතම 82 ක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සිදු කර තිබුණු භෞතික සමීක්ෂණයට ලක්වී නොතිබුණු අතර මෙම අයිතම ඌනතා වශයෙන්ද දක්වා නොතිබුණි.

(එ) ස්ථාවර වත්කම් හඳුනා ගැනීමේදී කුමන අගයකින් යුත් වත්කමක් ස්ථාවර වත්කම් ලෙස හඳුනාගත යුතුද යන්න පිළිබඳ ප්‍රතිපත්තියක් සංස්ථාව සතුව නොතිබුණි.

(ඒ) නිමිද්‍රව්‍ය සපයා ගැනීම වෙනුවෙන් බද්ධ ව්‍යාපාර 04 ක් සඳහා හා Kelun Lifesciences Pvt Ltd වෙත 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.3,593,491,982.74 ක් වූ අතර, ඒ අතරින් රු.2,080,068,385.28 ක්, එනම් සියයට 58 ක ප්‍රමාණයක් අනුමත ණය ගෙවීම සඳහා ඉඩ ලබාදී ඇති දින 50 ක කාලය ඉක්මවා තිබුණි.

(ඔ) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත සපයා තිබුණු ඖෂධ වෙනුවෙන් වසරකට වඩා වැඩි ලැබිය යුතු ශේෂය වන රු. 14,030,172 ක වටිනාකමක් මැයි 29 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඕ) මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ණයහිමියන් දෙදෙනෙකුගේ ශේෂයන්, සෘජු ශේෂ සනාථන ශේෂයන් හා නොසැසඳුන අතර ණයහිමි ශේෂය රු.1,285,995 කින් ඌන තක්සේරු වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# 2022 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

**2.2.2**

**(අ)** රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපති නමින් 2022.01.25 දින නිකුත් කරන ලද ලිපියට අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ පරිච්ඡේද 2.3 ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට මූල්‍ය අත්පොත අනුමත කිරිමේ බලය පවරා ඇත. ඒ අනුව 2022.01.25 දින සියලූ ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලදී. එසේම මේ සම්බන්ධයෙන් කම්කරු පනතේ ඇති ප්‍රතිපාදන සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්තුමාගේ උපදෙස් ලිඛිතව ලබාගෙන ඇත.

**(ආ)** පුරප්පාඩුව පිරවීමට අයදුම්පත් කැඳවන ලදි (2018.10.04, 2019.02.24, 2019.09.08, 2020.09.20, 2021.12.12 දිනයන් වේ).

නමුත් තනතුරට සුදුසු අයදුම්කරුවන් සිටියේ නැත. දැනට බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ (PED) අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන අංශයේ කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යාම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරේ වැඩ බැලීම සඳහා නිලධාරියෙක් අත්‍යවශ්‍ය බැවින් එම තනතුරේ පුරප්පාඩු පුරවන තෙක් කලමණාකරු - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන තනතුර දරණ නිලධාරියා පත් කිරීමට සිදු වී ඇත.

**(ඇ)** රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපති නමින් 2022.01.25 දින නිකුත් කරන ලද ලිපියට අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ පරිච්ඡේද 2.3 ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට මූල්‍ය අත්පොත අනුමත කිරිමේ බලය පවරා ඇත. ඒ අනුව 2022.01.25 දින සියලූ ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලදී. ඒ අනුව ආපදා ණය සඳහා ගෙවීම් කරන ලදී.

**(ඈ)** තැපැලෙන් යවනු ලබන සියළුම චෙක්පත් පිළිබඳ විස්තර අඩංගු ලේඛණයක් දැනට පරිගණකයේ පවත්වාගෙන යනු ලබන අතර එය අවශ්‍ය නම් විගණනයට ඉදිරිපත් කල හැක.

**(ඉ)** රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපති නමින් 2022.01.25 දින නිකුත් කරන ලද ලිපියට අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ පරිච්ඡේද 2.3 ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට මූල්‍ය අත්පොත අනුමත කිරිමේ බලය පවරා ඇත. ඒ අනුව 2022.01.25 දින සියලූ ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩල මගින් අනුමත කරන ලදී. එසේම අදාල වර්ෂය තුල කර්මාන්තශාලාවේ නිෂ්පාදනයේ සහ විකුණුම් වල උපරිම ධාරිතාවයක් වෙත ලගා වීම සලකා බලා සේවකයන් තව දුරටත් දිරිමත් කිරිම සඳහා මෙම විශේෂ ප්‍රසාද දීමනාව ලබාදීමට කටයුතු කරන ලදී. එසේම මේ මගින් නිෂ්පාදන ධාරිතාවය ඉහළ මට්ටමක පවත්වාගෙන යා හැකි අතර ඒ තුළින් රජයේ රෝහල් වල ඖෂධ අවශ්‍යතාවය අඛණ්ඩව සැපයීමට හැකියාව ලැබේ.

**(ඊ)** **(i).** **(i).** රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපති නමින් 2022.01.25 දින නිකුත් කරන ලද ලිපියට අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ පරිච්ඡේද 2.3 ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට මූල්‍ය අත්පොත අනුමත කිරිමේ බලය පවරා ඇත. ඒ අනුව 2022.01.25 දින සියලූ ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩල මගින් අනුමත කරන ලදී. ඒ අනුව පැමිණීමේ දිරි දීමනාව සඳහා ගෙවීම් කරන ලදී.

**(ii).** මෙම ගෙවීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2022.12.21 දින නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PES/08/2022 දරණ චක්‍රලේඛය අනුව ගෙවීම් සිදු කර ඇත.

**(ii).** රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපති නමින් 2022.01.25 දින නිකුත් කරන ලද ලිපියට අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ පරිච්ඡේද 2.3 ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට මූල්‍ය අත්පොත අනුමත කිරිමේ බලය පවරා ඇත. ඒ අනුව 2022.01.25 දින සියලූ ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩල මගින් අනුමත කරන ලදී. ඒ අනුව නත්තල් තෑගි වවුචරය සඳහා ගෙවීම් කරන ලදී.

**(iii)** රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපති නමින් 2022.01.25 දින නිකුත් කරන ලද ලිපියට අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ පරිච්ඡේද 2.3 ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට මූල්‍ය අත්පොත අනුමත කිරිමේ බලය පවරා ඇත. ඒ අනුව 2022.01.25 දින සියලූ ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩල මගින් අනුමත කරන ලදී. ඒ අනුව සේවා මුර දීමනාව සඳහා ගෙවීම් කරන ලදී.

(උ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපති නමින් 2022.01.25 දින නිකුත් කරන ලද ලිපියට අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ පරිච්ඡේද 2.3 ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට මූල්‍ය අත්පොත අනුමත කිරීමේ බලය පවරා ඇත. ඒ අනුව 2022.01.25 දින සියලු ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩල මගින් අනුමත කරන ලදී. ඒ අනුව පාපැදි ණය සඳහා ගෙවීම් කරන ලදී.

(ඌ) මාණ්ඩලික නිලධාරීන් වෙත ගෙවනු ලබන ණය පහසුකම් ගෙවීම් නතර කිරීමට පියවර ගනු ලැබේ.

**2.2.3** දක්වා ඇති කරුණු සහ තත්ත්වයන් සැලකිල්ලට ගෙන 2023 වර්ෂයේ සිට ඒ අනුව ක්‍රියා කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.4**

(අ) ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාල සටහන ප්‍රසම්පාදන ලිපිගොනු සඳහා ඇතුලත් කර නොමැති නමුත් ප්‍රසම්පාදන කාලසටහන අනුව කටයුතු කර ඇත. විගණනයෙන් පෙන්වා දුන් අන්දමට ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාල සටහන ප්‍රසම්පාදන ලිපිගොනු වලට ඇතුලත් කිරීම මේ වන විට සිදු කරමින් පවතී.

(ආ) 2020 වසරේ Covid-19 වසංගතය ඉතා උග්‍රව පැතිර ගිය අතර ලොව පුරා Chloroquine Phosphate BP 250mg යන ඖෂධය Covid-19 වසංගතය සඳහා භාවිතා කිරීමට නිර්දේශ විය. ඒ වන විට අප සතුව පැවති Chloroquine Phosphate අමුද්‍රව්‍ය තොගය භාවිත කරමින් ඉතා කෙටි කාලයක් ඇතුලත Chloroquine Phosphate BP 250mg පෙති මිලියන පහක ප්‍රමාණයක් නිෂ්පාදනය කර රටේ අවශ්‍යතාවය සඳහා භාවිතා කිරීමට වෛද්‍ය සැපයුම් අංශය වෙත ලබා දීමට අපට හැකි විය.

Covid – 19 වසංගතය සඳහා Chloroquine Phosphate ඖෂධය භාවිතා කිරීමට නිර්දේශ කිරීමත් සමගම මෙම Chloroquine Phosphate අමුද්‍රව්‍ය සඳහා ලෝක වෙළඳපොලේ පැවති ඉල්ලුම ඉතා ඉහළ ගිය අතර ශ්‍රී ලංකාවේ ජනතාව වෙනුවෙන් මෙම ඖෂධය ලබා දීමේ වගකීම අප සංස්ථාව සතු බව විශ්වාස කරමින් වෛද්‍ය සැපයුම් අංශයේ උපදෙස් පරිදි, 600 kg ක ප්‍රමාණයක් ඉක්මණින් ප්‍රසම්පාදනය කිරීමට කටයුතු කළෙමු. එය එසේ කිරීමට කටයුතු කරනු ලැබුයේ එම අවස්ථාවේ තිබූ භයානක වසංගත තත්ත්වයෙන් ශ්‍රී ලාංකික ජනතාවට සහනයක් සැලසීමේ අර්මුනෙනි. නමුත් බලාපොරොත්තු වූ ආකාරයට මෙම ඖෂධය භාවිතා නොවීම නිසා මෙම තොගය භාවිතා කළ නොහැකි විය.

මෙම තොගය නැවත ප්‍රති අපනයනය කිරීමට ඇති හැකියාව පිළිබඳ සොයා බලන ලෙස IPCA Laboratories – India ( 19/01/2021, 27/02/2023) ආයතනය වෙත දන්වා ඇත. එමෙන්ම මෙම තොගය හෝ එහි නිෂ්පාදන United Nations Children Fund – Thailand (29/06/2020) වෙත ලබා දීමේ ඇති හැකියාව සොයා බලන ලෙසද ඉල්ලීම් කර ඇත.

එමෙන්ම මෙම නිෂ්පාදිත ඖෂධ හෝ අමුද්‍රව්‍ය තොගය දේශීය හෝ විදේශීය පාර්ශවයකට අවශ්‍ය නම් එය සම්බන්ධීකරණය කර දෙන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සෞඛ්‍ය සේවා) වෙත ඉල්ලීම් කර ඇති අතර ෆිජී දූපත් රටක් සඳහා ප්‍රධානයක් ලෙස ලබාදීමේ ඇති හැකියාව සොයාබලමින් පවතින බව අප හට දන්වා ඇත. දැනට එම සම්බන්ධීකරණ කටයුතු සිදුවෙමින් පවතී.

(ඇ) මෙම හිස් කරල් මිල දී ගන්නා ලද්දේ වෛද්‍ය සැපයුම් අංශයෙන් ලද Cloxacillin Sodium BP 250mg ඇණවුමක් වෙනුවෙනි. එබැවින්, වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාව පරිදි මෙම කරල් වල ‘DHS’ මුද්‍රණය කර ඇත. ඉතිරි වූ හිස් කරල් මිලියන 5.125 අපතේ යාමකින් තොරව භාවිතා කරීම සඳහා වෛද්‍ය සැපයුම් අංශයෙන් අවසන් වතාවටද උත්සාහ කළද යහපත් ප්‍රතිචාරයක් නොලැබුනි.

DHS මුද්‍රිත බැවින් මෙම හිස් කරල් තොගය විවෘත වෙළඳපල සඳහා Cloxacillin Sodium BP 250mg නිෂ්පාදනය කිරීමට භාවිතා කළ නොහැකි වීමද හේතුවෙන් මෙම තොගය කල් ඉකුත් වන තුරු භාවිතයට ගැනීමට නොහැකි විය. දැනට කල් ඉකුත් වී ඇති බැවින් ඉදිරියේදී විධිමත් ලෙස අපහරණය කිරීමට කටයුතු කරන අතර මෙවැනි හානි වලක්වා ගැනීමේ අරමුනෙන් මෙම සිද්ධියෙන් පසුව DHS මුද්‍රිත හිස් කරල් ඇණවුම් කිරීම සිදු නොකරන ලදී

**2.3**

**(අ)**

**(i)** අදාළ ක්‍රියාකාරී සැලැස්ම 2023.07.20 දින අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇත.

**(ii)** උපාය මාර්ග සැලැස්ම 2023.07.20 දින අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇති අතර එය ඖෂධ අමාත්‍යංශය ලේකම් හරහා රාජ්‍ය ව්‍යවසාය අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී.

**(ආ)**

**(i)** මාසික නිෂ්පාදන සැලැස්ම අනුව 2022 වසරේ සෑම මසකම නිපදවූ ඖෂධ ප්‍රමාණ පහතින් දක්වා ඇත.

| මාසය | අපේක්ෂිත නිමැවුම් (මිලියන) | ලඟාකරගත් නිමැවුම (මිලියන) | ප්‍රතිශතය % |
|---|---|---|---|
| ජනවාරි | 280.8905 | 226.382 | 80.6 |
| පෙබරවාරි | 263.9055 | 253.642 | 96.1 |
| මාර්තු | 279.89 | 330.727 | 118.2 |
| අප්‍රේල් | 245.275 | 209.864 | 85.6 |
| මැයි | 288.49 | 263.244 | 91.2 |
| ජුනි | 299.644 | 316.531 | 105.6 |
| ජුලි | 313.288 | 324.5 | 103.6 |
| අගෝස්තු | 296.629 | 274.593 | 92.6 |
| සැප්තැම්බර් | 245.57 | 251.629 | 102.5 |
| ඔක්තොම්බර් | 247.94 | 305.074 | 123.0 |
| නොවැම්බර් | 351.42 | 350.886 | 99.8 |
| දෙසැම්බර් | 256.806 | 195.883 | 76.3 |

මෙහිදී බොහෝ මාස වල ± 10% ප්‍රතිශතයක් තුල වසරේ මාස 9 ඉලක්කය සපුරාගෙන ඇත. ± 25% තුල සියලු මාස වල ඉලක්කය සපුරා ඇත.

වෛද්‍ය සැපයුම් අංශයේ ඉල්ලුමට සරිලන පරිදි සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනය ප්‍රමාණවත් වුවද පහත සඳහන් ඖෂධ සම්බන්ධයෙන් වෛද්‍ය සැපයුම් අංශයේ සමස්ථ ඉල්ලුම සපුරාලීමට නොහැකි වී තිබිණි.

මෙම ඖෂධ වර්ග සියල්ලම වාගේ වෛද්‍ය සැපයුම් අංශයට සැපයිය යුතු ප්‍රමාණයටත් වඩා නිෂ්පාදනය සිදු කර ඇත. එහෙත් එවකට රටෙහි වෙළඳපොලෙහි පැවති ඖෂධ හිඟය නිසා සැලසුම් කල ප්‍රමාණයට වඩා වැඩි ඖෂධ ප්‍රමාණයක් පෞද්ගලික වෙළඳපොලට විකිණීමට සිදු විය. නිෂ්පාදිත ඖෂධ ප්‍රමාණයට සාපේක්ෂව වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාව හා නිපදවූ ප්‍රමාන පහත දක්වා ඇත.

| ඖෂධය | නිෂ්පාදිත ප්‍රමාණය (මිලියන) | ඇණවුම් ප්‍රමාණය(වෛ. සැ.අ.) (මිලියන) |
|---|---|---|
| ඇස්කෝබික් අම්ලය | 144.50 | 100.00 |
| සිප්රොෆ්ලොක්සසින් | 1.80 | 4.00 |
| ඩොම්පෙරිඩෝන් | 58.10 | 58.00 |
| ෆැමොටිඩීන් | 102.63 | 52.00 |
| ග්ලික්ලසයිඩ් මි.ග්‍රෑ 80 | 297.00 | 240.00 |
| ඉන්ඩොමෙතසින් | 5.00 | 2.00 |
| මෙට්ෆෝමින් මි.ග්‍රෑ 500 | 72.84 | 50.00 |
| පැරසිටමෝල් මි.ග්‍රෑ 500 | 523.00 | 325.00 |
| ට්‍රයිප්ලුවොපෙරසීන් | 13.50 | 5.05 |
| තියෝෆිලීන් SR මි.ග්‍රෑ 125 | 13.65 | 12.00 |

**(ii).** 2021 වර්ෂයේදී ආයතන පෙති හා කරල් මිලියන 3043.5 නිෂ්පාදනය කරනු ලැබූ අතර 2022 වර්ෂයේදී එය පෙති කරල් ඒකක මිලියන 3302.1 ක් දක්වා වර්ධනය විය.

එසේම 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුල තිබූ ආර්ථික අර්බුධය හේතුවෙන් පුරෝකතනය කල ඖෂධ නිෂ්පාදනය හා සැපයීම සැලසුම් විශාල ලෙස වෙනස් විය. SPMC ආයතනය මුලු නිෂ්පාදනයෙන් සාමාන්‍ය ලෙස 25% ඖෂධ පෞද්ගලික වෙළඳපොලටත්ල 75% වෛද්‍ය සැපයීම් අංශයටත් සැපයීම සිදු කෙරේ. එසේම 2022 වර්ෂයේදී නැවතත් Covid වෛරසය වර්ධනය වීම නිසා වෙළඳපොළෙහි අවශ්‍යතාවය පරිදි ඖෂධ සැපයීමට ආයතනයට සිදු විය. එබැවින් Paracetamol 500 mg වැනි ඖෂධ නිෂ්පාදන සැලසුමෙන් බැහැරව පෞද්ගලික වෙළඳපොල වෙත සැලකිය යුතු ලෙස වැඩි ප්‍රමාණයක් සැපයීමට සිදුවිය. ආයතනයේ ඖෂධ නිෂ්පාදනය උපරිම ධාරිතාවයෙන් සිදු වන නිසා යම් ඖෂධ වැඩි ප්‍රමාණයකින් නිපදවීමේදී තවත් ඖෂධ වර්ග කිහිපයක් අඩු ප්‍රමාණයෙන් නිපදවීම සිදුවේ. එබැවින් 2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික අර්බුදය හා Covid වසංගතය නිසා නිෂ්පාදන සැලැසුමෙන් බැහැරව ඖෂධ නිපදවීමට සිදු විය. මෙය පුරෝකථනය කල නොහැකි වාතාවරණයක් සේ සැලකිය හැකි වන අතර වෙනත් වර්ෂ වලට සාපේක්ෂව වෙළඳපොලෙහි ඖෂධ අවශ්‍යතාවය නිතර විචලනය විය. එසේම අමුද්‍රව්‍ය ගෙන්වීමට අවශ්‍ය විදේශ මුදල් නොමැති වීම නිසා වරින් වර බාධා සිදුවිය. එබැවින් මෙවැනි වාතාවරණයක් තුල සම්පූර්ණ සැලැස්මකට අනුගතව කටයුතු කිරීම ඉතා අපහසුය. එහෙත් මාසික සැලැසුමේදී වැඩි ප්‍රතිශතයකින් සෑම විටම සම්පූර්ණ කර ඇත. මාසිකව සැලසුම් කරන ලද මුලු ඖෂධ ප්‍රමාණය හා නිපද වූ මුලු ප්‍රමාණ ඉහත (ආ) i හී දක්වා ඇත.

**(iii).** SPMC සමඟ බද්ධ ව්‍යාපාර ආරම්භ කරනු ලැබූයේ 2017 වසර අගදීය. මෙහිදී කැබිනට් අනුමැතිය 15 දෙනෙකු සඳහා ලැබුනද ඉන් 2017 වසරේ එක බද්ධ ව්‍යාපාරයක් ද 2018 වසරේ බද්ධ ව්‍යාපාර 02 ක්ද SPMC Logo යටතේ ඖෂධ සපයා ඇත.

මේ වන විට බද්ධ ව්‍යාපාර 06 ක් SPMC Logo යටතේ ඖෂධ සපයනු ලබයි.

SPMC මඟින් පෙති හා කරල් ද
Celogen Lanka Pvt. Ltd. මඟින් පෙති හා කරල් ද
Diyatha Pharmaceuticals Pvt Ltd මඟින් ක්‍රීම් හා දියර වර්ග ද
Glosanthe Pvt. Ltd මඟින් බැන්ඩේජ් වර්ග ද
Kelun LifeSciences මඟින් නික්ෂේපන ද්‍රාවණ හා එන්නත් ද (Saline, Dextrose වැනි)
Yaden Laboratories Pvt. Ltd. මඟින් එන්නත් ද (Injections)
Medicom Pvt Ltd මඟින් විෂබීජනාශක ද්‍රාවණ ද

නිෂ්පාදනය කරනු ලබයි.

මෙහිදී මෙම බද්ධ ව්‍යාපාර හරහා සිදු කරනු ලබන්නේ SPMC තුල නිෂ්පාදනය සඳහා ධාරිතාවය නොමැති හා නිෂ්පාදනය නොකරන අයිතමයන් පමණි.
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන කටයුතු පසුගිය වර්ෂයෙහි වැඩි වී ඇතත් මේ වන විට එය ප්‍රශස්ත මට්ටමක පවතී.

| | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| SPMC නිෂ්පාදන ඒකක (මිලියන) | 3015 | 3040 | 3303 |

තව දුරටත් පවතින නිෂ්පාදන ධාරිතාව වැඩි කර ගැනීම සඳහා අප සංස්ථාවේ අලෙවි අංශය වෙනත් ස්ථානයකට ගෙන යාමටත් එම ගොඩනැගිල්ල තුල නිෂ්පාදන කටයුතු සිදු කිරීමටත් කටයුතු සකස් කරමින් සිටී.

තවද, 2023 වර්ෂයේදී ද Sands Active හරහා පෙති හා කරල් නිෂ්පාදන සැපයීමට නියමිත අතර 2024 වර්ෂයේදී Sands Active මඟින් Cephelesporine ඖෂධ හා කොග්ගල Premium හරහා insulin ඖෂධයන් සැපයීමට නියමිත අතර ඒ අනුව බද්ධ ව්‍යාපාර හරහා අලෙවි ආදායම තව දුරටත් වැඩි වනු ඇත.

**(iv).** සංස්ථාවේ අලෙවි නියෝජිතයන් හරහා සිදුකරන SPMC ඖෂධයන් අලෙවි කිරීමේදී ඒවායෙහි පිරිවැය විශ්ලේෂණයන් කරනු ලබන්නේ සාමාන්‍යයෙන් වර්ෂයකට එක් වරක් පමණක් වන අතර එම අවස්ථාවේදී පවතින පිරිවැය පදනම් කර ගෙන SPMC නිෂ්පාදනයන් හි මිල සංශෝධනයට ලක් කරනු ලබයි.

නමුත් පසුගිය වර්ෂය පුරාවටම රට තුල පැවැති අයහපත් ආර්ථික තත්ත්වය හමුවේ අමුද්‍රව්‍ය හා අනෙකුත් ඇසුරුම් ද්‍රව්‍ය වල මිල ගණන් නිරතුරුවම උච්චාවචනයන්ට ලක්විය.එසේ නිරතුරුව මිල ගණන් ඉහල යාම හේතුවෙන් යම් යම් ඖෂධයන්හි ඒකක මිල ඉහල ගියත් එම අවස්ථාවේ ගබඩාව සතු තොගයන් ශුන්‍ය වන තුරු (එනම් පෙර මිලට ඇසුරුම් කරන ලද) අපට මිල සංශෝධනයන් සිදුකිරීම ප්‍රායෝගිකව නොහැක. එවන් මිල උච්චාවචනයන් පවතින අවස්ථාවන්හි දී අපට ඖෂධ මිල සංශෝධනයක් කිරීම අත්‍යාවශ්‍ය වුවද පවත්නා නිමි තොග ශුන්‍ය වන තෙක් එසේ මිල ඉහල දැමීමට ප්‍රායෝගිකව හැකියාවක් නැත. කෙසේ නමුත් සෑම මිල සංශෝධනයක් සිදුකරන අවස්ථාවකදීම මෙම නිෂ්පාදනයන් සඳහා වන තරඟකාරී වෙළඳපල මිල ගණන් ද අප විසින් සලකා බලනු ලබයි.

**(v).** ඇතැම් නිෂ්පාදන වල මිල ගණන් සලකා බැලීමේ දී එම නිෂ්පාදනයන්හි පිරිවැය සලකා බලන විට ඉහල ලාභ ආන්තිකයක් පෙන්නුම් කල ද මෙම නිෂ්පාදනයන් සඳහා වන අනෙකුත් තරඟකාරී නිෂ්පාදනයන්ගේ වෙළඳපල මිල ඉහල අගයක් ගන්නා බැවින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් නියම කරන මිල ගණන් වලට ඖෂධ මිලදී ගැනීම පාරිභෝගිකයාට වාසි දායක වේ. තව ද SPMC නිෂ්පාදන සියල්ලෙහිම පිරිවැය ඇතැම් අවස්ථාවල ආවරණය නොවන හෙයින් මේ හරහා ආයතනයට වන අලාභය අවම කර ගැනීමටද හැකියාවක් ඇත.

**(ඇ)**

**(i).** වර්තමානය වන විට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව JICA ව්‍යාපෘතිය හරහා දෙවන වරටත් නිෂ්පාදනාගාර පහසුකම් පුලුල්කර ඇති අතර අප සේවකයන්ගේ උපරිම කැපවීම මත හා නව නිෂ්පාදනයන් වෙළෙඳපළට නිකුත් කිරීම හරහා මේ වන විට නිෂ්පාදනාගාරයේ ප්‍රශස්ත නිෂ්පාදන ධාරිතාවය කරා ලගා වී ඇත. මෙසේ නිෂ්පාදන ධාරිතාවය, යන්ත්‍රසූත්‍ර පහසුකම් ප්‍රමාණවත් නොවීම, නිසි වේලාවට අමුද්‍රව්‍ය ලබා ගැනීමට නොහැකි වීම හා පවත්නා තාක්ෂණික ගැටළු හේතුවෙන් නිෂ්පාදිත ඖෂධ ප්‍රමාණය වෙළඳපොල ඉල්ලුමට ප්‍රමාණවත් නොවේ. එබැවින් එයට පිළියමක් ලෙස SPMC දෙවන අදියර ලෙස SPMC නව නිෂ්පාදනාගාරයක් හොරණ මිල්ලෑව ප්‍රදේශයේදී ඉදි කිරීමට කටයුතු සකස්කරමින් පවතින අතර ඉන් එක් නිෂ්පාදනාගාරයක් සාමාන්‍ය පෙති හා කරල් නිෂ්පාදනය සඳහා නිර්මානය වන අතර ඊට අවශ්‍ය නවීන තාක්ෂණයෙන් යුතු යන්ත්‍රසූත්‍ර උපකරණ මිලදී ගැනීමටත් අවශ්‍ය පියවර සකස්කරමින් පවතී.

**(ii)** සැලකිල්ලට ගන්නා ලදී.

**(iii)** දක්වා ඇති ඉන්වොයිස් වලට අදාල චෙක්පත් තැන්පත් කිරීමට පෙර ඔවුනට වට්ටම් ලබාදෙනු ලැබේ. එමනිසා ඔවුන්ගේ චෙක්පත් අගරු වූ බව අප වෙත ලැබෙන්නේ එම වට්ටම් ලබා දීමෙන් පසුව වේ. ඉදිරියේදී මෙවැනි තත්වයන් අවම කිරීමට කටයුතු කරනු ලැබේ.

**(iv).** වෛද්‍ය සැපයුම් අංශයෙන් ලද ඇණවුම් හා වෙළඳපොළ තුල ඉල්ලුම අනුව මෙම අයිතමයන්හි සත්‍ය විකුණුම් ප්‍රමාණයන් ඒවායෙහි ඇස්තමේන්තුගත අගයන්ගෙන් විචල්‍ය වී ඇත.

තවද, Ferrus Fumarate 182.4mg සහ Ferrus Fumarate 90.2mg ඖෂධ සඳහා පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අවශ්‍යතාව මත වසර මැදදී වෛද්‍ය සැපයුම් අංශය මගින් ඇණවුමක් ලබා දීම නිසා මෙම අයිතම සැපයීම සිදුකර ඇත.

එමෙන්ම, අලෙවි සැලැස්මේ සඳහන් නොවන අනෙකුත් අයිතම 2022 වසර තුල අලුතින් හඳුන්වාදෙන ලද අයිතමයන් වේ.

2022 වර්ෂය තුල පැවති Covid – 19 වසංගත තත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් ඖෂධ ආනයන ගැටළු ඇති විය. එබැවින් දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා පෙර සැලසුම් පැවති මෙම ඖෂධයන්හි සැලසුම් හා අනුමැතීන් කාර්යක්ෂම කර සෞඛ්‍ය අමාත්‍යාංශයේ මැදිහත් වීම යටතේ රෝගීන්ට අවශ්‍ය ඖෂධ ලබා දීම සඳහා කටයුතු කරන ලදී.

මෙම ඖෂධයන්ගෙන් බොහෝමයක් ඖෂධ මහනුවර පල්ලෙකැලේ අලුතින් ආරම්භ කරන ලද නිෂ්පාදනාගාරයේ ඖෂධ වේ.

උදා : - ඩෙංගු රෝගීන් සඳහා ලබා දෙන Dextran 40, 10%, in Nacl for IV use 500ml

- ලේ වල සීනි අඩු කිරීම සඳහා දෙන Dextrose for IV use 25%, 25ml, Dextrose Injection 5%, 500ml, Dextrose for IV use 50%, 20ml-50ml
- ඉන්ජෙක්ෂන් දිය කිරීම සඳහා භාවිතා කරන Water for Injection 10ml vial

වැනි අත්‍යවශ්‍ය ඖෂධ මේ අතර ඇත. මෙම සියළු ඖෂධ SPMC Logo යටතේ වෛද්‍ය සැපයුම් අංශයට ලබා දී ඇති අතර ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙවැනි නික්ෂේපන ද්‍රාවණ නිෂ්පාදනය කල ප්‍රථම අවස්ථාව වේ. ගෝලීය වශයෙන් අර්බුදකාරී අවස්ථාවක මෙම නිෂ්පාදන සැපයීමට හැකි වීම SPMC ලද විශාල ජයග්‍රහණයකි.

එමෙන්ම, මේ වන විට මෙම ඖෂධ ආනයනය සම්පූර්ණයෙන්ම නතර කර ගැනීමට හැකි වී ඇති අතර එමගින් මෙරටට විදේශ විනිමය ඉතිරිකර ගැනීමටත්, ජනතාවට අවශ්‍ය ඖෂධ කලට වේලාවට ලබා දීමටත් හැකි වී ඇත.

තවද, මෙවැනි නිෂ්පාදනාගාර රට තුල ආරම්භ කිරීම මඟින් නව රැකියා අවස්ථා ඇති වීම, නව තාක්ෂණය ලැබීම, විශ්ව විද්‍යාල සිසුන්ට නව තාක්ෂණික පුහුණුව ලබා ගැනීමට අවස්ථාවක් ඇති වීම ( පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සිසුන් මේ වන විටත් මෙහි අධ්‍යන කටයුතු සිදු කරනු ලබයි) තුලින් රටේ සංවර්ධනය ඉහල යාමටද හේතු වනු ඇත.

තව දුරටත්, ඉදිරියේදී EUGMP තත්වය යටතේ ආරම්භ කර ඇති මෙම නිෂ්පාදනාගාරයෙහි නිෂ්පාදන අයිතම සඳහා මෙරට අවශ්‍යතාව සම්පූර්ණ කිරීමෙන් පසු ඉතිරිය ආනයනය කිරීමට බලාපොරොත්තු වන අතර එමඟින් මෙරට ආර්ථිකය ශක්තිමත් කිරීමටද හැකි වනු ඇත.

**(v).** අමුද්‍රව්‍ය මිල ඉහල යෑම හේතුවෙන් මිල ගණන් ඉහල දැමීමට සිදු වී ඇත. තවද 2022 වර්ෂය ආරම්භයේදී රු.203.00 ට පැවති ඩොලරයක අගය සීඝ්‍ර ලෙස වැඩි වෙමින් රු.380.00 පමණ දක්වා වැඩි විය. ඒ අනුව, අමු ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අප හට වැඩි මිලක් ගෙවීමට සිදු විය. මෙසේ ඩොලරය වැඩිවීම හේතුකොට NMRA මගින් අවස්ථා කිහිපයක දී මෙම නිෂ්පාදනයන්ගේ උපරිම සිල්ලර මිල ඉහළ දැමීම සිදුකරන ලදී. ඊට සමගාමීව සෞඛ්‍ය ලේකම් තුමාගේ සහභාගිත්වයෙන් යුතුව පැවති මිල කමිටුවේ දී අනුමැතිය ලබාදුන් මිල ගණන් වලට අනුව අපගේ නිෂ්පාදන අළෙවි කරන ලදී.

**(vi).** ඔෟෂධ නිෂ්පාදන සංස්ථාව විසින් බෙදාහරින්නන් සඳහා ලබාදී ඇති අවම මාසික විකුණුම් ඉලක්කය රුපියල් මිලියන දෙකක් වන නමුත්, රාජ්‍ය ඔෟෂධ නිෂ්පාදන සංස්ථාවේ සීමාකාරී නිෂ්පාදන පහසුකම් හේතුවෙන් නිෂ්පාදනයේදී MSD ඇණවුම් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන බැවින් විවෘත වෙළඳපළ ඉල්ලුම සපුරාලීම සඳහා අලෙවි අංශයට ලැබෙනුයේ ඉතා සීමිත තොග ප්‍රමාණයක් පමණි. එබැවින් බොහෝ බෙදාහරින්නන් සඳහා ඔවුනට ලබා දී ඇති අලෙවි ඉලක්කය ලඟාකර ගැනීම ප්‍රායෝගිකව අපහසු වේ. එබැවින් බොහෝ අවස්ථා වල තම අලෙවි ඉලක්කය කරා ළඟා වූයේ ප්‍රධාන අලෙවි නියෝජිතයන් පිරිස පමණක් වන අතර ඔවුන්ටද මේ වන විට තම ඉලක්කය ලඟාකර ගැනීම ඉතා අපහසු වී ඇත.

**(vii)** මෙහි සඳහන් කර ඇති අංක 07652 හා 08366 දරණ ඉන්වොයිස් දෙකෙහි පරීක්ෂා කර අත්සන යොදා නොමැති අතර මෙයට හේතුව විය හැක්කේ අලෙවි අංශයේ සීමිත සේවක සංඛ්‍යාවක් සිටින නිසා මෙදින ඉන්වොයිස් පත් පරීක්ෂා කිරීමට අයෙකු නොසිටීම විය හැකිය. මෙම ගැටළුව පිළබඳව සංස්ථාවේ විගණන අංශයද දැනුවත් කර ඇත.මෙහි සඳහන් අනෙක් ඉන්වොයිස් අංක 08016 හා 08017 යන දෙකම අපගේ අත්වැරදීමකින් අනුමත කිරීමට නොහැකි වී ඇති අතර මින් ඉදිරියට එවැනි අතපසුවීමක් නොවීමට උපරිම වශයෙන් කටයුතු කරන බව දන්වා සිටිමි.
ඉදිරියේදී, අලවි අංශය වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමෙන් අනතුරුව සේවක පුරප්පාඩු මගහරවා ගැනීමෙන් පසු මෙම ගැටලු නිරාකරණය කර ගත හැකි වනු ඇත.

(ඈ)

**(i).** මෙම අයෝජකයින් 15 දෙනාගෙන් වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ සැපයීමට අවශ්‍ය නිෂ්පාදනාගාර පහසුකම් සහ සුදුසුකම් මේ වන විට සපුරා තිබුණේ පහත සඳහන් ආයෝජකයින් පමණි.

1. Diyatha Pharmaceuticals & Healthcare (Pvt) Ltd.
2. Glosante (Pvt) Ltd.
3. Celogen Lanka (Pvt) Ltd.
4. Mediccom (Pvt) Ltd.
5. Sands Active (Pvt) Ltd. (2023 අප්‍රේල් මස සිට)
6. Yaden Laboratories (Pvt) Ltd. (2022 දෙසැම්බර් මස සිට)

**(ii)**

**(a)** අදාල අයිතමයන් 2 සම්බන්ධයෙන් සැලකිමේදී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මගින් වෛද්‍ය සැපයීම් අංශය වෙත අලෙවි කිරිමේදී සලකා බලා ඇත්තේ 2020.10.01 වන දින පැවති මිල කමිටු අනුමැතිය අනුව වේ. නමුත් අදාල බද්ධ ව්‍යාපාරය ඔවුන්ගේ එම අයිතමයන් ඉන්වොයිස් කර ඇත්තේ 2020.02.06 දින සහ 10 දින පැවති මිල කමිටු මිල ගණන් පදනම් කරගෙන වේ. එහිදි 2020.10.01 දින අනුමත වු මිල ගණන් වලට වඩා අඩු මිලක් 2020.02.06 සහ 10 දින අනුමත වී ඇත. මේ තත්වය නිසා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව නව මිල ගණන් යටතේ ඉන්වොයිසි ඉදිරිපත් කිරිමෙන් අදාල බද්ධ ව්‍යාපාරය පැරණි මිල ගණන් වලට ඉන්වොයිස් කිරිමත් නිසා මෙවැනි තත්වයක් පවතී.

මෙහිදී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව කැබිනට් අනුමැතිය සහිතව තීරණය කරනු ලබන මිල තීරණය එලෙසම ක්‍රියාත්මක කිරිමට බැදී සිටියි.එසේම පෞද්ගලික ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වන බද්ධ ව්‍යාපාර වලට ඉහල අදායමක් හෝ ලාභයක් මෙහිදි නොලැබෙන සේම රජයට වැඩි වාසියක් අත්වන බවද කිව හැකියි.

**(b)** අදාල ඖෂධ අයිතම 17 සම්බන්ධයෙන් සලකා බැලීමේදී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මගින් වෛද්‍ය සැපයීම් අංශයට අලෙවි කිරීමේදි පාදක කරගෙන ඇත්තේ 2021.10.05 වන දින පැවති මිල කමිටු තීරණය මතයි. නමුත් අදාල බද්ධ ව්‍යාපාරය මගින් ඔවුන්ගේ ඉන්වොයිසියන් සකසා ඇත්තේ 2021.04.05 වන දින පැවති මිල කමිටු තීරණය අනුව පැවති මිල ගණන් වලටය. මන්ද යත් ඔවුන් අදාල අයිතමයන් සහිත ඉන්වොයිසියන් සකස් කර ඇත්තේ 2021.10.05 මිල කමිටු පැවැත්වීමට පෙරය.ඒ අනුව ඔවුන් 2021.04.05 දින මිල කමිටුවට ඉදිරිපත් කල පිරිවැය පත්‍රිකා අනුව මිල ගණන් ඉන්වොයිස් වලට යොදා ඇත.මෙම තත්වය මත රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට ඉහල ලාභයක් ලැබී ඇත.

මෙහිදී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව කැබිනට් අනුමැතිය සහිතව තීරණය කරනු ලබන මිල තීරණය එලෙසම ක්‍රියාත්මක කිරීමට බැදී සිටියි.එසේම පෞද්ගලික ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වන බද්ධ ව්‍යාපාර වලට ඉහල අදායමක් හෝ ලාභයක් මෙහිදි නොලැබෙන සේම රජයට වැඩි වාසියක් අත්වන බවද කිව හැකියි.

**(iii).** Mediccom (Pvt) Ltd. ආයතනය විසින් කොටස් හිමිකම් සහතික නිකුත් කිරීමට අවශ්‍ය ලිපිලේඛන සකස් කරමින් පවතී.

**(iv).** SPMC සමග ගිවිසුම් ගතව කොටස් නිකුත් කර ඇති ආයතනයන් සඳහා අප ආයතනය මඟින් අධ්‍යක්ෂකවරුන් නම් කර ඇත. මෙහිදී Sands Active (Pvt) Ltd. සහ Yaden Laboratories (Pvt) Ltd. යන ආයතනයන් දෙකෙන් මේ වන විට SPMC සන්නාමය යටතේ වෛද්‍ය සැපයීම් අංශය වෙත ඖෂධයන් ලබා දෙනු ලබයි.

තවද Premium International (Pvt) Ltd. ආයතන මඟින් අප වෙත කොටස් නිකුත් කර ඇති හෙයින් අප ආයතනය මඟින් අධ්‍යක්ෂකවරයෙකු පත් කර ඇති අතර, එම ආයතනයෙහි නිෂ්පාදනාගාර ඉදිකිරීමේ කටයුතු දැනටමත් සිදු කරමින් පවතී. පසුගිය කාලයේ රට තුල පැවති වාතාවරණයත් සමඟ ඉදිකිරීමේ කටයුතු සඳහා ද බාධාකාරී තත්ත්වයක් ඇති විය. නිෂ්පාදනාගාර ඉදිකර අවසන් වූ වහාම එහි නිෂ්පාදන මිලදී ගැනීමට කටයුතු කිරීමට බලාපොරොත්තුවේ.

**(v).** Sands Active (Pvt) Ltd. සහ Yaden Laboratories (Pvt) Ltd. යන ආයතනයන් දෙකෙහි නිෂ්පාදනාගාර ඉදිකිරීම් වැඩ සහ NMRA සහතික ලබා ගැනීම් ආදි වැඩ කටයුතු මේ වන නිම කර ඇති අතර එම ආයතනයන් දෙකෙන්ම 2023 වර්ෂයේ මුල සිට ඖෂධ මිලදී ගැනීම් සිදු කරනු ලබයි.

තවද Premium International (Pvt) Ltd. සහ Synergy Pharmaceuticals Corporation (Pvt) Ltd. යන ආයතන ඔවුන්ගේ නිෂ්පාදනාගාර ඉදිකිරීමේ කටයුතු දැනට සිදු කරමින් පවතී. පසුගිය කාලයේ රට තුල පැවති වාතාවරණයත් සමඟ ඉදිකිරීමේ කටයුතු සඳහා ද බාධාකාරී තත්ත්වයක් ඇති විය. නිෂ්පාදනාගාර ඉදිකර අවසන් වූ වහාම එහි නිෂ්පාදන මිලදී ගැනීමට කටයුතු කිරීමට බලාපොරොත්තුවේ.

**(ඉ)** අදාළ තනතුරු වන ව්‍යාපෘති සම්බන්ධීකාරක (Project Co-Ordinator) කැබිනට් මණ්ඩලය විසින් ද ව්‍යාපෘති කළමනාකරණ කමිටුව (Project Management Committee) සඳහා අනුමත කර ඇත. මෙවැනි ව්‍යාපෘති සිදු කිරීමේදී නීති උපදෙස් අත්‍යාවශ්‍ය වේ. එබැවින් එවකට SPMC සතුව ස්ථිර නීතිඥ තනතුරක් නොතිබූ බැවින් කොන්ත්‍රාත් පදනම මත අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියද ඇතිව SPMC සඳහා කොන්ත්‍රාත් පදනම මත දැනටමත් සේවය කරන නීති උපදේශක (Legal Advisor) හොරණ මිල්ලැව Lotus Pharma ව්‍යාපෘතිය සඳහා ද තෝරාගන්නා ලදී. නීති උපදේශක (Legal Advisor) තනතුරේ සේවය අප ලබාගෙන ඇත්තේ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නීති උපදේශන කාර්යයන් සහ හොරණ මිල්ලැව Lotus Pharma ව්‍යාපෘතියේ නීති උපදේශන කාර්යයන් යන දෙකම සඳහාය.

ව්‍යාපෘති ලේකම් (Project Secretary) තනතුරද මෙවන් ව්‍යාපෘතියකදී අනිවාර්යෙන් අත්‍යාවශ්‍ය වේ. එබැවින් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියට යටත්ව මෙම ව්‍යාපෘතිය ආරම්භකොට ඉදිරියට ගෙනයාම සඳහා ව්‍යාපෘති ලේකම් (Project Secretary) තනතුරද කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී. ඒ අනුව මෙම තනතුරු 3 ම [ව්‍යාපෘති සම්බන්ධීකාරක (Project Co-Ordinator), නීති උපදේශක (legal Advisor) සහ ව්‍යාපෘති ලේකම් (Project Secretary)] සඳහා ජාතික අවශ්‍යතාවයක් වන මෙම ඖෂධ නිෂ්පාදන ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියන් ලබාගැනීමට දැනටමත් පියවර ගෙන ඇත.මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රමුවතාවය ලබා දී ඉතා කඩිනමින් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

අදාල තනතුරු සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා කළමනාකරණ සේවා දේපාර්තමෙන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් තුමිය සමග මෑතක දී සාකච්ඡාවක් පවත්වන ලද අතර එහිදී දන්වා සිටියේ නැවත අනුමැතිය සඳහා ලිපියක් ඉදිරිපත් කරන ලෙසය. ඒ අනුව අදාල අනුමැතිය ඉල්ලා ලිපියක් යවා ඇත.

(ඊ) දෙමහල් ගබඩා ගොඩනැගිල්ල , මූලික ගිවිසුම් ප්‍රකාරව 2019 අගෝස්තු මස 21 දින වනවිට ඉදිකිරීම නිමකිරීමට නොහැකිවීමට පහත සඳහන් කරුනු හේතු විය.

a) 2018 සහ 2019 වසර වල අප සංස්ථාවේ නිෂ්පාදන වල ප්‍රධානතම ගැණුම්කරුවන රජයේ වෛද්‍ය සැපයුම් අංශය (Medical Supplies Division) වෙතින් අයවීමට තිබූ හිඟමුදල් (2018 outstanding balance - Rs. million 445.80 and 2019 outstanding balance -Rs. million 1,482.40) මුදල් අමාත්‍යාංශය විසින් ලබා දීමට ප්‍රමාද වීම හේතුවෙන් අප ආයතනය මූල්‍යමය අපහසුතාවයකට ලක්වී තිබුනි. පහත සඳහන් ගෙවීම් සිදුකිරීමට ප්‍රමාද වීමත් මෙම ව්‍යාපෘතිය ප්‍රමාදයට එක් හේතුවකි.

- කොන්ත්‍රාත් සමාගම වන KSJ Construction Pvt Ltd වෙත ප්‍රථම ගෙවීම වන කොන්ත්‍රාත් වටිනාකමින් 20% ක අත්තිකාරම් මුදල ගෙවීමට ගිණුම් අංශය වෙත 2018-05-18 දින ඉදිරිපත් කරන ලද නමුත් ඉහත හේතුව නිසා එම ගෙවීම සිදුකර අවසන් කර තිබුනේ මාස 7කට පසුව එනම් 2018-12-07 දින වේ.

- පලමු බිල් පත (Interim Payment No 1) 2019 ජනවාරි මස ඉදිරිපත් කරන ලද නමුත් ගෙවීම මාස 6කින් පමණ ප්‍රමාද කර තිබුනි.

(උ)

(i) අදාල ප්‍රධාන තනතුරු ඇතුලු අනිකුත් සියලු තනතුරු දිගින් දිගටම බඳවා ගැනීම වෙනුවෙන් කටයුතු කරමින් සිටී.

(ii) මෙම තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් මෙම බඳවා ගැනීමේ පරිපාටින් අනුමැතියට පෙර පරික්ෂා කිරීමේ කටයුතු සිදු කරන බැවින් එම පෙර පරික්ෂා කිරීමෙන් අනතුරුව අප වෙත අදාළ තනතුරුවල කෙටුම්පත් ලැබුණු පසු අවශ්‍ය සංශෝධනයන් සිදු කර රේඛීය අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට නියමිතය.

(ඌ) මෙම ඌනතා මඟහැර 2023 වර්ෂයේ නිසි පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(එ) සංස්ථාව සතු සියලූ වත්කම් කාණ්ඩයන් හඳුනා ගැනිමේ නිර්ණායකයන් නිර්දේශ කොට දේපල, පිරියත හා උපකරණ සඳහා වන ප්‍රතිපත්තියක් 2023 වර්ෂයේදී හඳුන්වාදීමට කටයුතු කරනු ලැබේ.

(ඒ) අප ආයතනය විසින් බද්ධ ව්‍යාපාර වෙනුවෙන් ගෙවීම් කිරිමේ ප්‍රතිපත්තිය වන්නේ අදාල සැපයිම් සපයා දින 50 කට පසුව වුවත් අප ආයතනයට භාණ්ඩාගාරයෙන් මුදල් ලැබෙන ආකාරය පදනම්ව බද්ධ ව්‍යාපාර වලට ද ගෙවීම් කරනු ලැබේ. එනම් අප ආයතනය වෙත භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම මත බද්ධ ව්‍යාපාර වලට ගෙවීමට හැකියාවක් නොමැත. එම නිසා ඔවුන්ගේ මුදල් ගෙවීම් කාලය දින 50 ක් ඉක්මවිය හැකිය.

(ඔ) මේ සම්බන්ධයෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව දිගින් දිගටම දැනුවත් කරමින් අදාළ ශේෂය අයකර ගැනීමට කටයුතු කරමින් සිටින අතර එය ඉතා ඉක්මනින් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඕ) විගණන විමසුමේ දක්වා ඇති ණයහිමියන් හතර දෙනෙකුගේ 2022.12.31 දිනට ශේෂයන් හා සනාථ කිරිමේ ලිපි අතර වෙනසක් නොමැති වේ. එයට හේතුව වන්නේ Jayasinghe Industries සහ Macklarans Logistics Ltd. හි සනාථ ශේෂයන් නිවැරදි ලෙස දක්වා නොමැති අතර නැවත නිවැරදි ශේෂයන් එවා ඇත. එසේම Dinlanka Logistic සහ Sri Lanka Insurance Corporation විසින් ගෙවීමට ඇති ලෙස සඳහන් ඉන්වොයිස් පත් මේ වන තෙක් සංස්ථාව වෙත ලැබී නොමැත.

# ප්‍රස්ථාරාත්මක සමාලෝචනය



# ප්‍රස්ථාරාත්මක සමාලෝචනය










නිෂ්පාදනය
4,000
3,000
2,000
1,000
-
මිලියන
2,003
1,909
2,026
2,144
1,523
1,897
2,400
3,015
3,043
3,302
2013
2014
2015
2016
2017
2018
2019
2020
2021
2022
වර්ෂය


නිෂ්පාදනයේ ප්‍රධාන දායකත්වයන් (මිලියන) -2022
523.05
309.40
297.00
201.80
191.01
174.00
144.45
117.60
106.40
102.63
පැරසිටමෝල් පෙති බී.පී. මි.ග්‍රෑ 500
ලොසාටන් පොටෑසියම් පෙති මි.ග්‍රෑ 50
ග්ලික්ලසයිඩ් පෙති බී.පී. මි.ග්‍රෑ 80
ඔමෙප්‍රසෝල් කරල් ඇයි.පී. මි.ග්‍රෑ 20
ඇටෝවාස්ටැටින් පෙති ඇයි.පී. මි.ග්‍රෑ 10
ග්ලික්ලසයිඩ් පෙති බී.පී. මි.ග්‍රෑ 40
ඇස්කෝබික් අම්ලය පෙති බී.පී. මි.ග්‍රෑ 100
සැල්බියුටමෝල් පෙති බී.පී. මි.ග්‍රෑ 2
ප්‍රෙඩ්නිසොලෝන් පෙති බී.පී. මි.ග්‍රෑ 5
ෆැමොටිඩීන් පෙති බී.පී. මි.ග්‍රෑ 20


මානව සම්පත
211
226
229
248
274
276
276
291
329
336
2013
2014
2015
2016
2017
2018
2019
2020
2021
2022
වර්ෂය

# පසුගිය වර්ෂ 10 තුළ වැදගත් මූල්‍ය විස්තර

(Rs.000)

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැටුම | 1,941,182 | 1,712,105 | 2,054,363 | 2,434,508 | 3,174,612 | 4,621,537 | 5,646,878 | 7,647,780 | 8,538,944 | 16,620,184 |
| අලෙවි පිරිවැය | 1,513,899 | 1,319,715 | 1,539,441 | 1,888,256 | 2,666,683 | 3,990,801 | 4,743,125 | 6,280,757 | 7,102,322 | 14,559,044 |
| දළ ලාභය | 427,283 | 392,391 | 514,921 | 546,252 | 507,928 | 630,736 | 903,752 | 1,367,023 | 1,436,621 | 2,061,140 |
| මෙහෙයුම් ලාභය | 304,176 | 224,758 | 364,845 | 353,776 | 244,987 | 308,741 | 564,411 | 1,067,020 | 1,078,814 | 1,253,361 |
| පරිපාලන වියදම | 106,096 | 133,933 | 125,469 | 165,788 | 204,579 | 242,218 | 237,694 | 247,137 | 244,271 | 332,120 |
| පොලී ආදායම | 28,059 | 44,196 | 53,586 | 87,629 | 77,401 | 51,659 | 28,093 | 94,487 | 156,792 | 351,759 |
| බදු පෙර ශුද්ධ ලාභය | 329,968 | 266,481 | 414,501 | 441,164 | 321,982 | 359,680 | 592,057 | 1,160,997 | 1,235,327 | 1,586,213 |
| බදු පසු ශුද්ධ ලාභය | 209,154 | 183,848 | 262,323 | 296,646 | 223,907 | 251,262 | 434,777 | 1,017,364 | 1,006,185 | 965,472 |
| ස්ථාවර වත්කම් | 762,641 | 780,718 | 762,560 | 798,657 | 802,775 | 3,133,903 | 3,203,159 | 3,117,911 | 2,974,013 | 3,656,401 |
| කෙටි කාලීන ආයෝජන | 429,896 | 913,443 | 1,027,388 | 1,175,754 | 926,461 | 369,761 | 474,984 | 3,040,316 | 3,452,508 | 4,398,099 |
| මුලු වත්කම් | 2,294,113 | 2,386,449 | 2,700,885 | 2,902,284 | 3.073,637 | 6,229,453 | 7,185,386 | 7,829,711 | 8,680,301 | 14,013,711 |
| සේවක සංඛ්‍යාව | 211 | 226 | 229 | 248 | 274 | 276 | 276 | 291 | 329 | 336 |

මුළු වත්කම් = මුළු ජංගම නොවන වත්කම්වල ශුද්ධ ගිණුම්ගත වටිනාකම + මුළු ජංගම වත්කම්

# ආයතනික තොරතුරු

### ආයතනයේ නාමය
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

### නෛතික තත්ත්වය
1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1987 වසරේ දී පිහිටුවන ලදී.

### සංස්ථාපනය කළ දිනය
1987 ජූනි මස 04

### ලියාපදිංචි කාර්යාලය
අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, කඳවල වත්ත, රත්මලාන, ශ්‍රී ලංකාව

### අධ්‍යක්ෂ මණ්ඩලය

| | | |
|---|---|---|
| වෛද්‍ය පී.පී.ජී.පී.යූ. ඉන්ද්‍රවංශ | - | සභාපති |
| වෛද්‍ය එන්.එන්.ඒ.පී. බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන | - | අධ්‍යක්ෂ |
| එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක | - | අධ්‍යක්ෂ (2022 මාර්තු දක්වා) |
| වී.ජී. චමින්ද වික්‍රමරත්න | - | අධ්‍යක්ෂ |
| යූ.එස්.කේ. දෙනාවත්ත | - | අධ්‍යක්ෂ |
| ඒ.ආර්.වික්‍රමසිංහ | - | අධ්‍යක්ෂ (2022 අප්‍රේල් සිට) |

### විගණකවරු
විගණකාධිපති, අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල

### බැංකු
ලංකා බැංකුව / මහජන බැංකුව/ ජාතික ඉතිරි කිරීමේ බැංකුව

### කළමනාකරණ කමිටුව

| | | |
|---|---|---|
| එස්.ඩබ්. ජයසුන්දර | - | සාමාන්‍යාධිකාරිණී |
| ඒ.ජී.ඩී.එස්. අතුරලිය | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (මූල්‍ය) |
| එස්.පී. ජයවීර | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිෂ්පාදන) |
| පී.ඩී. ජයසුන්දර | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) |
| ආර්. ධර්මදාස | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් සහ ප්‍රසම්පාදන) |
| ආර්.එම්.ජේ.සී.කේ. මඩවල | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) |
| ආර්.එම්.ආර්.එම්. රණසිංහ | - | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වට්ටෝරු, පර්යේෂණ සහ සංවර්ධන) |
| එච්.කේ.පී.ඒ. සේනාධීර | - | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තත්ත්ව පාලන) |
| ඩී.එච්.ජේ. ගුණවර්ධන | - | කළමනාකාර (ඉංජිනේරු) |
| ජේ.එම්.එස්. ජයසුන්දර | - | කළමනාකාර (මූල්‍ය) |
| ඒ.සී.පී. ආනන්දකුමාර | - | කළමනාකාරිණී (සැලසුම් සහ ප්‍රසම්පාදන) |
| ඒ.එම්.ටී.පී. කුලසේකර | - | කළමනාකාරිණී (අලෙවි ප්‍රවර්ධන) |
| වී.ජේ. බණ්ඩාරවත්ත | - | අභ්‍යන්තර විගණක |
| ඒ.එන්. හේවාගම | - | කළමනාකාර (නිෂ්පාදන) |
| පී. දන්තනාරායන | - | කළමනාකාරිණී (නිෂ්පාදන) |
| බී.වී.එච්.පී.එස්. කුමාර | - | කළමනාකාර (ඉංජිනේරු) |
| එස්. වික්‍රමසිංහ | - | කළමනාකාර (නිෂ්පාදන) |
| වයි.එම්.පී. කුමාර | - | කළමනාකාර (සැලසුම් සහ ප්‍රසම්පාදන) |
| සි.ඩී. මගිනආරච්චි | - | කළමනාකාරිණී (මානව සම්පත්) |
| ඒ.පී.එම්. වික්‍රමනායක | - | කළමනාකාර (නිෂ්පාදන) |
| එම්. බෙනරගම | - | කළමනාකාර (ඉංජිනේරු) |